ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

லலித் அத்துலத்முதலி மஹபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்

Lalith Athulathmudali Mahapola Higher Education Scholarship Trust Fund

2019

වාර්ෂික වාර්තාව හා ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන
ශිෂ්‍යත්ව භාර අරමුදල

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2019

වෙළඳ අමාත්‍යාංශය

පටුන

පිටුව

අප ගැන

දැක්ම, ඉලක්ක හා මෙහෙවර
මූලික වටිනාකම් 1
ඉතිහාසය දෙස හැරී බැලීමක් 2
අපගේ ගමන් මඟ/ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථාන 3
භාරකාර මණ්ඩලය - (1981 – 2018) 4 - 5
අධ්‍යක්ෂවරයාගේ වාර්තාව 6 - 8

කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

කාර්ය සාධන වාර්තාව 9 - 20
ආයතනික යහපාලනය 21 - 26
මහපොළ අරමුදලෙහි අනෙකුත් ආයෝජන 27 - 34
ක්‍රියාකිරී සැලැස්ම 2020 35 - 44

මූල්‍ය ප්‍රකාශන 45 - 69
විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව 70 - 82
විගණන පිළිතුරු 83 - 107

දැක්ම (Vision)

දිළිඳුකම තුරන් කිරීම ඉලක්ක කරගත් වියත් සමාජයක් බිහිකිරීම.

ඉලක්ක (Mission)

වරප්‍රසාද නොලත් යෞවනයනට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මඟින් සම අවස්ථා ඇති කිරීම.

මෙහෙවර (Objectives)

- යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම.
- ද්විතියන අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර සිටින ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට උසස් අධ්‍යාපන ආයතනයකදී සිය අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික
  අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා උපකාර වන ආධාර සැපයීම.
- තරුණයින්ගේ හැකියා දියුණු කිරීම සඳහා වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා ඒවායෙහි කළමනාකරණයට සහායවීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පාසල් සහ ආයතන ආදිය පිහිටුවීම හා ඒවාට ආධාර සැලසීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පුද්ගලයින්ගේ නිපුණතා නංවාලීම සහ වර්ධනය කිරීම සඳහා ආධාර සැපයීම. (දැනට ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබාදීම මූලික හා ප්‍රමුඛ කාර්යය ලෙස සලකා ක්‍රියා කර ඇත.)

මූලික වටිනාකම්

සුපිලිපන්බව (Integrity)

අප විසින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාව සඳහා තෝරා ගන්නා ලද සිසුන් නියමිත ක්‍රමවේදයක් යටතේ ඉතා විනිවිද භාවයකින් යුක්තව සාධාරණව සිදු කරන අතර සුදුසුකම් ලබන සිසුන්ගේ ගෙවීම් ඉතා සාධාරණ කාලයක් තුළ ඔවුන්ට ලබාදීමට නිතරම උත්සුක වේ.

නම්‍යතාවය (Flexibility)

අරමුදලේ සේවයකයින් හා අධ්‍යක්ෂ අතුලු භාරකාර මණ්ඩලය අරමුදල ශක්තිමත් කිරීම සඳහා නව අදහස් සොයා යමින් තරඟකාරී මූල්‍ය වෙළඳපළ තුල ඉතා සාර්ථකව කටයුතු කරයි.

සුභවාදී ආකල්ප (Positive Attitudes)

ශිෂ්‍යාව ලබාදීමේදී හා අනෙකුත් ආයතන සමඟ හා විශ්ව විද්‍යාල සමඟ කටයුතු කිරීමේදී හා අරමුදල් සපයා ගැනීමේදී ඉතා විශාල අභියෝග රාශියකට මුහුණදීමට සිදුවන අතර එම සියලුම අභියෝග ඉතා සුභවාදීව ජය ගැනීමට මනා එළඹුමක් සේවකයන් තුළ පවතී.

කණ්ඩායම් හැඟීම (Team Spirit)

මහපොළ ශිෂ්‍යාව අරමුදලේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි දක්වන ලෙන්ගතු බව සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරා ගැනීමෙහිලා එක්ව කටයුතු කරති.

ප්‍රතිඵලදායක බව (Effectiveness)

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාව භාර අරමුදලේ සේවකයින් තුළ මනා අවබෝධයක් හා විශ්වාසනීයත්වයක් පවතින අතර ඔවුන් දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීමට නිතරම උක්සුක වේ. ඉතා කුඩා සේවක සංඛ්‍යාවක් (සේවකයන් 10 ක්) තුළින් මාසිකව ශිෂ්‍යාව 70,000 ක් පමණ ගෙවීම් සිදු කරනු ලබයි.

විශිෂ්ඨත්වය කෙරෙහි නැඹුරුව (Tendency towards uniqueness)

මහපොළ ශිෂ්‍යාව අරමුදලේ සේවකයින් අඛණ්ඩව සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ඉතිහාසය දෙස හැරී බැලීමක්

දිවංගත ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා විසින් 1980 වසරේ දී ගරු වෙළඳ හා නාවික ඇමතිවරයා ලෙස ‘‘මහපොළ’’ සංකල්පය යටතේ පළමුවෙන්ම වෙළඳ සල්පිලක් මගින් ග්‍රාමීය ප්‍රජාව වෙත විවෘර්ත ආර්ථිකයේ ප්‍රතිලාභ හා දැනුම අත්පත් කරදීමේ අභිප්‍රාය ඇතිව එවකට පැවති වෙළඳ හා නාවික කටයුතු අමාත්‍යාංශය ‘‘මහපොළ’’ සංවර්ධනය කරන ලදි. පාසැල් තුල පැවැත් වූ වෙළඳ සල්පිල් හා අධ්‍යාපනික ප්‍රදර්ශන වලදී දොරටු ප්‍රවේශ පත්‍ර හා අලෙවි කුටි අලෙවිය සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ලොතරැයිය මගින් ලද ආදායම සහ පරිත්‍යාග එම පාසැල් වල යටිතල පහසුකම් නැංවීම පිණිස සහ මහපොළ ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා ආරම්භයේදි යොදා ගන්නා ලදි. වාණිජ ආර්ථිකයේ මුලිකම වෙනස නාගරික ජනතාවට තරම් ඉක්මනින් ගම්බඳ ජනතාවට ලැබුනේ නැත. නව වෙළඳ ක්‍රමය තුලින් නාගරික ජනතාව විදි බොහෝ වරප්‍රසාද ගම්බඳ ජනතාවට නොලැබුණි. මෙම ගම්බඳ ,නගරබඳ පරතරය නැති කොට ගම්බඳ ජනතාවට දැනුම හා අත්දැකීම් ලබාදීමේ අරමුණින් එවකට සිටි ගරු වෙළඳ හා නාවික ඇමති ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා විසින් තබන ලද එක් පියවරකි ‘‘මහපොළ‘‘ අද පොදු ජනතාවගේ දායාදයකි. උසස් අධ්‍යාපනයක් ලැබීමේ සහජ හැකියාව ඇති, නමුත් ආර්ථික ප්‍රශ්න වලට මුහුනපා සිටින ජාතියේ උතුම්ම දායාදය වන අනාගත පරපුරට අතදිමකි.

1981 නොවැම්බර් 14 දින ප්‍රථම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය ශිෂ්‍යත්ව 422 පිරිනමමින් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේදි පැවැත්විනි. ආරම්භයේ සිට 2019 වන විට ශිෂ්‍යත්ව 300,000 කට අධික ප්‍රමාණයක් පිරිනමා ඇති අතර ඒ සඳහා රු.බි 15 පමණ වැය කොට ඇත. අද වන විට මෙම කර්තව්‍ය සඳහා රුපියල් මිලියන 1700 ක මුදලක් වාර්ෂිකව ශිෂ්‍යත්ව වරික මුදල් ගෙවීම සඳහා අවශ්‍ය වේ.

විශ්ව විද්‍යාලවලට ඇතුලත්වීමට නොහැකි වූ සිසුන්ට තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සඳහා, 1999 වර්ෂයේදි කඩුවෙළ මාලඹේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) තොරතුරු තාක්ෂණ අධ්‍යයන කටයුතු සඳහා ආරම්භ කරන ලදි. ඒ සඳහා මහපොළ අරමුදලින් රුපියල් මිලියන 373ක මුදල්ද, අක්කර 25ක ඉඩමද ලබාදී ඇත. එම ආයතනය තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. දැනට වාර්ෂිකව සිසුන් 10,000ක් පමණ බඳවා ගනු ලැබේ.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ මුදල් අයෝජන කටයුතු සම්බන්ධයෙන් නැෂනල් වෙල්ත් කොපරේෂන් සමාගම හා එහි උප සමාගමක් ලෙස නැෂනල් වෙල්ත් සිකියුරිටි සමාගම 2003 වර්ෂයේදි ආරම්භ කරන ලදි. ආරම්භයේදි ලබාදුන් රු.බි 3.16ක මුදල 2019 වර්ෂයේදි අරමුදල රු.බි 8.6ක් දක්වා වර්ධනය කර නැවත මහපොළ අරමුදල වෙත මාරු කරන ලදී.

මහපොළ ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථාන

- 1985 වර්ෂයේදී විදේශීය විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඒ සඳහා රු.මි 53.8 වැය කර ඇත.

- 1986 වර්ෂයේදී අධ්‍යාපන උපදේශක සේවයට හා ජාතික ඉංග්‍රිසි අධ්‍යාපනය සඳහා ආධාර කිරීම. ඒ සඳහා රු .මි 1 වැය කර ඇත.

- 2003 වර්ෂයේදී මහපෙළ ව්‍යාපෘති අංශය ආරම්භ කිරීම. මහපෙළ සිසු රක්ෂණය හා දහම් පාසැල් ගුරු රක්ෂණය රු.මි 15.4 වැය කර ආරම්භ කිරීම.

- 2004 වර්ෂයේදී මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ පිහිටුවා තිබූ පාසැල් සංවර්ධන අරමුදලෙහි පොලි ආදායම් මගින් පාසැල් 11ක සංවර්ධන කටයුතු සඳහා (පාසැල් ගොඩනැගිලි, පිහිනුම් තටාක, ක්‍රීඩා පිට්ටනි, ශ්‍රවනාගාර ඉදි කිරීමට) රු මි 202 වැය කර ආධාර කිරීමට හැකි වූ අතර හෝමාගම පිටිපන මහින්ද රාජපක්ෂ ජාතික පාසැල පිහිටුවීම සඳහා රු.මි.30ක මූලික ආරම්භක වියදමද දරන ලදි.

- 2005 වර්ෂයේදී සුනාමියෙන් මියගිය මහපොළ ශිෂ්‍යත්වලාභීන්ගේ පවුල්වලට රු මි 1.5 ආධාර මුදල් බෙදාදීම.

- 2015 වර්ෂයේදී මහපොළ ශිෂ්‍යත්ව වාරිකය රු.2,500/= සිට රු.5,000/= දක්වා වැඩි කිරීම.

- 2018 වර්ෂයේදී මහපෙළ ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබන ආදායම් සීමාව රුපියල් ලක්ෂ 300,000/= සිට රුපියල් ලක්ෂ 500,000/= දක්වා වැඩි කිරීම. ඒ තුලින් සිසුන් 3000 කට පමණ ශිෂ්‍යත්ව වැඩි කර ඇත.

- 2019 සෘජු බැංකු ගෙවීම් ක්‍රමය හඳුන්වාදුන් අතර එමගින් ශිෂ්‍යත්ව වාරික සිසුන්ගේ ගිණුම් වලට සෘජුවම බැර කිරීම සිදුකෙරෙන අතර එමගින් ප්‍රමාදයකින් තොරව ශිෂ්‍යත්ව මුදල් ගෙවීම සිදුවේ.

- සියළුම උසස් තාක්ෂණ විද්‍යාලවල සිසුන්ගේ ශිෂ්‍යත්ව වාරික මුදල රු. 1000/- කින් ඉහල නැංවීම 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලදී.

1981 සිට 2019 දක්වා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල භාර අමාත්‍යාංශය හා විෂය භාර අමාත්‍යවරයා

	විෂය භාර අමාත්‍යාංශය	විෂය භාර අමාත්‍යවරයා	කාලය (වර්ෂය)
1	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා	1981 - 1983
2	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (ජාතික ආරක්ෂක අමාත්‍ය)	1984 - 1988
3	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1989-1990
4	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1991 -1992
5	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1993
6	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සූර් අමාත්‍යතුමා	1994
7	අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු කිංස්ලි ටී වික්‍රමරත්න අමාත්‍යතුමා	1995 - 2000
8	අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ, නාවික සංවර්ධන හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය	ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා	2001
9	වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය	ගරු රවි කරුණානායක අමාත්‍යතුමා	2002 - 2004
10	වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය	ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමා	2004 මැයි - 2007
11	වෙළඳ, අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය	ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2008 - 2009
12	සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා	2010 - 2012
13	ජනාධිපති ලේකම් කාර්යාලය	ජනාධිපති ලේකම්	2013 - 2014
14	ආහාර සුරක්ෂිතා අමාත්‍යාංශය	ගරු ගාමිනී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා	2015
15	සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමා	2015 නොවැ. - 2018
16	උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා	2018 ජූලි
17	නගර නිර්මාණ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා	2018 ඔක් - 2019 නොවැ.
18	උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2019 නොවැ.

භාරකාර මණ්ඩලය - 2019

	භාරකරු/භාරකරුවන්	තනතුර	සිට	දක්වා
1.	ගරු නලින් පෙරේරා මහතා	අග්‍රවිනිශ්චයකාරතුමා	2018 ජන.	2019 නොවැ.
2.	ගරු ජයන්ත ජයසූරිය මහතා	අග්‍රවිනිශ්චයකාරතුමා	2019 දෙසැ.	
3.	ගරු රවුෆ් හකීම් මහතා	නගර නිර්මාණ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය	2018 ඔක්.	2019 නොවැ.
4.	ගරු ලකී ජයවර්ධන මැතිතුමා	නගර නිර්මාණ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන වැඩ බලත අමාත්‍ය	2019 අප්‍රේල්	2019 ජුනි
5.	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන	උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	2019 දෙසැ.	
6.	එම්.එම්.පී.කේ. මායාදුන්නේ මහතා	ලේකම්, නගර නිර්මාණ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	2018 ඔක්.	2019 නොවැ.
7.	අනුර දිසානායක මහතා	ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	2019 නොවැ.	2019 දෙසැ.
8.	පත්මසිරි ජයමාන්න මහතා	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	2019 ජනවාරි	
9.	එම්.එන්. රණසිංහ මහතා	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	2019 පෙබ.	2019 ඔක්.
10.	එච්.එම්. චිත්‍රානන්ද මහතා	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	2019 ඔක්.	2019 දෙසැ.
11.	එස්.ටී. කොඩිකාර මහතා	ලේකම්, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	2019 ජන.	2019 සැප්.
12.	ජී.කේ.එස්.එල්. රාජදාස මහතා	ලේකම්, අභ්‍යන්තර වෙළඳ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	2019 ඔක්.	2019 දෙසැ.
13.	එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර	පත්කල භාරකරු	2019 ජන.	2019 දෙසැ.
14.	වෛද්‍ය ඩී.කේ.ඩී.මැතිවු මහතා	පත්කල භාරකරු	2019 ජනවාරි.	
15.	මහාචාර්ය ඒ.එල්.එම්. කාදර් මහතා	පත්කල භාරකරු	2019 පෙබ.	2019 ජූනි
16.	ගුලාම් රශීඩ් මහතා	පත්කල භාරකරු	2019 ජූලි	2019 දෙසැ.



මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදලේ අධ්‍යක්ෂවරයාගේ වාර්තාව

ආරම්භය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල රටේ උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ගේ දායාදයක් වන අතර, එහි නිර්මාර්තෘ ගරු දිවංගත ලලිත් ඇතුලත්මුදලි ශ්‍රීමතානන් මෙම අවස්ථාවේ දී ඉතා කෘතඥවේදීව සිහිපත් කරන අතර, ඒ උදාර මිනිසා දුරදක්නා නුවණින් හා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි යෞවනයන්ගේ දායකත්වය ඉතා වටිනා සම්පතන් බව අවබෝධකරගෙන අඩු පහසුකම් සහිත යෞවනයන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා උදාකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍යාධාර සැපයීම පෙරදැරි කරගෙන තම පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ආරම්භ කළ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල 2019 වන විට වසර 40 ක් ගතවී ඇති අතර, රු.බි. 17 කට අධික වියදමක් දරා ලක්ෂ 3 කට අධික සිසුන් සංඛ්‍යාවකට මහපොළ ශිෂ්‍යාඥ ලබා දී ඇති අතර, වර්තමානයේ අරමුදල රු.බි. 11 කට අධික වත්කම් වලින් ශක්තිමත් වී ඇත.

පසුගිය දශකයක කාලය තුල මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල විවිධ අර්බුධවලට හා දුර්වල කළමනාකරණය නිසා ඉතා විශාල පසුබෑමකට ලක් වූ අතර දූෂණ හා අක්‍රමිකතා නිසා අරමුදලේ වර්ධනය ඉතා විශාල ලෙස පහළ ගොස් තිබුණි. 2015 වර්ෂයේ මාගේ පත්වීමත් සමඟ එම සියලු දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව ඉතා සූක්ෂමකව විමර්ෂණය කොට ඒවා වැලැක්වීම සඳහා අවශ්‍ය පියවර භාරකාර මණ්ඩලයේ අනුමැතිය යටතේ ගැනීමට හැකි වූ අතර ඒ සඳහා විශාල කැපකිරීමක් සිදුකල අතර, ඒ තුළින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල සුරක්ෂිත කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලවල් රාශියක් දියත් කිරීමට හැකියාවක් ලැබුණි.

ශිෂ්‍යත්ව වාරික ඉහල නැංවීම

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල ස්ථාපිත අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකාවේ සිසුන්ගේ ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපන ඉහළ නැංවීම අරමුණු කොට ගෙන දිවයිනේ සියලුම පළාත් නියෝජනය වන පරිදි පාසල් පද්ධතිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පසුගිය දශකය තුල අතිවිශාල කාර්යභාර්යක් ඉටුකල අතර සමාලෝචිත වර්ශයේදී එම අරමුණ ඉටු කර ගැනීම කෙරෙහි යම් යම් බාධක ඇති විය. එහිදී විශේෂයෙන් දිවයිනේ විශ්ව විද්‍යාල පද්ධති සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව ඉහළ නැංවීම තුල මහපොළ ශිෂ්‍යත්ව ප්‍රමාණයද ඉහළ නැංවීමට සිදු විය. එසේම ශිෂ්‍යත්ව මුදල හා ශිෂ්‍යත්ව සංඛ්‍යාව වැඩි කරන ලෙස උසස් තාක්ෂණ ආයතන වල සිසුන්ගේ ඉල්ලීම අනුව ශිෂ්‍යත්ව වාරිකයක වටිනාකම උසස් තාක්ෂණ ආයතන වල සිසුන් සඳහා ලබා දුන් රු. 1500ක මුදල රු.2500ක් දක්වා ඉහළ නංවන ලදි. මේ සඳහා අතිරේක පිරිවැයක් මහපොළ අරමුදලට දැරීමට සිදු විය.

ඉදිරි දැක්ම

කෙසේ වෙතත් මහපොළ අරමුදලේ 2020 - 2025 උපාය මාර්ග සැලැස්ම අනුව ඉදිරි පස් වසර තුල දැනට ලබා දෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව 30%ක් පමණ ඉහළ නැංවීමට හා ශිෂ්‍යත්වයක වටිනාකම 25% පමණ එනම් රු. 7000 දක්වා වැඩි කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කොට ඇත. එම සැලසුම් ක්‍රියාත්මක වීමේදී දැනට පවතින රු. බිලියන 11ක අරමුදල රු. බිලියන 20 දක්වා වැඩි කිරීමටත් ඒ තුලින් ජනිත වන අතිරේක ආදායම් අරමුදලේ ස්ථාපිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොදා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි විශ්වාස කරමි.

සම්බන්ධිත ව්‍යාපාර කළමණාකරනය

මහපොළ අරමුදල පසු ගිය කාලය තුල දුර්වල කාළමනාකරණය නිසා අරමුදලේ වර්ධනය ඉතා පහල මට්ටමක පැවති අතර ශිෂ්‍යත්ව ගෙවීමද විශාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. 2019 වර්ශයේදි මහපොළ අරමුදලට සම්බන්ධ උප සමාගම් වන NWSL හා NWCL යන සමාගම් සම්බන්ධයෙන් එම ආයතන ප්‍රතිසංවිධනය කිරිම සදහා මහපොළ අරමුදල ලංකා බැංකුවේ ගිණුම වෙත නැවත ලබා ගැනිමටත් ඒ අනුව ආයෝජන අවස්ථා පුළුල් කොට සමාලෝචිත වර්ෂයේ අරමුදලේ වර්ධනය 16%ක් වැනි අගයකට ලගා කර ගැනිමට හැකි වීම සතුටට කරුනකි.

එසේම එම සම්බන්ධිත ව්‍යාපාර වල කළමනාකාරිත්වය වෙනස් කොට එම සමාගම් ලාබ ලබන මට්ටමට ගෙන එමට හැකියාව ඇති අධ්‍යක්ෂක මණ්ඩලයක් හා කළමනාකරණ මණ්ඩලයක් පත් කිරිමට භාර අරමුදල කටයුතු කළ අතර එමගින් මහපොළ අරමුදල ශක්තිමත් කිරිමට හැකිවී ඇත.

ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර භාර අරමුදල් පනත 1981 පාර්ලිමේන්තුවේ සම්මත කළ අතර, අද වන විට වසර 39 ක් ගෙවී ඇති නමුත් අරමුදලේ මූල්‍ය ක්‍රියාකාරීත්වය ආරක්ෂා කිරීමට හා අරමුදල පරිපාලනය සඳහා පත්කරන ලද නිලධාරීන් හා භාරකරුවන් අතින් සිදුවන වැරදි හා අවභාවිතයන් නිසා අරමුදලට සිදුවන අලාභ අවම කරගැනීම සඳහා භාර අරමුදලේ සියලුම සේවකයින් හා භාරකරුවන් පොදු දේපල පනතේ වැරදි සම්බන්ධ වන විධි විධාන වලට යටත් කිරීමට අදාල සංශෝධන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර භාර අරමුදල් පනතට ඇතුලත් කොට 2019 වසරේ දී මහපොළ පනත සංශෝධනය කරන ලදී.

සමාලෝචිත වර්ශයේදි මහපොළ අරමුදල කළමනාකරණය කිරිම සඳහා විශේෂ අරමුල් කළමනාකරණ කමිටුවක් භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ස්ථාපිත කල අතර අරමුදලේ සියලුම ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරිත්වය මෙම ස්ථාපිත ආයෝජන කමිටුවේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක කිරිමට හැකියාව ලැබුණු අතර ඒ තුලින් ආයතනය ශක්තිමත් යහපාලනයක් ඇති කිරිමට හැකියාව ලැබුණි. 2019 වර්ශයේදි සැම මාස 03කට වරක් ආයෝජන කමිටු රැස්වීම් පවත්වා ඇති අතර සියලුම ආයෝජන එම කමිටු නිර්දේශ මත සිදු කොට ඇත.

ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා නව තාක්ෂණය යොදා ගැනීම

වර්තමානයේ මිල මට්ටම් වල ඉහල යාම සහ උසස් අ අධ්‍යාපනය හදාරන සිසුන්ගේ එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමට ඉතා විශාල වියදමක් දැරීමට සිදුවී ඇති බැවින්, නියමිත නිශ්චිත දිනයකදී ඔවුන්ගේ ශිෂ්‍යාධාර වාරික ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකොට ඇත. මේ යටතේ පෙර පැවති ගෙවීම් ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ද ලැබුණි. එතෙක් පැවති ගෙවීම් ක්‍රමය යටතේ සිසුන්ට මාසිකව ශිෂ්‍යාධාර වාරික විශ්ව විද්‍යාල මගින් ගෙවූ අතර, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර භාර අරමුදලේ දායකත්වය විශ්ව විද්‍යාලට යොමු කරන ලදී. මෙම ගෙවීම් ක්‍රියාවලිය සඳහා ඉතා විශාල කාලයක් ගත වූ අතර, සිසුන්ට මාස 02 ක් හෝ ඊට වැඩි කාලයක් ශිෂ්‍යාධාර වාරික ගෙවීමට ප්‍රමාද විය. ඒ අනුව මෙම ගෙවීම් ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කොට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර භාර අරමුදල මගින් මාසිකව ශිෂ්‍යාධාර වාරිකය සෑම මාසයකම 15 වන දින සිසුන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම බැර කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර, ගෙවීම් වලට අදාල නිර්දේශ පමණක් විශ්ව විද්‍යාලයෙන් ලබා ගන්නා ලදී. ඒ අනුව සියළුම විශ්ව විද්‍යාල හා විද්‍යායතන වල සිසුන් 60,000 කට පමණ 2019 වර්ෂයේ සිට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර භාර අරමුදල මගින් සෘජුවම ගෙවීම් කටයුතු සිදුකරනු ලබයි. මෙම ක්‍රමය දැනට සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබීම සතුටට කරුණක් බව ප්‍රකාශ කරන අතර, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදුන් සියළු දෙනාටම මාගේ ප්‍රණාමය පුද කරමි.

වත්කම් සුරක්ෂිත කිරීම

එසේම 2019 වර්ශය තුල මහපොළ අරමුදල සම්බන්ධිත ව්‍යාපාර ආයතනයක් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් විධිමත් පරිපාලන ව්‍යුහයක් ඇති කිරීමට අදාල සාධනිය පියවර කිහිපයක් ගැනීමට හැකියාව ලැබුණි. ඒ අතර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් විශේෂ විගණනයක් සිදු කොට එම වාර්තාව පාර්ලිමේන්තු කෝප් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි. එහිදි SLIIT ආයතනයේ දැනට පවතින පරිපාලන ගැටලුව සම්බන්ධයෙන් හා එය මහපොළ අරමුදලට අයත් වත්කමක් බැවින් එහි ප්‍රතිලාභ විධිමත්ව මහපොළ අරමුදලේ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා ලබා ගැනීමට අවශ්‍ය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කරන ලදි. දැනට මෙම යෝජනා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇති අතර එම SLIIT ආයතනයේ වත්කම් සම්බන්ධයෙන් විධිමත් වත්කම් තක්සේරු කිරීම රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙත ඉල්ලීමක් උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කොට ඇත. ඉදිරියේදි මෙම ආයතනයේ කටයුතු ඉතා විධිමත්ව මහපොළ අරමුදල ස්ථාපිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි ඉටු කිරීමට හැකියාව ලැබේ යැයි අපේක්ෂා කරමි.

අවසාන වශයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ශක්තිමත් කිරීමටත් එහි යහපාලනය හා ක්‍රියාකාරිත්වය තුලින් ස්ථාපිත අරමුණු සාක්ෂාත් කරගැනීමටත් සහයෝගය දැක්වූ ප්‍රාරම්භක භාරකරු නියෝජනය කරමින් පත් වූ සියලුම විෂය භාර අමාත්‍යවරුන් නිළ භාරකරුවන්, නිළධාරීන් හා ඉතා කැපවීමෙන් වැඩ කල සේවක මණ්ඩලයට, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අනිකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතන වල සියලුම නිළධාරීන්ටත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුලු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පල කර සිටිමි.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට එළඹෙන 2020 වර්ෂය ඉතා අභියෝගාත්මක වර්ෂයක් බවත් එය කළමනාකරණය කර ගනිමින් උසස් අධ්‍යාපනය අපේක්ෂවෙන් සිටින අඩු පහසුකම් ඇති යෞවනයන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හා ශක්තිමත් කිරීමට පවතින අභියෝග ජය ගනිමින් අවශ්‍ය මූල්‍යමය ශක්තිය ලබා දිමට හැකි වන ඉතා විශිෂ්ට ආයතනයක් බවට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පත්වේවා යැයි මම එක සිතින් ප්‍රාර්ථනා කරමි.

එම්.පරාක්‍රම බණ්ඩාර,
අධ්‍යක්ෂ,
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

කාර්ය සාධන වාර්තාව

01. ශිෂ්‍යත්ව ප්‍රදානය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන පිරිස් අතර වාර්ෂිකව ප්‍රදානය කරන සීමිත මහපොළ ශිෂ්‍යත්ව (කුසලතා) ප්‍රමාණය අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව ප්‍රදානය කෙරේ. එහිදී ඉහළ ලකුණු ලබාගත් සිසුනට කුසලතාව පදනම් කරගෙන මහපොළ කුසලතා ශිෂ්‍යත්වද එතැන් සිට කුසලතාවයට ප්‍රමුඛත්වය දෙමින් පවුලේ ආදායම සැලකිල්ලට ගෙන මහපොළ සාමාන්‍ය ශිෂ්‍යත්වද පිරිනමනු ලැබේ. වාර්ෂිකව වෙන් කරන මුළු මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාවෙන් 10% කුසලතා ශිෂ්‍යත්ව වන අතර ඉතිරි 90% සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා වෙන්කර ඇත. සාමාන්‍ය ශිෂ්‍යත්වයක් සඳහා මාසිකව රු.5,000/- ක් ගෙවන අතර කුසලතා ශිෂ්‍යත්වයක් සඳහා රු.5,050/- ක් ගෙවනු ලැබේ.

මෙම වර්ෂයේදී 2018/19 අධ්‍යන වර්ෂය සඳහා 2018 අ.පො.ස.(උසස් පෙළ) ප්‍රතිපල මත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා වර්ෂය තුල ඇතුලත් කල සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව 15,000/- ක් ප්‍රදානය කිරීමට මහපොළ ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය මඟින් අනුමැතිය ලබාදෙන ලදී. මෙකී සංඛ්‍යාවෙන් 1501 ක් පමණ දෙනෙකු කුසලතා පදනම මත ශිෂ්‍යත්ව ලැබූ අතර ඉතිරි ශිෂ්‍යත්ව 13,500 කුසලතා පදනම මත අඩු අදායම් ලබන පවුල්වල සිසුන් වෙත පිරිනමනු ලැබේ. විශ්ව විද්‍යාලවලට ප්‍රවේශිත මුළු සිසුන් සංඛ්‍යාව වන 30,830 සමඟ සංසන්දනය කිරීමේදී සිසුන්ගෙන් 53% ක් මෙම මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය යටතේ ආවරණය විය. මේ අනුව 2019 වර්ෂයේදි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් නිර්දේශිත පාඨමාලා සඳහා ඇතුලත් කල ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දෙන ලදි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් නිර්දේශ කරන ලද පාඨමාලාවල සිසුන්ට ලබාදුන් ශිෂ්‍යත්ව ප්‍රමාණයට අමතරව අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි හා වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව 2100 ක් පිරිනැමීමට ක්‍රියාකර ඇත.

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය 2015 - 2019

	විශ්වවිද්‍යාලය	2015	2016	2017	2018	2019
1.	කොළඹ	1,246	1,182	1,521	1,761	1,815
2.	පේරාදෙණිය	1,381	1,318	1,452	1,757	1,852
3.	කැළණිය	1,590	1,551	1,820	1,985	2,001
4.	ශ්‍රී ජයවර්ධනපුර	1,859	1,894	2,029	2,288	2,372
5.	මොරටුව	836	775	828	957	952
6.	යාපනය	785	1,049	1,129	1,062	962
7.	යාපනය (රාමනාදන්)	130	116	142	40	34
8.	රුහුණ	1,015	907	1,009	1,098	1,043
9.	යාපනය - වවුනියා මණ්ඩපය	104	124	109	90	104
10.	නැගෙනහිර	340	583	633	402	391
11.	ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද විද්‍යායතනය	31	8	7	16	29
12.	දේශීය වෛද්‍ය විද්‍යායතනය	68	66	73	93	116
13.	කොළඹ පරිගණක පාසැල	69	83	94	131	125
14.	කොළඹ - ශ්‍රී පාලි	92	69	99	63	49
15.	සෞන්දර්ය කලා	348	330	330	242	216
16.	අග්නිදිග	801	908	905	651	598
17.	රජරට	609	673	814	779	812
18.	සබරගමුව	546	535	556	540	477
19.	වයඹ	358	509	574	683	654
20.	නැගෙනහිර-ත්‍රිකුණාමලය මණ්ඩපය	109	127	118	135	129
21.	ඌව වෙල්ලස්ස	167	229	251	175	189
22.	ස්වාමි විපුලානන්ද	191	140	161	38	37
	මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව	**12,675**	**13,176**	**14,654**	**14,986**	**14,957**


මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයන් (අනෙකුත් ආයතන)

ආයතනය		සිසුන් සංඛ්‍යාව
1.	ශ්‍රී ලංකා නීති විද්‍යාලය	25
2.	ජාතික තාක්ෂණ ආයතනය, මොරටුව	170
3.	බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය	26
4.	බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය	20
5.	ජාතික සමාජ සංවර්ධන ආයතනය (උපාධි 10 ඩිප්ලෝමා 14)	10
6.	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	1500
7.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	400
	එකතුව	**2151**

විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යකඳ සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යකඳලාභීන් අතර සැසඳීම


වර්ෂය	2015	2016	2017	2018	2019
විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	25,523	28,939	30,000	31,158	34,161
ආදායම් සීමාව (රු.ලක්ෂ 5 ට අඩු) අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව	14,000	15,000	15,000	20,000	17,890
මහපොළ ශිෂ්‍යකඳලාභීන් සංඛ්‍යාව	13,176	14,654	14,500	14,984	15,001
ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	54%	52%	50%	64%	52%
මහාපොළ ලාභීන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	52%	51%	48%	48%	44%
ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ සිසුන් අතරින් මහපොළ ලැබූ සිසුන්	94%	97%	96%	75%	84%

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය 2015 – 2019




02. **ශිෂ්‍යත්ව ගෙවීම**

මහපොළ ශිෂ්‍යත්වලාභියෙකුට එක අධ්‍යයන වර්ෂයකදී මසකට වාරිකය බැගින් ශිෂ්‍යත්ව වාරික 10 ක් ගෙවනු ලැබේ. ඒ අනුව, ශිෂ්‍යත්වය වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා මහා භාණ්ඩාගාරයෙන් මාසිකව සපයන රු.2,450/- ක් ද ඇතුළුව සෑම මහපොළ ශිෂ්‍යවත්වලාභියෙකුම පිළිවෙලින් කුසලතා ශිෂ්‍යත්ව සඳහා රු.5,050/- ක් ද සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා රු.5,000/- ක් ද විශ්ව විද්‍යාල මඟින් ලබාදෙනු ලැබේ.



ශිෂ්‍යත්ව ගෙවීම් කඩිනම් කිරීම උදෙසා සෘජු ගෙවීම් ක්‍රමය හඳුන්වාදීම


පැරණි ගෙවීම් ක්‍රමය



විශ්වවිද්‍යාලය විසින් අත්සන් ලේඛණ භාවිතා කරමින් සිසුන්ගේ ගෙවීම් කටයුතු සිදුකරන ලදී. එහිදී ඉතා විශාල ප්‍රමාදයක් සිදුවිය. මාස 03 හෝ 04 ක් ප්‍රමාදවී වාරික සිසුන් වෙත ලබාදීම සිදුවිය.

මෙම ප්‍රමාදය වැලැක්වීම සඳහා ශිෂ්‍යත්ව වාරිකය සිසුන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම බැරකරන ක්‍රමයක් යෝජනා කොට මහාභාණ්ඩාගාරයේ එකඟතාවය මත 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලදී.

නව ගෙවීම් ක්‍රමය



ඒ අනුව දැනට විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන 22 සිසුන් 70,000 ක් සඳහා සෘජු බැංකු ගෙවීම් ක්‍රමය යටතේ ශිෂ්‍යත්ව වාරික ගෙවීම සිදු කරයි. ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල සෘජුවම මැදිහත් නොවන අතර මහපොළ අරමුදල විසින් මාසික වාරිකය රු.5,000/- හා රු.5,050/- සිසුන්ගේ ගිණුම්වලට බැර කරනු ලැබේ. මෙය ඉතා සාර්ථකව සිදුවන අතර කිසිදු ප්‍රමාදයකින් තොරව සිසුන්ට වාරික මුදල් නියමිත වේලාවට ලැබේ.

වාර්ෂිකව පිරිනමනු ලබන මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා වෙන් කිරීම්.

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා සුදුසුකම් නිර්ණායක

ලලිත් ඇතුලත්මුදලි ශිෂ්‍යත්ව භාර අරමුදල කුසලතා ශිෂ්‍යත්ව සහ සාමාන්‍ය ශිෂ්‍යත්ව කාණ්ඩ දෙකක් යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ.

කුසලතා ශිෂ්‍යත්වය

අ.පොෂ.ස.උසස් පෙළ විභාගයේදී සිසුන්ගේ කාර්ය සාධනය මත පදනම්ව කුසලතා කාණ්ඩය යටතේ සීමිත මහපොළ ශිෂ්‍යත්ව ප්‍රමාණයක් ප්‍රදානය කෙරේ.විභාගයෙන් ඉහළ ප්‍රතිපල ලබා ගන්නා සිසුන්ට මෙම කාණ්ඩය යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ. වාර්ෂිකව වෙන් කරනු ලබන ශිෂ්‍යත්ව වලින් 10% ක් කුසලතා ක්‍රමය යටතේ ලබා දෙනු ලබයි.

සාමාන්‍ය ශිෂ්‍යත්වය

මහපොළ සාමාන්‍ය ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නේ ශිෂ්‍යයා ලබා ගන්නා දිස්ත්‍රික් කුසලතාවය ප්‍රමුඛතාවය දී පවුලේ ආදායම ද සැලකිල්ලට ගනිමිනි. මහපොළ ශිෂ්‍යත්වයේ මුළු සංඛ්‍යාවෙන් 90% ක්ම සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා වෙන් කර ඇත.

මහපොළ ශිෂ්‍යත්වයක් ලැබීම සඳහා සුදුසුකම් නිර්ණායක

පහත සඳහන් අවශ්‍යතා සපුරාලන සිසුන් ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලබති.

ශිෂ්‍යයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ඔහු / ඇය විශ්ව විද්‍යාලයක හෝ විශ්ව විද්‍යාලයකට අනුබද්ධ ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටිය යුතුය.

දෙමාපියන්ගේ ආදායම්

- මාපිය ආදායම **2018/19** සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂිකව රු. 500,000/- ට සමාන හෝ අඩු විය යුතුය.
- ඉහත ආදායම් සීමාව **2018/19** අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ සිසුන්ට බලපැවැත්වෙනු ඇත. කෙසේ වෙතත්, මෙම චක්‍රලේඛයේ බලපැවැත්වෙන දිනට කිසිදු මූල්‍ය ආධාරයක් නොලැබෙන සිසුන්ට ඔවුන්ගේ දෙමාපියන්ගේ ආදායම සංශෝධිත සීමාවන් තුළට වැටෙන්නේ නම් මහපොළ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.
- මහපොළ සඳහා සිසුන් තෝරා ගැනීමේදී, සිසුන්ගේ දෙමව්පියන් නෛතිකව වෙන්වී ඇත්නම් එය සනාථ කිරීම සඳහා ලේඛණමය සාක්ෂි හෝ එකී වෙන් වීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නම්, ග්‍රාම නිලධාරි සහ අදාළ ප්‍රදේශයේ පොලිස් වාර්තා ලැබීමෙන් පසු ආදායම් සීමාව තීරණය කිරීම සලකා බලනු ලැබේ.
- ශිෂ්‍යයා සේවයේ යොදවා ඇත්නම්, එම රැකියාවෙන් ලැබෙන ආදායම දෙමාපියන්ගේ ආදායමට එකතු කළ යුතුය. ශිෂ්‍යයා රැකියාවක නියුතු නම් හා විවාහක නම්, ශිෂ්‍යයා සහ කලත්‍රයා වෙනම පවුලක් ලෙස සැලකිය යුතු අතර, ඉහත දක්වා ඇති නිර්ණායක අනුව මහපොළ සඳහා ඔහුගේ / ඇයගේ සුදුසුකම් සඳහා සලකා බලනු නොලැබේ.

මහපොළ ශිෂ්‍යත්ව වාරික මුදල් ලබාදීමේදී සලකා බලනු ලබන කොන්දේසි

සමාලෝචිත වර්ෂයේ දී මහපොළ ශිෂ්‍යත්ව මුදල් ලබා දීමේදී හා ශිෂ්‍යත්ව වාරික අත්හිටුවිම සම්බන්ධ විශේෂ නිර්නායක ගනු ලැබීය. එම සියලු නිර්නායක අනුව ඒ ඒ විශ්ව විද්‍යාල මඟින් ගෙවීම් තහවුරු කොට මහපොළ අරමුදල වෙත දැනුම්දීමෙන් පසු ශිෂ්‍යත්ව වාරික ගෙවීම තීරණය කරනු ලැබේ.

ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබ ඇති පාඨමාලාවේ, ශිෂ්‍යත්වලාභියා විසින් අධ්‍යයන කටයුතු වලින් ලබාගන්නා ප්‍රගතිය මත විශ්වවිද්‍යාලයේ නිර්දේශය අනුව, ශිෂ්‍යත්ව වාරික මුදල් මාසිකව ගෙවනු ලැබේ.

- විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව සඳහා අධ්‍යයන වර්ෂයකට වාරික 10 ක උපරිමයකට යටත්ව ශිෂ්‍යත්ව වාරික ගෙවනු ලැබේ.

- පාඨමාලාවට නියමිත දේශන, නිබන්ධන පන්ති හා ප්‍රායෝගික පන්ති ආදී පාඨමාලාවේ කටයුතුවලට විධිමත් පරිදි,_සහභාගී විය යුතු අතර, සියලුම ශිෂ්‍යත්වලාභී සිසුන් පළමු සමාසික (Semester) අවසානයේ පවත්වන විභාග සඳහා සුදුසුකම් ලබා ඇති බව විශ්ව විද්‍යාලයේ අදාල පීඨයේ පීඨාධිපති විසින් සහතික කොට උපකුලපති විසින් අනුමත කොට මහපොළ අරමුදල වෙත එවීම මඟින් ශිෂ්‍යත්ව වාරික ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන අතර එම සහතිකය මත ඉදිරි මාස 06 සඳහා වාරික අඛණ්ඩව ගෙවීම සිදුකරනු ලැබේ. එසේ නොවන අවස්ථාවල ඒ පිළිබඳ විශ්ව විද්‍යාලයෙන් ඉදිරිපත් කරන නිර්දේශය අනුව ශිෂ්‍යත්ව ගෙවීම් අත්හිටුවීම සිදුවනු ඇත. එම සිසුන්ගේ ගෙවීම් නැවත සක්‍රීය කර ගැනීම සඳහා වර්ෂයේ දෙවන සමාසිකය (Semester) *විභාග* සඳහා සිසුන් සුදුසුකම් ලබා ඇති බව විශ්ව විද්‍යාලය විසින් මහපොළ අරමුදල වෙත දැනුම්දිය යුතුය.

- යම් සිසුවෙක් පළමු සමාසිකය (Semester) විභාග සඳහා සුදුසුකම් ලබා නොතිබුණත් පීඨාධිපතිවරයා විසින් දෙවන සමාසිකය (Semester) සඳහා සුදුසුකම් ලබා ඇති බව නිර්දේශ කිරීමෙන් පසු ඔහුගේ හෝ ඇයගේ අත්හිටවූ වාරික නැවත සක්‍රීය කිරීමට සලකා බලනු ලැබේ.

- පාඨමාලාව පැවැත්වෙන කාලය තුලදී මසකට එක් ශිෂ්‍යත්ව වාරිකය බැගින් පමණක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මඟින් ශිෂ්‍යත්වලාභියා වෙත ගෙවනු ලැබේ.

- ශිෂ්‍යත්ව වාරික ගෙවීම සඳහා ශිෂ්‍යත්වලාභීන්ගේ නම් විශ්ව විද්‍යාලය මඟින් නිර්දේශ කරන අතර එසේ නිර්දේශ නොවුවහොත් ඒ පිළිබඳව විශ්ව විද්‍යාලයෙන් විමසිය යුතුය.

- මෙම ශිෂ්‍යත්වය භාර ගැනීමෙන් පසුව මෙම පාඨමාලාව හෝ වෙනත් පාඨමාලාවකට හෝ වෙනත් කිසිදු ශිෂ්‍යත්වයක් හෝ ශිෂ්‍යාධාර මුදලක් ලබාගැනීමට අවසර නැත. වෙනත් ශිෂ්‍යත්වයකට හිමිකම් ලබන ශිෂ්‍යයෙකු ඔහුට / ඇයට මනාපය පරිදි පළමු ශිෂ්‍යත්වයේම පමණක් රැඳී සිටීම හෝ පළමු ශිෂ්‍යත්වය අවලංගු කර නව ශිෂ්‍යත්වය ලබා ගැනීම හෝ සිදුකළ හැකිය. **එවැනි අවස්ථාවලදී ශිෂ්‍යයා විසින් වහාම ඒ බව තම විශ්ව විද්‍යාලය වෙත දැනුම්දිය යුතුය.**

මෙහෙයුම් සමාලෝචනය

පහත සඳහන් අවස්ථාවල **ශිෂ්‍යත්වය අවලංගු වනු ඇත.** ඒ සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද සලකා බලනු නොලැබේ.

- පාඨමාලාවට සහභාගී නොවීම.
- දීර්ඝකාලීනව පාඨමාලාවට සහභාගී නොවීම.
- වාර්ෂික විභාග අසමත්වීම.
- පාඨමාලාව අත්හැරයාම.
- විනය විරෝධී ක්‍රියා හේතූන් මත පන්ති තහනම් කිරීම.
- නවක වදය සම්බන්ධයෙන් දඩුවම් ලැබීම.
- විෂමාචාර ක්‍රියා පිළිබඳ වැරදිවලදී හෝ අපචාර හා අපයෝජන සිද්ධීන්ට සම්බන්ධවීම මත විශ්ව විද්‍යාලය මඟින් විනය පරීක්ෂණ පවත්වා දඩුවම් ලබා ඇති අවස්ථාවකදී හෝ අනෙකුත් වැරදි සම්බන්ධව උසාවියක් මඟින් දඩුවම් ලබා ඇති අවස්ථාවක
- විශ්ව විද්‍යාලවල දේපලවලට හෝ රාජ්‍ය දේපලවලට හානි සිදුකිරීම මත දඩුවම් ලැබීම.
- ආදායම් ලැබීම පිණිස ව්‍යාපාරයක, සේවයක හෝ රැකියාවක නියුක්තවීම යන හේතුද මෙම ශිෂ්‍යත්ව වාරික මුදල් සහ හිමිකම් නොලැබීමට හේතුවනු ඇත.


ශිෂ්‍යයාගේ පාලනයෙන් බැහැර වූ නොවැලැක්විය හැකි හේතූන් මත ශිෂ්‍යයා විසින් තම අධ්‍යයන කටයුතු කල්ගනු ලබන අවස්ථාවේදී අදාල ඉදිරි වර්ෂයේදී මෙම ශිෂ්‍යත්වය ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ නම් හා එවැනි **කල්ගැනීම් වලදී වුවද** තම ශිෂ්‍යත්වය සඳහා හිමිකම් ලැබීමට නම් ශිෂ්‍යයා විසින් පළමුව ශිෂ්‍යත්ව ප්‍රදානයේදී සිය ශිෂ්‍යත්ව සහතිකය ලබාගත යුතුය. ඒ පිළිබඳ නිර්දේශය විශ්ව විද්‍යාල මඟින් මහපොළ අරමුදල වෙත ලබාදිය යුතුය.

ශිෂ්‍යයාගේ වර්තමාන විශ්වවිද්‍යාල පාඨමාලාව පසුව වෙනස් වුවහොත් එවැනි ශිෂ්‍යයෙකු ලබාගෙන ඇති ලකුණු ප්‍රමාණය අනුව නව පාඨමාලාව යටතේද ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසුකම් ඇති බව පෙනී ගියහොත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව අලුත් ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරනු ලැබේ. එම ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලැබීමට විශ්ව විද්‍යාලය මඟින් නිර්දේශ කල යුතුය.


ශිෂ්‍යත්ව හෝ ශිෂ්‍යත්ව වාරික ගෙවීම සම්බන්ධයෙන් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ තීරණය අවසන් තීරණය වනු ඇත.

2019.12.31 දිනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලේ මූල්‍ය තත්වය


සමස්ථ අරමුදල



ආයෝජන කළඹ - ප්‍රධාන අරමුදල




ආයෝජන ආදායම - ප්‍රධාන අරමුදල



	Rs. Mn
TB Coupon	621.5
TB Cap. Gain	50.2
TB Int.	6.2
Asst. Back. Int.	32.4
Bebent. Int.	171.6
FD Int.	253.3
Other Income	15.0
Total	**1150.2**

සමස්ථ ආදායම 2019



	Rs. Mn
Main Fund	1150.2
DLB Profit	997.4
SLIIT	20.0
Total	**2167.6**

2020 පළමු මස 06 සඳහා වන කළමානාකරණ ගිණුම්
2020 ජුනි 30 දිනෙන් අවසන් කාලඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ආදායම	30.06.2020 රු. මි.	30.06.2019 රු. මි.	වර්ධනය
පොළී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර	367.1	358.3	
පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත්	-	18.1	
පොළී ආදායම - වත්කම් පිටුබලය සහිත විශ්වාසය	-	17.2	
පොළී ආදායම - ස්ථාවර තැන්පතු	241.0	120.0	
පොළී ආදායම - ණයකර	85.8	78.0	
පොළී ආදායම - කෙටිකාලීන තැන්පතු	3.4	28.0	
භාණ්ඩාගාර බැඳුම්කර මත ප්‍රාග්ධන ලාභ	127.0	2.0	
මුළු ආයෝජන ආදායම	**824.3**	**621.6**	**32%**
සෘජු වියදම්			
භාරකාර ගාස්තු - ලංකා බැංකු ව(MTF)	(1.2)	(0.93)	
මූල්‍ය වියදම් - භාණ්ඩාගාර බැඳුම්කර අධිමිල	(44.0)	(0.97)	
ලංකා බැංකු ණය පොළී වියදම		(35.3)	
ශුද්ධ ආයෝජන ආදායම	**779.1**	**584.4**	**33%**
වෙනත් ආදායම්			
DLB ලාභ කොටස	334.1	500.8	
SLIIT බදු කුලිය	12.5	10.0	
මුළු වෙනත් ආදායම්	**346.6**	**510.8**	**(32%)**
මුළු ආදායම	**1125.7**	**1095.1**	
වියදම්			
ශිෂ්‍යත්ව ගෙවීම්	(439.0)	(344.4)	**(27%)**
චේතන	(7.0)	(7.1)	
වෙනත් පරිපාලන වියදම්	(8.0)	(8.1)	
ක්ෂය	(28.8)	(29.0)	
මුළු වියදම්	**(482.8)**	**(388.6)**	
වියදම් ඉක්මවූ ශුද්ධ ආදායම	**642.9**	**706.5**	**(9%)**
බදු පෙර ශුද්ධ ලාභය / අලාභය	642.9	706.5	
ආදායම් බදු ප්‍රතිපාදන (14%)	(90.0)	(98.9)	
	552.9	**607.6**	
මුළු බදු පසු ආදායම	**552.9**	**607.6**	**(9%)**

2019 අයවැය සමාලෝචනය

විස්තරය	අයවැය 2019	සත්‍ය වැය 2019.12.31	විචල්‍ය	%
ආදායම				
ප්‍රධාන අරමුදලේ පොලී ආදායම	950.00	1,150.20	200.20	21.70%
සංවර්ධන ලොතරැයි ලාභ	900.00	997.30	97.30	10.81%
SLIIT බදු කුලී	20.00	20.00		
මුළු ආදායම	**1870.00**	**2167.50**	**297.50**	**16%**
වියදම්				
පුනරාවර්තන	**1246.10**	**1343.00**	**96.80**	**7.78%**
ශිෂ්‍යත්ව ගෙවීම්	1212.2	1310.0	97.7	
සේවක වේතන	17.9	16.1	(1.8)	
නඩත්තු)	1.9	0.4	(1.5)	
ගිවිසුම් ගත සේවා	10.4	9.8	(0.6)	
අනෙකුත් පුනරාවර්තන	1.5	4.9	3.3	
වාහන බදු කුලී	2.0	1.8	(0.2)	
අනෙකුත්	0.2	-	(0.2)	
ප්‍රාග්ධන වියදම්	**21.0**	**16.5**	**(4.5)**	**(21.43%)**
කාර්යාල උපකරණ	2.0	0.05	(1.99)	
මෝටර් රථ	17.0	16.2	0.8	
පරිගණක මෘදුකාංග	2.0	0.3	(1.7)	
සමස්ථ වියදම	1267.1	1359.5	92.4	**7.29%**
ශුද්ධ ඉතිරිය	**602.9**	**808.0**	**205.2**	**34.02%**

භාරකාර මණ්ඩලය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදලේ ඉහළම බල අධිකාරිය භාරකාර මණ්ඩලය වන අතර, සුදුසු පරිදි මෙහෙයුම් ඉටුකිරීම හා අරමුදලේ කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම දරයි. සභාපතිවරයා වශයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා කටයුතු කරන අතර විෂයභාර අමාත්‍යවරයා ප්‍රාරම්භක භාරකරු නියෝජනය කරමින් භාරකාර මණ්ඩලයේ කටයුතු මෙහෙයවයි. භාරකාර මණ්ඩලය, නිල බලයෙන් පත්වන භාරකරුවන් හා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන භාරකරුවන්ගෙන් සමන්විත වන අතර එහි සංයුතිය පහත දැක්වේ.

1. ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා නිල බලයෙන් අරමුදලේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි.
2. උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා ප්‍රාරම්භක භාරකරු නියෝජනය කරමින් භාරකරුවෙකු වශයෙන් කටයුතු කරයි.
3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් භාරකරුවෙකු වේ.
4. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් භාරකරුවෙකු වේ.
5. වෙළඳ විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල භාරකරුවෙකු වේ.
6. විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු භාරකාර මණ්ඩලය නියෝජනය කරයි.

සභාපති/ භාරකාර මණ්ඩලය

1. ආයතනික පාලනයේ යහ පැවැත්ම තහවුරු කිරීම සභාපතිවරයා ඇතුලු භාරකාරවරයාගේ වගකීම වේ.
2. භාරකාර මණ්ඩල රැස්වීම්වල මුලසුන දරමින් නිසි ක්‍රමවේදයක් අනුගමනය කරන බැව් තහවුරු කළයුතු වේ.
3. භාරකරුවන් සියලුම දෙනාට සමාන අයුරින් සැලකිය යුතු අතර, විශේෂඥතා පවතින ක්ෂේත්‍රවලට උපරිම දායකත්වය දරමින් ඵලදායක භූමිකාවක නිරත වන බවට ඔවුන් සියලු දෙනාම දිරිමත් කළයුතු වේ.
4. භාරකාර මණ්ඩල කාර්ය භාරය සම්බන්ධයෙන් වන අවසන් තීන්දු තීරණ ගැනීමේ බලතල භාරකාර මණ්ඩලය සතුව පවතින බව සභාපතිවරයා විසින් සහතික කළයුතු වේ.
5. වගකීම් පැහැදිලි ලෙස බෙදීගොස් ඇති බව සහතික කළයුතු බව හා බලය හා අධිකාරීත්වය අතර සමතුලිතභාවයක් පවත්වා ගැනීමට සහාය වීම සභාපතිගේ වගකීමකි.

භාරකාර මණ්ඩලයේ භූමිකාව

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල මඟින් ස්ථාපිත අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි හඳුනාගත් දිසානතිය ඔස්සේ ආයතනය ප්‍රගමනාත්මක ලෙස මෙහෙය වීමේ සහ මෙහෙයුම් සාර්ථක ලෙස කළමනාකාරීත්වය වන ලෙස සහතික කිරීමේ වගකීම භාරකාර මණ්ඩලය වෙත පැවරේ. සම්පත් විනිවිද භාවයකින් යුතුව උපයෝගී කර ගැනීම නිවැරදි ගිණුම් තොරතුරු පවත්වා ගැනීම සහ සියලුම ව්‍යවස්ථාපිත නියාමන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි නිවැරදි වාර්තා පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලය විසින් වගකීම දරයි.
පහත කාර්යයන් තහවුරු කිරීම භාරකාර මණ්ඩලයේ වගකීම වේ.

1. ආයතනයේ උපාය මාර්ගවල ඉලක්ක පිහිටුවාගෙන ඇති බව තහවුරු කිරීම.
2. උපාය මාර්ගවල ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මහපෙන්වීම හා නායකත්වය ලබාදීම.
3. ප්‍රධාන නිලධාරියා සහ සේවක කණ්ඩායම් සතුව අවශ්‍ය නිපුණතා දැනුම් හා සක්‍යතා සියල්ල පවතින බව සහතික කිරීම.
4. කාර්යක්ෂම පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
5. ආයතනයේ කළමනාකරණ කාර්යයන් සාර්ථකව අධීක්ෂණය කරන බව සහතික කිරීම.
6. මූල්‍යම ගණුදෙනු සම්බන්ධයෙන් පාර්ශවකරුවන් ලෙස ප්‍රමාණවත් ලෙස වාර්තාකරණය සිදු කරන බව හා අවශ්‍ය හෙළිදරවු කිරීම් කරන බව සහතික කිරීම.
7. සම්පත් හා වත්කම් වගකීම් ලෙස උපකල්පනය කරන බව සහතික කිරීම.
8. භාරකාර මණ්ඩලය විසින් ආයෝජන කමිටුව,විගණන කමිටුව පත්කිරීම හා කටයුතු අධීක්ෂණය
9. පිළිවෙත් හා ආචාර ධර්ම සංග්‍රහයක් ආයතනික පාලන උපාය මාර්ගයක් හඳුන්වාදීම.
10. තම සියලුම කාර්යයන් අදාල ව්‍යවස්ථාපිත විධි විධාන මාර්ගඋපදේශනය හා චක්‍රලේඛ වලට අනුකූලව ඉටුකිරීම භාරකාර මණ්ඩලයේ වගකීමකි.

ආයෝජන හා කළමණාකරන කමිටු රැස්වීම්

භාරකාර මණ්ඩල රැස්වීම් **(Board of Trustees Meeting)**

භාරකාර මණ්ඩල රැස්වීම් වලදී ආයතනික මෙහෙයුම් හා ප්‍රතිඵල අනුමත කරගත් අයවැය හා අදාල ප්‍රමිතීන්ට සාපේක්ෂව ඉතා සූක්ෂම ලෙස නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම භාරකාර මණ්ඩලය විසින් සිදුකරනු ලබයි. මෙහිදී භාරකාර මණ්ඩලය සම්මත න්‍යාය පත්‍රයක් සහ අනෙකුත් සාකච්ඡා කල කාරණා කෙරෙහි අවධානය යොමු කරයි. සියලුම භාරකාර මණ්ඩල රැස්වීම් වාර්තා සභාපතිවරයා විසින් අනුමත කොට සහතික කරයි. භාරකාර මණ්ඩලය මාස 02 කට වරක් රැස්වන අතර, අවශ්‍යතා පැන නැඟුනවිට විශේෂ භාරකාර මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලබේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල දී පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීම් සහ භාරකරුවන්ගේ සහභාගී වූ තොරතුරු පහත පරිදි වේ.

	භාරකරු/භාරකරුවන්	තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන				
			1	2	3	4	5
			(72)	(73)	(74)	(75)	(76)
1	ගරු නලින් පෙරේරා මහතා	අග්‍රවිනිශ්චයකාරතුමා (2019/11)	--	--	--	--	--
2	ගරු ජයන්ත ජයසූරිය මහතා	අග්‍රවිනිශ්චයකාරතුමා (2019/12)	--	--	--	--	--
3	ගරු රාවුල් හකීම් මහතා	නගර නිර්මාණ ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය	√	--	--	√	--
4	ගරු ලකී ජයවර්ධන මැතිතුමා	නගර නිර්මාණ ජල සම්පාදන හා උසස් අධ්‍යාපන වැඩ බලන අමාත්‍ය	--	√	√	--	--
5	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා	උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය	--	--	--	--	√
6	එම්.එම්.පී.කේ. මායාදුන්නේ මහතා	ලේකම්, නගර නිර්මාණ ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	√	√	√	√	--
7	අනුර දිසානායක මහතා	ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	--	--	--	--	√
8	පත්මසිරි ජයමාන්න මහතා	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	√	--	--	--	--
9	එම්.එන්. රණසිංහ මහතා	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	--	√	√	√	--
10	එච්.එම්. චිත්‍රානන්ද මහතා	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	--	--	--	--	√
11	එස්.ටී. කොඩිකාර මහතා	ලේකම්, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	√	√	√	√	--
12	ජී.කේ.එස්.එල්. රාජදාස මහතා	ලේකම්, අභ්‍යන්තර වෙළඳ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	--	--	--	--	√
13	එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර මහතා	පත්කල භාරකරු	√	√	√	√	√
14	වෛද්‍ය ඩී. මැතිව් මහතා	පත්කල භාරකරු	√	--	--	--	--
15	මහාචාර්ය ඒ.එල්.එම්. කාදර් මහතා	පත්කල භාරකරු	--	√	--	--	--
16	ගුලාම් රශීඩ් මහතා	පත්කල භාරකරු	--	--	--	--	√


√ - සහභාගී වූ රැස්වීම් ගනන

-- - භාරකාර මණ්ඩලයෙන් ඉවත් වී ඇත.

ආයෝජන කමිටු රැස්වීම් **(Investment Committee Meeting)**

	නම	තනතුර	නිල තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන			
				1	**2**	**3**	**4**
1	එම්.එම්.පී.කේ. මායාදුන්න මහතා	සභාපති	ලේකම්, නගර නිර්මාණ ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	√	√	√	√
2	එස්.වී.ඩී. කේසරලාල් ගුණසේකර මහතා	සාමාජික	භාරකරු/ මහපොළ අරමුදල	√	√	√	√
3	මංජුල ද සිල්වා මහතා	සාමාජික	ප්‍රධාන විධායක නිළධාරී / රක්ෂණ භාර අරමුදල	√	√	√	√
4	එම්.පී. බණ්ඩාර මහතා	සාමාජික	අධ්‍යක්ෂ / මහපොළ අරමුදල	√	√	√	√

ආයතනික ව්‍යුහය


භාරකාර මණ්ඩලය
පාලක/අධ්‍යක්ෂ (භාරකාර මණ්ඩලය විසින් පත් කරන ලද)
අධ්‍යක්ෂ (ආයෝජන) (1)
අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) (1)
කළමනාකරු/ නි.අ (ව්‍යාපෘති) (1)
සහකාර අධ්‍යක්ෂ /නි.අ (මූල්‍ය) (1)
සහකාර අධ්‍යක්ෂ/නි.අ (පරිපාලන) (1)
අභ්‍යන්තර විගණක (1)
කණිෂ්ඨ කළමනාකරු (1)
කණිෂ්ඨ කළමනාකරු (1)
කළමනාකරණ සහකාර (3)
කළමනාකරණ සහකාර (7)
පොත් තබන්නා (1)
කළමනාකරණ සහකාර (3)
විගණන නිලධාරීන් (3)
රියදුරු (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)
කාර්යාල කාර්ය සහායක (1)

කාර්යය මණ්ඩලය

කාර්යය මණ්ඩලය (2019 සංශෝධිත)

සේවා ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	1	1	
ද්විතීය	6	2	4
තෘතීය	19	8	11
ප්‍රමුඛ	5	2	3
එකතුව	31	13	18

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදල අවම කාර්යය මණ්ඩල පිරිවැයක් දරණ ආයතනයක් ලෙස එහි ආරම්භයේ සිටම ඉතා සීමිත කාර්යය මණ්ඩලයක් මගින් කටයුතු කරන අතර කාර්යය මණ්ඩල පරිපාලන වියදම ආදායමෙන් 0.26% ක් වූ අතර වියදමින් 0.40% වැනි ඉතා අවම මට්ටමක තබා ගත හැකි විය.

කාර්යය මණ්ඩලයෙහි දැනට පවතින ඇබෑර්තු අභ්‍යන්තර උසස් කිරීම් මගින් පිරවීමටත් ඉන්පසු ඇතිවන තනතුරු සඳහා ඇබෑර්තු බාහිර අයදුම්කරුවන්ගෙන් පිරවීමටත් භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.

සමාලෝචිත වර්ශයේදී මහපොළ අරමුලේ කාර්ය මණ්ඩල හා ආයතනයේ ව්‍යුහය පිලිබඳ සමාලෝචනය විෂයභාර අමාත්‍යාංශය වූ නගර නිර්මාණ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කල අතර මහපොළ අරමුදලේ ආයතන ව්‍යුහය හා සිටිය යුතු කාර්ය මණ්ඩලය නිර්දේශ කරන ලදි. එය භාරකාර මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

ඒ අනුව මහපොළ අරමුදලේ පුරප්පාඩු පිරවීමට අදාල පුවත්පත් දැන්වීම විෂයභාර අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට තිබූ අතර 2019.12.31 දින වන විට එය අනුමත කොට නොතිබුණි.

2020 ජනවාරි මස මහපොළ අරමුදලේ කාර්ය මණ්ඩලයේ සියලුම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව මගින් අනුමත කර ගත යුතු බව උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යවරයා විසින් දැනුම් දුන් අතර එයට අදාල ඉල්ලීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. 2020 ජුනි 30 වන විටත් එම තනතුරු සඳහා අනුමැතිය ලැබී නොතිබිණි.

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

සංවර්ධන ලොතරැයි මණ්ඩලය (Development Lotteries Board)

මහපොළ භාර අරමුදලේ රු. මිලියන 2.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජනය කොට ඇති අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිල බලයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙක් පත්වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් උපයන ආදායම ජනාධිපති අරමුදලට කෙලින්ම මාරු කරන අතර ඉන්පසුව මහපොළ අරමුදලට හිමි ලාභ කොටස ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරු කරනු ලැබේ.

2019 වර්ෂයේදී ජනාධිපති අරමුදල සමඟ සාකච්ඡා කොට මහපොළ අරමුදලට සංවර්ධන ලොතරැයියෙන් ලැබිය යුතු මුදල නිශ්චිතව ලබා ගැනීම සඳහා එකඟතාවයක් ඇති කරගත් අතර ඒ අනුව වාර්ෂික ශුද්ධ ආදායමෙන් 50% ක කොටස ජනාධිපති අරමුදල මඟින් මහපොළ අරමුදලට ලබාදීමට එකඟ වන ලදි. වර්තමාන නව රජයේ ප්‍රතිපත්තිය අනුව ශිෂ්‍යත්ව සංඛ්‍යාව වැඩි කිරීම හා ශිෂ්‍යත්වයක වටිනාකම රු.7000/- දක්වා වැඩි කිරීමට තීරණය කල අතර එයට අවශ්‍ය අතිරේක අරමුදල් ලබා ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි ආදායමෙන් 60% මහපොළ අරමුදලට ලබා ගැනීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

සංවර්ධන ලොතරැයි මණ්ඩල 2015 - 2019 ලාභය හා ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරුකරන ලද ලාභ කොටස

වර්ෂය	2015	2016	2017	2018	2019
	රු.(මි)	රු.(මි)	රු.(මි)	රු.(මි)	රු.(මි)
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුද්ධ ලාභය	1678	1836	507	2187	2669
මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කල කොටස	736	767	25*	804	997

* 2017 දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙවිය යුතු බදු වගකීම් සඳහා රුපියල් බිලියන 1.7 ක් ගෙවා ඇත. එම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් අඩු විය. එබැවින් මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කර ඇත්තේ රුපියල් මිලියන 25 ක් පමණි.

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම (NWCL)

මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ හිමිකාරීත්වය යටතේ පවතින නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) හි රුපියල් මිලියන 200 ක් ආයෝජනය කරමින් සීමිත සමාගමක් ලෙස 2003 මාර්තු 23 වන දින සංස්ථාගත කරන ලදී. නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් ආයෝජන කළමණාකරුවෙකු ලෙස කටයුතු කල අතර මහපොළ භාරකාර අරමුදලෙහි ආයෝජන කළඹ අඩු අවදානමකින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ අභිප්‍රායෙන් කළමනාකරණ ගිවිසුමක් යටතේ ලබාදෙන ලදී. එලෙස නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් කළමණාකරනය කරන ලද මහපොළ අරමුදල 2019 වර්ෂයේ ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ඇති මහපොළ ප්‍රධාන ගිණුමට මාරුකරන ලද අතර 2019 පෙබරවාරි 28 වන දින සිට නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ තිබූ අරමුදල් කළමනාකරණ ගිවිසුම අවලංගු කරන ලදී.

නැට් වෙල්ත් සිකියුරිටීස් සමාගම (NWSL)

නැෂනල් වෙලත් සිකියුරිටීස් ලිමිටඩ් සමාගම 2003 ජුනි 23 වන දින සීමිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.මෙම සමාගම විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභා ආඥා පනත යටතේ මෙන්ම දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ හා ශ්‍රී ලංකා මහා බැංකුවේ නියාමනයන්ට අනුව ප්‍රාථමික ගැණුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචි කොට ඇත.

නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් 2004 දී තමන්ගේම අරමුදල් ආයෝජනය කරමින් නැෂනල් වෙලත් සිකියුරිටීස් සමාගම ආරම්භ කර ඇති අතර මෙම සමාගමේ කොටස් ප්‍රාග්ධනය සඳහා වන මුළු ආයෝජනය රු. මිලියන 300 ක් වූ අතර 2016 හා 2017 වර්ෂවල මහපොළ අරමුදල විසින් යෙදවූ රු.මි.685ක අතිරේක ප්‍රාග්ධනය සමග 2019 දෙසැ.31 දිනට සමස්ථ ආයෝජන මුදල රු.බිලි. 1.1ක් දක්වා වැඩි විය.

2014 සිට 2019 දක්වා නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නැෂනල් වෙලත් සිකියුරිටීස් සමාගමෙහි මෙහෙයුම් ප්‍රතිපල

වර්ෂය	ලාභය/අලාභය		මුළු එකතුව රු. (මි)
	නැට්වෙල්ත් කෝපරේෂන් රු.(මි)	නැෂනල් වෙලත් සිකියුරිටීස් රු.(මි)	
2014	60.9	516.6	577.5
2015	112.2	(200.2)	(88.0)
2016	(65.8)	(499.2)	(564.9)
2017	5.7	163.4	169.0
2018	8.9	(242.5)	(233.5)
2019	7.2	224.5	231.7
ශුද්ධ ප්‍රතිඵලය	**129.1**	**(37.4)**	**91.8**

නමුත් 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සමාගමට ලැබූ අලාභය හේතුවෙන් හා සමාගම පවත්වාගෙන යාමට අවශ්‍ය කාරක ප්‍රාග්ධනය හිඟය මත භාණ්ඩාගාර බැදුම්කර වෙන්දේසි සඳහා සහභාගී වීම අවම මට්ටමක පැවතුනි. මෙම කළමනාකරණ දුර්වලතා හේතුවෙන් හා අධ්‍යක්ෂ මණ්ඩලවල වෙනස්වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් NWSL සමාගමේ ප්‍රාථමික ගැනුම්කාර බලපත්‍රය මාස 06 ක් සඳහා තාවකාලිකව අත්හිටුවන ලදි. එය 2019 නොවැම්බර් 30 දක්වා ක්‍රියාත්මක වීම හේතුවෙන් ආයතනයේ ක්‍රියාකාරීත්වය සෘජුවම බලපෑ අතර එමඟින් ආදායම් අහිමිවීමක් ද සිදුවිය.

2018 අගෝස්තු 23 වෙනි දින එවකට විෂය භාර අමාත්‍යවරයා වූ ගරු උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව අනුව NWCL සමාගම සමඟ පැවති ආයෝජන කළමනාකරණ ගිවිසුම අහෝසි කිරීමටත් මහපොළ අරමුදල ලංකා බැංකු මහපොළ ගිණුමට මාරු කිරීමටත් NWSL සමාගම සුදුසු ගැනුම්කරුවෙකු තෝරාගෙන එම සමාගමේ කොටස් විකිණීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව NWSL හි කොටස් විකිණීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කොට තිබුණි.

කෙසේ වෙතත් 2019 නව රජයේ ප්‍රතිපත්තිය අනුව රජය සතු ව්‍යාපාර විකිණීමේ ප්‍රතිපත්තිය නොවන බැවින් NWSL ආයතනය නැවත පවත්වාගෙන යාමට තීරණය කල අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ගරු විෂය භාර අමාත්‍යවරයා විසින් 2012.12.31 දින ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2020 ජුනි 30 වන විටත් ලැබී නොතිබිණි.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)

කොළඹ දිස්ත්‍රික්කයේ මාලඹේ පිහිටි අක්කර 25ක ඉඩම තුල SLIIT නමින් තොරතුරු තාක්ෂණය පිළිබඳ ආයතනයක් ආරම්භ කිරීම සඳහා මහපොළ භාරකාර මණ්ඩලයේ භාරකරුවන් විසින් අවසර ලබා දෙන ලදී. එහි තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ශාස්ත්‍රපති උපාධි, ඩිප්ලෝමා සහ පාඨමාලා පවත්වනු ලබයි. මූලික අධ්‍යරේඳී පහත පාඨමාලා යෝජනා කරන ලදී.

- විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ උපාධිය
- තොරතුරු තාක්ෂණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා
- විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ උපාධිය - පරිවර්තන පාඨමාලා
- තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ඩිප්ලෝමා
- තොරතුරු තාක්ෂණ අලෙවිකරණය ආශ්‍රිත ඩිප්ලෝමා
- සහතිකපත්‍ර මට්ටමේ කෙටිකාලීන පාඨමාලා

ඒ අනුව, තොරතුරු තාක්ෂණ ආයතනයට අවශ්‍ය යටිතල පහසුකම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 1999 දී රු.මි. 500 ක් ආයෝජනය කිරීමට මහපොළ භාරකාර මණ්ඩලයේ භාරකරුවන් තීරණය කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පිහිටුවන ලදී.

අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය 2000 ජනවාරි කොල්ලුපිටියේ BOC මර්චන්ට් ටවර් ගොඩනැගිල්ලේදී සිසුන් 400 කගේ සහභාගීත්වයෙන් පිහිටුවන ලදී.

වර්තමානයේ එය උපාධි අපේක්ෂකයන්ට හා පශ්චාත් උපාධි අපේක්ෂකයන් 7000කට වඩා වැඩි පිරිසක් පාඨමාලාවන් සාර්ථකව නිම කරන අතර ජාත්‍යන්තර සිසුන්ද මේ සඳහා ඇතුලත් වී ඇත. 9000 කට අධික විද්‍යාර්ථයින් ව්‍යාපාර, පරිගණක හා ඉංජිනේරු පීඨයන්හි උපාධි ලබා ඇත.

තවදුරටත්, SLIIT විසින් ප්‍රමුඛ පෙළේ බහුජාතික සමාගම් හා ශ්‍රී ලාංකික ආයතන සඳහා කාර්මික සීමාවාසික පුහුණුව සඳහා සිසුන් යොමු කරනු ලබයි. එහිදී, ඔවුන්ගේ වෘත්තීය පුද්ගල විශේෂතා වර්ධනය කිරීම හා ඔවුන් ලබා ගන්නා දැනුම ප්‍රයෝගිකව භාවිතය සඳහා අවස්ථාව උදාකර දෙනු ලැබේ.

කළමණාකරනය පැවරීමේ ගිවිසුමේ අඩුපාඩු හා කෝප් කමිටුවේ නිරීක්ෂණ

2015 වර්ෂයේදී SLIIT ආයතනය හා මහපොළ අරමුදල අතර බදු ගිවිසුමක් හා වත්කම් පැවරීමේ ගිවිසුමකට එළඹ ඇති අතර වාර්ෂිකව රු. මිලියන 20 ක් බදු කුලී වශයෙන් SLIIT ආයතනය මහපොළ අරමුදල වෙත ගෙවීමට එකඟ විය. මෙම ගිවිසුම සම්බන්ධව මහපොළ භාර අරමුදලේ නිසි අනුමැතිය ලැබී නොමැති බව දැක්වෙන අතර ඒ සම්බන්ධව වංචා හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන සිදු කල අතර එම විමර්ශන වල අවසන් වාර්තා 2019 වර්ෂයේ හිටපු ජනාධිපතිතුමා වෙත භාරදී ඇති අතර ඒ සම්බන්ධව මහපොළ අරමුදල දැනුවත් කොට නැත. SLIIT ආයතනය සම්බන්ධව විශේෂ විගණනනයක් විගණකාධිපතිවරයා විසින් සිදුකල අතර එම වාර්තාව 2019 ජූලි 12 වෙනි දින මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සම්බන්දව පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදි, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්යත්ව භාර අරමුදලේ ආයෝජන කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද ඉහත විශේෂ විගණන වාර්තාවේ පෙන්වා දි ඇති කරුණු සලකා බලා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සාමගම සම්බන්දයෙන් ඉදිරියේදි ගත යුතු පියවරයන් සම්බන්ධ වාර්තාවක් මසක් ඇතුලත පොදු ව්‍යාපාර පිළිබඳ කාරාක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස විශයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වන ලදී. ඒ අනුව කෝප් කමිටුව වෙත ලබාදුන් නිරීක්ෂන හා නිර්දේශ පහත පරිදි වේ.

විෂය භාර අමාත්‍යාංශ ලේකම් වරයාගේ නිරීක්ෂණ

- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල 1981 අංක 66 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කොට ඇත. 1998 දි අභ්‍යන්තර හා අන්තර් ජාතික වාණිජ කටයුතු හා ආහාර අමාත්‍යාංශයේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ එක්ව ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට ලද අනුමැතිය මගින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ මහපොල අරමුදලට අයත් මාලබේ පිහිටි අක්කර 25ක භූමි භාගයක් තුළ මහපොළ අරමුදලින් රු. මි. 373.5ක මූලික ආයෝජනයක් ලෙස යොදා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම අරම්භ කරන ලදි.

- එම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම පරිපාලනය හා කළමනාකාරණය සඳහා 2003 වර්ෂයේ හා 2005 වර්ෂයේ කලමනාකරණ ගිවිසුම් 02ට එළඹී ඇත. එහිදි මෙම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම මහපොළ භාර අරමුදලට අයත් වත්කමක් බව පැහැදිලිව දක්වා ඇත.

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල හා මාලබේ පිහිටි ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම අතර වත්කම් වල අයිතිය පැවරීමේ ගිවිසුමක් හා දීර්ඝ කාලීන බදු ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා වන යෝජනා පත්‍රිකාවක් 2015.04.29 දින පැවති 56 වන භාරකාර මණ්ඩල රැස්වීමට (භාරකාර මණ්ඩල පත්‍රිකා 56.10) ඉදිරිපත් කර ඇත.

- එයට අදාල වත්කම් පැවරීමේ ගිවිසුමේ කෙටුම්පතක් හෝ බදු ගිවිසුමේ කෙටුම්පතක් භාරකාර මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැති අතර, ගිවිසුම් වලට අදාල වත්කම් තක්සේරු කිරීම රජයේ තක්සේරු දෙපාර්තුමේනතු මගින් සිදු කර නොමැති අතර ඉහත 01 ඡේදයේ මහපොළ අරමුදලින් ආයෝජිත මුදල වන රු.මි. 373.5ක මුදල ණය මුදලක් වශයෙන් සලකා යම් පොළි ප්‍රතිශතයක් යටතේ පොළි ගණනය කොට රු.මි. 408.50 අවසාන ගෙවීමක් වශයෙන් මහපොළ භාර අරමුදලට ගෙවා වත්කම් වල අයිතිය අත්හැරීමට එම ගිවිසුම් වල එකඟ වී ඇත. නමුත් මෙම රු. මිලියන 408.5ක මුදල මහපොළ භාර අරමුලට ආපසු ගෙවීමට භාවිත කොට ඇත්තේ මහපොළ භාර අරමුදලට SLIIT ආයතනය විසින් බැර කර යුතුව තිබූ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමේ මෙතෙක් පැවති අතිරික්ත ලාභ කොටස් බව නිරීක්ෂණය කරමි.

- එම ගිවිසුම් 02භාර කාර මණ්ඩලයේ අනුමැතියකින් තොර වූ ගිවිසුම් වේ. තවද මෙම ගිවිසුම් වලට එළඹීමට හා අත්සන් කිරීමට අත්සන්කරුවන්ට නිසි බලයක් ලබා දීමට භාරකාර මණ්ඩලයෙන් අනුමැතිය නොමැත.

- 2015 මැයි 12 වන දින මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම අතර එකඟතා ගිවිසුම් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය විසින් අත්සන් කර ඇති බව නිරීක්ෂණය වේ.

- අතිගරු ජනාධිපතිතුමා විසින් 2017 මැයි මස 04 වන දින ඉදිරිපත් කරන ලද සිඑස් /1/37/3 අංක දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් යම් තොරතුරු නිවැරදි නොවන බව නිරීක්ෂණය කරමි. එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් මාලබේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම රාජ්‍ය අංශයට අයත් නොවන ස්වාධීන හා ස්වෛරී ආයතනයක් ලෙස පිළිගැනීමටත්, එම ආයතනය කිසිම අමාත්‍යාංශයක් යටතට නොගැනෙන ලෙසත් කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා ඇත.

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

- මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරන අවස්ථාව වන විට ආචාර්ය වික්‍රමසේන විරිසුරය මහතා ජනාධිපති උපදේශක ලෙස කටයුතු කර ඇති බවත්, ඉහත 2015.05.12 දිනැතිව එළඹ තිබූ ගිවිසුමේ අඩංගු කරුණු මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ ඇතුලත්ව ඇති බව නිරීක්ෂණය කරමි. තවද, අතිගරු ජනාධිපති තුමන් වෙත සාවද්‍ය තොරතුරු අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් ඉදිරිපත් කොට ඇති බැවු නිරීක්ෂණය කරමි.

- තවද, මහපොළ භාරකාර අරමුදල එම අවස්ථාවේදි සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යාන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ තිබූ නමුත්, එම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා විෂයභාර අමාත්‍යාංශය වූ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යාන්තර වෙළඳ අමාත්‍යාංශයේ නිරීක්ෂණ කැඳවා නොතිබූ බවද නිරීක්ෂණය කරමි.

- එමෙන්ම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ අමාත්‍ය මණ්ඩල තිරණය ක්‍රියාකලයුතු ආයතනයක් ලෙස සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යාන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත පිටපත් යොමු කර නැති බව නිරීක්ෂණය කරමි.

- 2017 ජුලි මස 06 වන දින අංක :2026/35 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ යටතේ ගැසට් කර තිබූ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම 2017 මැයි මස 16 වැනි දින සිට කිසිදු අමාත්‍යාංශයක් යටතට නොගැනෙන බව නිවේදනය කර ඇත.

- නමුත් එමගින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමේ අයිතියට බලපැමක් නොවන බව නිරීක්ෂණය වේ.

- මහපොළ භාරය මෙරට දරුවන්ගේ නිදහස් අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරිම සඳහා ගොඩ නගන ලද්දක් වන අතර මෙම ක්‍රියාවලිය තුලින් මහපොළ භාර අරමුදල සඳහා අගතියක් සිදු වී ඇති බව නිරීක්ෂණය කරමි.

- 1989 ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කරන අවස්ථාවේ එහි ආරම්භක අධ්‍යක්ෂකවරු ලෙස පහත සඳහන් රාජ්‍ය ආයතන වල නිල තනතුරු හෙබවූ පුද්ගලයන් වශයෙන් පත් කොට ඇත.

    - ලේකම්, දේශිය හා අන්තර්ජාතික වෙළඳ අමාත්‍යාංශය - ඇන්ටන් ඇල්ෆඩ් මහතා
    - උපකුලපති මොරටුව විශ්ව විද්‍යාලය - මාහාචාර්ය සමරජීව කරුණාරත්න මහතා
    - පීඨාධිපති මොරටුව විශ්ව විද්‍යාලය - මාහාචාර්ය ලක්ෂමන් රත්නායක් මහතා
    - සභාපති ආයෝජන මණ්ඩලය - තිලාන් මහජිත් විජේසිංහ මහතා
    - උපදේශක දේශිය හා අන්තර් ජාතික වෙළඳ අමාත්‍යාංශය - ඊ.පී.ජී. නන්දසිරි ලිලාරත්න මහතා.
    - අධ්‍යක්ෂ, පරිගණක සේවා අංශය මොරටුව විශ්ව විද්‍යාලය - ආචාර්ය ගමගේ ලලිත් දිප්ති කුමාර මහතා
    - සභාපති අපනයන සංවර්ධන මණ්ඩලය - රොනාල්ඩ් අමාන්ඩ් පෝල් ගුණතිලක මහතා
    - නියෝජ්‍ය අධ්‍යක්ෂ මහපොළ භාරකාර අරමුදල - රංජිත් තෙනුවරද සිල්වා මහතා
    - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති - මාහාචාර්ය එස්. තිලකරත්න මහතා

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

2014 දෙසැම්බර් මස වන විට ඉහත නිළ තනතුරු හෙබ වූ සාමාජිකයන් අතරින් ලාල් ගුණසේකර (භාරකරු), රංජිත් තේනුවර මහතා (අධ්‍යක්ෂ මහපොළ අරමුදල) හා සුනිල් ජයන්ත නවර්තන මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්) අධ්‍යක්ෂක වරුන් ලෙස සිටි අතර ඔවුන් සියලු දෙනාම 2015 ගිවිසුමට එළඹෙන අවස්තාව වන විට භාරකාර මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් ඉවත් කොට තිබුණි.

ආරම්භයේදි නිල වශයෙන් පත් වූ ඉහත සාමාජිකයින්ගෙන් පහත සඳහන් අය එකි නිල තත්වයන් අවසන් වුවද, වර්තමානයේ පුද්ගල නාමයෙන් ඇපයෙන් සිමිත සමාගමේ අධ්‍යක්ෂණකවරුන් ලෙස පත් වී තිබීම නිරීක්ෂණය කරමි.

- තිලාන් මහජිත් විජේසිංහ මහතා
- මාහාචාර්ය ලක්ෂමන් රත්නායක් මහතා
- ආචාර්ය ගමගේ ලලිත් දිප්ති කුමාර මහතා

නිර්දේශ

- අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කල අංක ; සිඑස්/1/37/3 දරණ 2017 මැයි 04 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය එවකට සිටි ජනාධිපති උපදේශක හා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සාමාජිකයෙකු වන ආචාර්ය වික්‍රමසේන විරසූරිය මහතා විසින් සාවද්‍ය ලෙස ඉදිරිපත් කල කරුණු පදනම්ව සකසා ඇති බව නිරීක්ෂණය වන බැවින්, එයට අදාල අංක ;අමප/17/0956/701/0II හා 2017 මැයි 27 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණය ඉවත් කර දෙන ලෙස ජනාධිපති ලේකම් මගින් අතිගරු ජනාධිපතිතුමා වෙත දැනුම් දීම.

- මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට අයත් මාලබේ පිහිටි ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සිමිත සමාගමේ වත්කම් සම්බන්ධව තිරණ ගැනීමේ ස්වාධින අයිතිය එහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරමින් 2015 මැයි 12 දින එළඹී වත්කම් පැවරීමේ ගිවිසුම හා දිර්ඝ කාලීන බදු ගිවිසුම සම්බන්ධයෙන් නිතිමය පියවර ගැනිම.

- එකි ගිවිසුම නිත්‍යානුකුල අවසරයක් නොලබා අත්සන් කරන ලද ගිවිසුම් වලට එළඹීමට කටයුතු කොට ඇත. එවකට මහපොළ භාරකාර මණ්ඩල සාමාජික අනිල් මන්ත්‍රි පත්මදේව රාජකරුණා මහතා ඇතුලු ඊට අනුබල දි ඇති සියලු පාර්ශවයන්ට එරහිව නිත්‍යානුකුල පියවර ගැනිම.

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

- 2015ට පෙර පැවති නිල නියෝජිතයන්ගෙන් පිහිටි ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමේ සැදුම් ලත් අධ්‍යක්ෂණක මණ්ඩලය නැවත ස්ථාපිත කිරීම සහ එම පාලක මණ්ඩලය පහත සඳහන් රජයේ නිළධාරීන්ගෙන් සමන්විත විම සුදුසු බව නිර්දේශ කරමි.

    - උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
    - ජනාධිපති කාර්යාලයේ අතිරේක ලේකම් තනතුරට නොඅඩු තනතුරක නිළධාරියෙක්
    - මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වරයෙකු
    - මහපොළ උසස් අධ්‍යාපන භාරකාර මණ්ජලයේ සාමාජිකයන් දෙදෙනෙකු
    - උපකුලපති මොරටුව විශ්ව විද්‍යාලය
    - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙක්

- උක්ත පාලක මණ්ඩලය ස්ථාපිත කිරීමෙන් අනතුරුව එකි පාලක මණ්ඩලය මගින් පිහිටි ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම සඳහා සුදුසු නෛතික රාමුවක් කෙටුම්පත් කිරීමටත් එමගින් එම ආයතනය පුර්ණ රාජ්‍ය අයිතිය සහිත සමාගමක් බවට පත් කිරීම.

අත්සන් කලේ,
එම්. එම්. පි. කේ. මායාදුන්නේ,
ලේකම්,
නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.
මහපොළ විශයභාර අමාත්‍යාංශයේ ලේකම්, මහපොළ භාර අරමුදලේ නිල භාරනරු හා ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා.

ක්‍රියාකාරී සැලැස්ම

2020

ගරු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් මහපොළ අරමුදල රු.බි.10 සිට රු.බි.20 දක්වා වැඩි කිරීම හා ශිෂ්‍යාසයක වටිනාකම රු.7,000/- දක්වා වැඩි කිරීමට අදාලව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම.

උපාය මාර්ගික අරමුණු (Strategies)

අරමුණු 1 මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල සතු අරමුදල් වඩාත් ඵලදායි හා විශ්වාසනීය ලෙස මූල්‍ය වෙළඳපොළ තුළ ආයෝජනය කිරීමෙන් වැඩි ආදායම් උපයා ගැනීම.

අරමුණු 2 සංවර්ධන ලොතරැයිය මඟින් දැනට මහපොළ අරමුදලට ලැබෙන ආදායම් 60% දක්වා වැඩි කිරීම මඟින් අමතර ආදායමක් උපයා ගැනීම. (දැනට 50% ක් මහපොළ අරමුදල සඳහා සහ 50% ක් ජනාධිපති අරමුදලට වෙන් කරනු ලබයි.)

අරමුණු 3 මොබිටෙල් ආයතනය සමඟ එක්ව මහපොළ බොනැන්සා වැඩ පිළිවෙලක් දියත් කිරීම හරහා නව ආදායම් ක්‍රමයක් හඳුන්වාදීම මඟින් අමතර ආදායමක් ඉපයීම.

අරමුණු 4 සංවර්ධන ලොතරැයි මඟින් මහපොළ විශේෂ ඉලෙක්ට්‍රොනික් ලොතරැයියක් (Online Lottery) හඳුන්වා දී විශ්ව විද්‍යාල ආචාර්යවරු,ශිෂ්‍යයන් හා මහජනතාව එක්කර ගැනීමෙන් අලෙවිය පුළුල් කිරීම සඳහා වූ විශේෂ වැඩසටහනක් දියත් කිරීම මඟින් අමතර ආදායමක් උපයා ගැනීම මඟින් අරමුදල වර්ධනය කිරීම.

අරමුණු 5 දිවයිනේ ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය මඟින් දැනට ගාස්තු අයකරනු ලබන පාඨමාලා හා උපදේශක වැඩ සටහන් මඟින් උපයාගෙන ඇති හා උපයා ගන්නා අරමුදල් වලින් 25% ක් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ප්‍රේෂණය කිරීම මඟින් අමතර ප්‍රාග්ධනයක් උපයා ගැනීම.

අරමුණු 6 කොටස් වෙළඳපොල ආශ්‍රිතව සිදුකරන ආයෝජන මඟින් මේ වන විට මහපොළ අරමුදල වෙතින් වංචාකාර ඇති රු.බි.1.7කට ආසන්න මුදල නීතිමය ක්‍රියාමාර්ග ගෙන ආපසු අය කර ගැනීම මඟින් ප්‍රාග්ධනය වර්ධනය කිරීම.

අරමුණු 7 මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ වත්කමක් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) වාර්ෂික වෙළඳ පිරිවැටුපෙන් 10% ක මාසික පදනමින් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ප්‍රේෂණය කිරීම මඟින් අරමුදලේ ප්‍රාග්ධනය වර්ධනය කිරීම.

අරමුණු 8 දේශීය විදේශීය රැකියාවල නිරතවී ඇති ලක්ෂ 3කට අධික මහපොළ ශිෂ්‍යත්වලාභීන් ඉලක්කකර දියත් කෙරෙන විශේෂ අරමුදල් ප්‍රවර්ධන වැඩ සටහනක් මඟින් අරමුදලේ ප්‍රාග්ධනය වර්ධනය කිරීම.

අරමුණු 9 උසස් අධ්‍යාපන වරම් ලබන මෙරට අඩු ආදායම්ලාභී පවුල්වල සිසු දරුවන් සඳහා උපකාර කිරීමට ඉදිරිපත් වන දානපතීන් හා සුභපතන්නන් ඉලක්ක කරගෙන වැඩ සටහනක් මඟින් අරමුදලේ ප්‍රාග්ධනය වර්ධනය කිරීම.

ක්‍රියාකාරී සැලැස්ම 2020

උපාය මාර්ගික අරමුණු 1

මහපොළ ශිෂ්‍යාඩ භාර අරමුදල සතු අරමුදල් වඩාත් ඵලදායි හා විශ්වාසනීය ලෙස මූල්‍ය වෙළඳපොළ තුළ ආයෝජනය කිරීමෙන් වැඩි ආදායම් උපයා ගැනීම.

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග තෝරාගනු ඇත. 1) මහපොළ අරමුදල සතු අරමුදල් සියල්ල හඳුනා ගැනීම. 2) ප්‍රධාන අරමුදල රු.බි.10.5 අ) ප්‍රධාන අරමුදල කළමනාකරණය කිරීම සඳහා අරමුදල් කළමනාකරණය පිළිබඳ විශේෂ දැනුම ඇති කළමනාකරණ මණ්ඩලයක් (Investment Committee) මහපොළ අරමුදල විසින් දැනටමත් පත්කොට ඇති අතර එමඟින් අරමුදලේ සියලුම ආයෝජන අනුමත කිරීම සිදු කරනු ලැබේ. (ආ) අරමුදලේ කාර්ය මණ්ඩලය වැඩි කිරීම සඳහා හා ආයෝජන සම්බන්ධයෙන් විශේෂඥ දැනුම ඇති කළමනාකරුවෙකු මහපොළ අරමුදල සඳහා බඳවා ගැනීමට කටයුතු කිරීම.	1) මහපොළ ආයෝජන කමිටුව පත්කිරීම හා ඒ සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති සමාජිකයින් පත් කිරීම.	මාසිකව ආයෝජන කමිටුව රැස්වන අතර එමඟින් අවශ්‍ය තීරණ ගනු ලැබේ.
	2) එදිනෙදා ආයෝජන කටයුතු සඳහා ආයෝජන උප කමිටුවක් පත් කිරීම.	ආයෝජන උප කමිටුව පත්කොට ඇති අතර අදාල සියලුම ආයෝජන එම කමිටුවේ අධීක්ෂණය යටතේ සිදු කිරීම.
	3) මහපොළ අරමුදල සඳහා ආයෝජන කටයුතු කළමනාකරණය සඳහා පළපුරුදු කළමනාකරුවෙකු පත් කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම.	2020 සැප්තැම්බර් මස අවසන් වීමට ප්‍රථම මහපොළ අරමුදලේ සියලු සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. (අනුමැතිය සඳහා DMS වෙත යවා ඇත.)
(ඇ) මහපොළ අරමුදල යටතේ පිහිටුවා ඇති උප සමාගම් වන NWCL හා මහබැංකුවේ ප්‍රාථමික ගැනුම්කරුවෙකු වන NWSL සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ එම සමාගම්වල කොටස් වෙළඳපොළ වටිනාකම් මත සුදුසු ආයෝජකයෙකුට පැවරීම තුළින් ලබා ගන්නා අරමුදල් මහපොළ අරමුදල යටතේ ආයෝජනය කිරීම. මෙහිදී ඉදිරියේදී මූල්‍ය වෙළඳපොලේ සිදුවිය හැකි අවපාතයන් සැලකිල්ලට ගෙන මහපොළ අරමුදලට සිදුව ඇති අලාභ අවම කිරීම හා සේවක පිරිවැය අවම කිරීම තුළින් අරමුදල ආරක්ෂා කිරීම.	4) NWCL හා NWSL ආයතනවල වර්තමාන වටිනාකම ගණනය කිරීම සඳහා විගණනයක් සිදුකිරීම. (Due diligence Audit)	E & Y විගණන ආයතනය Due diligence විගණනය සඳහා පත්කොට ඇති අතර 2020 ජූලි මස එම විගණන වාර්තා ලබාදීමට නියමිතය.
	5) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව NWSL සමාගම විකිණීමට අදාල තීරණය ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කොට ලබා ගැනීම.	NWSL කොටස් විකිණීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කොට ඇති අතර 2020 ජූලි මස වන විට එය අවසන් කල හැකිය.

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

උපාය මාර්ගික අරමුණු 2

සංවර්ධන ලොතරැයිය මඟින් දැනට මහපොළ අරමුදලට ලැබෙන ආදායම් 60% දක්වා වැඩි කිරීම මඟින් අමතර ආදායමක් උපයා ගැනීම.(දැනට 50% ක් මහපොළ අරමුදල සඳහා සහ 50% ක් ජනාධිපති අරමුදලට වෙන් කරනු ලබයි.)

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
1) සංවර්ධන ලොතරැයියේ ලාභයෙන් 60% ක් මහපොළ අරමුදලට ලබා ගැනීම සඳහා දැනටමත් සාකච්ඡා කොට ඇති අතර එම ලාභ කොටස සෘජුවම මහපොළ අරමුදලට මාසිකව ලබා ගැනීමට අදාලව 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත සංශෝධනය කිරීම.	1) ජනාධිපති අරමුදල සමඟ මූලික සාකච්ඡා පවත්වා ඇති අතර මේ සම්බන්ධව සංවර්ධන ලොතරැයි පනත සංශෝධනය කිරීමට අදාල කෙටුම්පත සකස් කරමින් පවතී.	2020 ජූලි අවසන් වන විට පනත සංශෝධනයට අදාල කෙටුම්පත් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කල හැකිය.
2) ලොතරැයි අලෙවිය ප්‍රවර්ධනය කිරීම සඳහා මහපොළ නමින් මුද්‍රිත ලොතරැයියක් ආරම්භ කිරීම. 3) ලොතරැයි අලෙවිය ප්‍රවර්ධනය කිරීම සඳහා ලංකාවේ පිහිටි සියලුම සුපිරි වෙළඳසැල් හා සතොස වෙළඳසැල් සඳහා ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කිරීම හා එම සුපිරි වෙළඳසැල් ලොතරැයි නියෝජිත ආයතන වශයෙන් පත්කිරීම. 4) සුපිරි වෙළඳසැල් මඟින් ටිකට්පත් අලෙවි කිරීම සඳහා සෘජු ගෙවීම් (Card payments) හරහා ලොතරැයිපත් මිලදී ගැනීමට සැලැස්වීම.	මෙම උපාය මාර්ග සාක්ෂාත් කර ගැනීම සඳහා මහපොළ අරමුදල,ආයොජන කමිටුව හා එකී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීම හා අදාල සියලු පාර්ශව සමඟ සාකච්ඡා කොට අවසන් උපායමාර්ගික සැලසුම සකස් කිරීම.	2020 ජූලි මස මෙම කමිටුව පත්කල හැකි අතර කමිටු වාර්තාව 2020 සැප්තැම්බර් මස අවසන් කලහැකිය. ඒ අනුව ක්‍රියාත්මක කිරීම 2020 සැප්තැම්බර් සිට සිදුකල හැකිය.

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

උපාය මාර්ගික අරමුණු 3

මොබිටෙල් ආයතනය සමඟ එක්ව මහපොළ බොනැන්සා වැඩ පිළිවෙලක් දියත් කිරීම හරහා නව ආදායම් ක්‍රමයක් හඳුන්වාදීම මඟින් අමතර ආදායමක් ඉපයීම.

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
මහපොළ නම ප්‍රචලිත කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල් හා ඩයලොග් ටෙලිකොම් සමාගම් එක්ව මහපොළ බොනැන්සා ලොතරැයිපතක් අලෙවි කිරීම මඟින් මහපොළ සන්නාමය ප්‍රචලිත කිරීම.	සංවර්ධන ලොතරැයිය යටතේ මහපොළ මුද්‍රිත ලොතරැයිය ආරම්භ කිරීම සඳහා පත්කරන ලද කමිටුව යටතේම මෙම කාර්යය සඳහා ද අදාල සැලසුම සකස් කිරීම.	2020 ජූලි මස අවසන් කලහැකි අතර 2020 සැප්තැම්බර් සිට ක්‍රියාත්මක කලහැක.

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

උපාය මාර්ගික අරමුණු 4

සංවර්ධන ලොතරැයි මඟින් මහපොළ විශේෂ ඉලෙක්ට්‍රොනික් ලොතරැයියක් (Online Lottery) හඳුන්වා දී විශ්ව විද්‍යාල ආචාර්යවරු,ශිෂ්‍යයන් හා මහජනතාව එක්කර ගැනීමෙන් අලෙවිය පුළුල් කිරීම සඳහා වූ විශේෂ වැඩසටහනක් දියත් කිරීම මඟින් අමතර ආදායමක් උපයා ගැනීම මඟින් අරමුදල වර්ධනය කිරීම.

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
1) ශ්‍රී ලංකා ටෙලිකොම්,මොබිටෙල් සහ ඩයලොග් ආයතන ලොතරැයි අලෙවි නියෝජිතයන් ලෙස පත් කිරීම. 2) Online ලොතරැයි පවත්වාගෙන යාම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය යටතේ වෙනමම පරිගණකගත ඒකකයක් පිහිටුවීම හෝ භාහිර ලොතරැයි ක්‍රියාකරුවෙකුගේ සහාය ලබා ගැනීම. 3) මූලික ප්‍රාග්ධන ආයෝජනය මහපොළ අරමුදල හා ජනාධිපති අරමුදල එක්ව සිදු කිරීම.	1) සංවර්ධන ලොතරැයිය හා මහපොළ අරමුදල එක්ව ප්‍රසම්පාදන කමිටුවක් පත්කොට අදාල ප්‍රසම්පාදනය සිදු කිරීම. 2) මූලික ප්‍රාග්ධනය යෙදවීම සඳහා මහපොළ භාරකාර අරමුදලේ අනුමැතිය ලබා ගැනීම හා අවශ්‍ය ගිවිසුම සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමඟ අත්සන් කිරීම.	2020 සැප්තැම්බර් මස අවසන් කලහැක. 2020 ජූලි සිට 2020 සැප්තැම්බර් දක්වා පරිගණක පද්ධති සකස් කිරීම හා 2020 ඔක්තොම්බර් සිට ක්‍රියාත්මක කිරීම.

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

උපාය මාර්ගික අරමුණු 5

දිවයිනේ ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය මඟින් දැනට ගාස්තු අයකරනු ලබන පාඨමාලා හා උපදේශක වැඩ සටහන් මඟින් උපයාගෙන ඇති හා උපයා ගන්නා අරමුදල් වලින් 25% ක් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ප්‍රේෂණය කිරීම මඟින් අමතර ප්‍රාග්ධනයක් උපයා ගැනීම.

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
1) දිවයිනේ සියලුම විශ්ව විද්‍යාල ආවරණය වන පරිදි ඒ ඒ විශ්ව විද්‍යාල උපයා ගන්නා ලද ආදායම් වලින් 25% ක ප්‍රතිශතයක් මහපොළ අරමුදලට ලබා ගැනීම සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල උපකුලපතිවරුන් හා පාලන අධිකාරිය සමඟ සාකච්ඡා කිරීම මඟින් එකඟතාවයක් ඇති කර ගැනීම.	1) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරියෙකු හා මහා භාණ්ඩාගාර නිලධාරියෙකු සමඟ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු හා ඒ ඒ විශ්ව විද්‍යාල නියෝජනය කිරීම සඳහා අදාල පාලන මණ්ඩල සාමාජිකයෙකු ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීම.	2020 ජූලි මස කමිටුව පත් කිරීම හා එය ආරම්භ කිරීමේ කමිටු වාර්තාව 2020 ජූලි මස ලබාදිය යුතුය.
2) ඉහත සාකච්ඡාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා සියලුම විශ්ව විද්‍යාල ඒකාබද්ධව පැවැත්වීම.	2) ඉහත කමිටුවේ වාර්තාව සඳහා සියලුම විශ්ව විද්‍යාලවල හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම.	2020 අගෝස්තු මස මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම හා 2020 සැප්තැම්බර්, භාණ්ඩාගාර චක්‍රලේඛය නිකුත් කර ගැනීම.

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

ක්‍රියාකාරී සැලැස්ම 2020

උපාය මාර්ගික අරමුණු 6

කොටස් වෙළඳපොල ආශ්‍රිතව සිදුකරන ආයෝජන මඟින් මේ වන විට මහපොළ අරමුදල වෙතින් වංචාකාර ඇති රු.බි.1.7කට ආසන්න මුදල නීතිමය ක්‍රියාමාර්ග ගෙන ආපසු අය කර ගැනීම මඟින් ප්‍රාග්ධනය වර්ධනය කිරීම.

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
1) පොලිස් අපරාධ විමර්ශණ කොට්ඨාශය වෙත දැනට පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඇති අතර අදාල විමර්ශන කඩිනම් කිරීම. 2) ඒ සම්බන්ධයෙන් චෝදනාවක් කිරීම තුළින් නිශ්චිතව අලාභය තක්සේරු කිරීම. 3) එසේ වංචාවක් සිදු වී ඇති බව අනාවරණය වූ විට අදාල මුදල් අය කර ගැනීම සඳහා නඩු පැවරීම.	1) චෝදනාවක් සිදු කිරීම සඳහා විගණන ආයතනය දැනටමත් භාර දී ඇත. එම වාර්තාව මාස 02 ක් ඇතුළත ලබාගැනීමට බවට එකඟ වී ඇත. අවසන් වාර්තාව covid 19 වසංගත තත්වය නිසා ප්‍රමාදවී ඇති අතර ඉදිරි මාස දෙක ඇතුලත එය අවසන් කොට වාර්තාව නිකුත් කිරීමට එකඟවී ඇත.	2020 සැප්තැම්බර් මස විගණන වාර්තාව CID වෙත භාරදීමට නියමිතය. එම වාර්තාව මත ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

ක්‍රියාකාරී සැලැස්ම 2020

උපාය මාර්ගික අරමුණු 7

මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ වත්කමක් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) වාර්ෂික වෙළඳ පිරිවැටුවෙන් 10% ක මාසික පදනම්න් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ප්‍රේෂණය කිරීම මඟින් අරමුදලේ ප්‍රාග්ධනය වර්ධනය කිරීම.

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
1) අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව (SLIIT) ආයතනයේ වාර්ෂික පිරිවැටුවෙන් 10% ක් මහපොළ අරමුදල වෙත බැර කිරීමට අදාල ඉල්ලීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා SLIIT වෙත සිදු කිරීම.	1) අමාත්‍ය මණ්ඩල අනුමැතියේ පිටපත් SLIIT ආයතනය වෙත උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා යැවීමට කටයුතු සිදු කිරීම. අදාල කෙටුම්පත් ලිපිය දැනටමත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කොට ඇත.	2020 ජූලි මස අදාල ඉල්ලීම ඉදිරිපත් කලහැක. 2020 සැප්තැම්බර් සිට ක්‍රියාත්මක කලහැක.
2) SLIIT හි ආදායම ගණනය කිරීමට අදාල එහි දැනට ආරම්භ කොට ඇති සියලුම පාඨමාලා පිළිබඳ හා එහි ඉගෙනුම ලබන සියලුම සිසුන් ශාඛාවල ඇතුළුව හා ගාස්තු සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ලබාගැනීම සඳහා වන ඉල්ලීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා SLIIT ආයතනය වෙත යොමු කොට වාර්ෂික දළ ආදායම් ඇස්තමේන්තුවක් ලබා ගැනීම.	2) SLIIT ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පූර්ණ විගණනයක් සිදු කිරීමට රජයේ විගණන ආයතනය වෙත භාරදීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා සිදු කිරීම. (2018.12.31SLIIT සම්බන්ධව විගණනයන් විසඳුකාධිපති විසින් සිදුකොට අවසන් වාර්තාව පාර්ලිමේන්තුව වෙත (COPE) ඉදිරිපත් කොට පරීක්ෂාවට භාජනය කොට ඇත.	2020 ජූලි ආරම්භ කොට 2020 සැප්තැම්බර් අවසන් කළයුතුය.
3) වාර්ෂික ආදායම විනිශ්චය කර ගැනීම සඳහා පසුගිය වර්ෂ 5 ක විගණනය කරන ලද ගිණුම් වාර්තා අධ්‍යයනය කිරීම හා අවශ්‍ය අනෙකුත් තොරතුරු ලබා ගෙන SLIIT ආයතනය සමඟ ගිවිසුමකට එළඹීම.	3) තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට අදාල ඉල්ලීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මඟින් රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙත යැවීමට කටයුතු යොදා ඇත.	2020 සැප්තැම්බර් අවසන් වීමට පෙර වත්කම් පිළිබඳ තක්සේරු වාර්තාව ලබා ගත යුතුය.
4) SLIITහි දැනට ඇති සියලුම වත්කම් (ඉඩම් හා ගොඩනැඟිලි ඇතුළුව) රජයේ ප්‍රධාන තක්සේරු කරුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීම.	4) SLIIT ආයතනය සඳහා නව පාලක මණ්ඩලයක් පත්කිරීමට පෙර දැනට පැවති ගිවිසුම් අවසන්කොට නව ගිවිසුම් අත්සන් කිරීම.	2020 සැප්තැම්බර් සිට අදාල නව ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීම.
5) ඉහත සියලු කටයුතු සම්බන්ධව SLIIT සමඟ සාකච්ඡා කොට එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සුදුසු නිලධාරීන් සමඟ මහපොළ අරමුදලේ අයෝජන කමිටු සාමාජිකයන් 2 නෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීම.	5) රජයේ ප්‍රධාන තක්සේරුකරුවෙකුගේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීම. 6) මහපොළ භාර අරමුදලේ භාරකාර මණ්ඩලය අනුමැතිය යටතේ විශේෂ කමිටුවක් පත් කිරීම.	2020 ජූලි මස අවසන්වීමට පෙර. 2020 ජූලි හා අවසන් වාර්තාව ලබා දීම 2020 සැප්තැම්බර් ක්‍රියාත්මක කිරීම 2021 ජනවාරි සිට

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

ක්‍රියාකාරී සැලැස්ම 2020

උපාය මාර්ගික අරමුණු 8

දේශීය විදේශීය රැකියාවල නිරතවී ඇති ලක්ෂ 3කට අධික මහපොළ ශිෂ්‍යත්ව ලාභීන් ඉලක්කකර දියත් කෙරෙන විශේෂ අරමුදල් ප්‍රවර්ධන වැඩ සටහනක් මඟින් අරමුදලේ ප්‍රාග්ධනය වර්ධනය කිරීම.

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
1) දැනට මහපොළ අරමුදල විසින් ලබාදී ඇති ශිෂ්‍යත්ව සංඛ්‍යාව ලක්ෂ 3 කට අධික වන අතර එම සියලු ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කිරීම.	විවෘත වෙළඳපොළ මිල ගණන් කැඳවා දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා සුදුසු ආයතනයන් තෝරා ගැනීම.	තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා භාරදීම 2020 ජූලි හා උක්ත පද්ධතිය සකස්කොට අවසන් කිරීම 2020 සැප්තැම්බර්.
2) දේශීය හා විදේශීය වශයෙන් රැකියාවල නියුතු සියලු ශිෂ්‍යත්වලාභීන් ආවරණය වන පරිදි ප්‍රචාරණ හා දැනුවත් කිරීමේ වැඩ සටහනක් සකස් කිරීම. ඒ සඳහා සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය යොදා ගැනීම.	සියලු ප්‍රචාරක කටයුතු ඉහත ප්‍රචාරක නියෝජිත ආයතනය වෙත භාරදීම.	ප්‍රචාරක කටයුතු 2020 ජූලි සිට අඛණ්ඩව සිදුකල යුතුය.
3) මහපොළ අරමුදලේ වෙබ් අඩවිය හා මුහුණු පොත මඟින් මහපොළ අරමුදල දැනට ලබාදෙන ශිෂ්‍යත්ව හා ඉදිරියේ දී ලබා දීමට සූදානම් වන ශිෂ්‍යත්ව වැඩ සටහන් පිළිබඳව දැනුවත් කිරීම.	මහපොළ වෙබ් අඩවිය ආරම්භ කොට ඇති අතර මුහුණු පොත නිර්මාණය කරමින් පවතී.	වෙබ් අඩවිය හා මුහුණු පොත යාවත්කාලීන කරන අතර එය සතියකට වරක් විධිමත් පරිදි සිදු කිරීමට කටයුතු යොදා ඇත.
4) මහපොළ ශිෂ්‍යත්වයේ වැදගත්කම හා ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී උසස් අධ්‍යාපන වරම් ලබා ඇති සියලු දෙනාටම විශ්ව විද්‍යාල වරම් ලබාදීමේ ඉලක්කය මත අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීම පිළිබඳ වාර්තා වැඩ සටහනක් සකස් කිරීම හා එහි පිටපතක් සියලුම ශිෂ්‍යත්වලාභීන් වෙත ලබාදීමට කටයුතු කිරීම.	ප්‍රචාරක නියෝජිත ආයතනයක සහාය ඇතිව නාට්‍ය හෝ සිනමා අධ්‍යක්ෂවරයෙකුගේ හා නිෂ්පාදකවරයෙකු තෝරා ගෙන වාර්තා වැඩසටහන් සකස් කිරීම.	2020 ජූලි මස සිට අදාල ප්‍රසම්පාදන කටයුතු අවසන් කොට ගිවිසුම්වලට එළඹීම හා 2020 සැප්තැම්බර් සිට ප්‍රචාරක කටයුතු ආරම්භ කිරීම.
5) දේශීය හා විදේශීය වශයෙන් ශිෂ්‍යත්වලාභීන්ට ඔවුන්ගේ ආධාර මහපොළ අරමුදල වෙත සෘජුවම ලබා දීමට හැකිවන පරිදි Online Payments Gateway පහසුකම ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය යටතේ ලබා ගැනීම හා විදේශ මුදල් මඟින් ද ආධාර කිරීමේ හැකි වන පරිදි විදේශ මුදල් ගිණුමක් මහපොළ අරමුදල යටතේ ආරම්භ කිරීම.	සෘජු ගෙවීම් ක්‍රමය (Online Payment) සඳහා දැනටමත් ලංකා බැංකුව සමඟ සාකච්ඡා කොට ඇති අතර ලිඛිත ඉල්ලීමක් ද ඉදිරිපත් කොට ඇත. ලංකා බැංකුව ප්‍රධාන කාර්යාලය විසින් එම ඉල්ලීම දැනට අධ්‍යයනය කරමින් පවතී.	2020 සැප්තැම්බර් මස සෘජු ගෙවීම් ක්‍රමය (Online Payment) සඳහා වන අනුමැතිය ලබා ගැනීමට කටයුතු යොදා ඇත. 2020 ඔක්තොම්බර් සිට ප්‍රචාරක කටයුතු හා දැනුවත් කිරීම් ආරම්භ කොට නව ගෙවීම් ක්‍රමය යටතේ පරිත්‍යාග ලබා ගැනීම.

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

උපාය මාර්ගික අරමුණු 9

උසස් අධ්‍යාපන වරම් ලබන මෙරට අඩු ආදායම්ලාභී පවුල්වල සිසු දරුවන් සඳහා උපකාර කිරීමට ඉදිරිපත් වන දානපතීන් හා සුභපතන්නන් ඉලක්ක කරගෙන වැඩ සටහනක් මඟින් අරමුදලේ ප්‍රාග්ධනය වර්ධනය කිරීම.

උපාය මාර්ග	ක්‍රියාකාරී සැලැස්ම	කාල රාමුව
1) යම් දානපතියෙක් ශිෂ්‍යත්ව අරමුදලක් ඔහුගේ නමින් ආරම්භ කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම් අවම තැන්පතු මුදල රු.මිලියන 10 ක් වශයෙන් ලබාදීම හා එම අරමුදලින් ජනිත වන වාර්ෂික ආදායම පදනම් කරගෙන ඔහු විසින් නම් කරන අඩු ආදායම්ලාභී සිසුන් සඳහා ශිෂ්‍යත්වයක් ලබාදීමට අනුමැතිය ලබාදීම.	1) පුවත්පත් දැන්වීමක් එල කිරීම.	2020 ජූලි මස ප්‍රචාරක කටයුතු ආරම්භ කිරීම.
2) පොදු කැපකරු ශිෂ්‍යත්ව අරමුදලක් පිහිටුවීම. මෙහිදී විශ්ව විද්‍යාල නොවන අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙනුම් ලබන අඩු ආදායම් ලාභී සිසුන් සඳහා ශිෂ්‍යත්වයක් ලබා දීම.	2) රජයේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල සහාය ලබා ගැනීම.	2020 සැප්තැම්බර් සිට ප්‍රචාරක කටයුතු ආරම්භ කිරීම.
3) යම් දේශීය හෝ විදේශීය ආයතනයක් ශිෂ්‍යත්ව අරමුදලක් ආරම්භ කිරීමට එකඟ වන්නේ නම් ඒ සඳහා මහපොළ අරමුදල අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කිරීම සඳහා වෙනමම ඒකකයක් ස්ථාපනය කිරීම.	3) වෙබ් අඩවිය හා මුහුණු පොත මඟින් දැන්වීම් එල කිරීම.	2020 සැප්තැම්බර් සිට දැනුවත් කිරීම් ආරම්භ කොට මහපොළ අරමුදල යටතේ අනෙකුත් ශිෂ්‍යත්ව සඳහා ඒකකයක් ආරම්භ කිරීම.
4) දැනට විශ්ව විද්‍යාලවල හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන සියලුම ශිෂ්‍යත්ව වැඩ සටහන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම සඳහා මහපොළ අරමුදල යටතේ ක්‍රියාත්මක කිරීම.	4) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම හා සියලුම විශ්ව විද්‍යාල දැනුවත් කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව සාකච්ඡාවක් පැවැත්වීම.	2020 ජූලි සිට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා විශ්ව විද්‍යාල සමඟ සාකච්ඡා ආරම්භ කොට ශිෂ්‍යත්ව ගිවිසුම්වලට එළඹීම හා ක්‍රියාත්මක කිරීම.

පසුවිපරම් හා අධීක්ෂණ : භාරකාර මණ්ඩලය හා ඒ යටතේ පිහිටුවා ඇති ආයෝජන කමිටුව අධීක්ෂණ හා පසු විපරම් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන

2019 දෙසැම්බර් 31

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
2019 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන්	2019	2018
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපළ , පිරියත සහ උපකරණ	12	900,600,030	913,888,938
අස්පෘශ්‍ය වත්කම්	13	708,209	-
ආයෝජන දේපළ	14	12,460,179	12,460,179
පරිපාලිත සමාගම්වල ආයෝජනය	15	985,000,000	985,000,000
වෙනත් ආයෝජන	16	2,200,000	2,200,000
මූල්‍ය වත්කම්	17	10,747,181,046	10,230,227,708
		12,648,149,463	**12,143,776,825**
ජංගම වත්කම්			
වෙනත් වත්කම්	18	5,724,867	4,461,271
අත්තිකාරම් සහ පෙර ගෙවුම්	19	1,658,029	1,579,729
ලැබිය යුතු දෑ	20	767,566,984	155,363,740
මුදල් හා මුදල් සමාන දෑ	21	138,160,020	140,608,323
		913,109,900	**302,013,063**
මුළු වත්කම්		**13,561,259,363**	**12,445,789,888**
මුළු ස්කන්ධය සහ බැරකම්			
ස්කන්ධය සහ බැරකම්			
උපචිත අරමුදල		10,147,376,951	10,147,376,951
ශුද්ධ අතිරික්තය		2,947,863,461	2,148,934,763
මුළු සාමාන්‍ය කොටස්		**13,095,240,412**	**12,296,311,714**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	22	3,835,329	3,172,760
		3,835,329	**3,172,760**
ජංගම බැරකම්			
උපචිත සහ වෙනත් ගෙවිය යුතු දෑ	23	462,183,622	146,305,414
		462,183,622	**146,305,414**
මුළු ස්කන්ධය සහ බැරකම්		**13,561,259,363**	**12,445,789,888**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා මහපොළ භාරකාර මණ්ඩලය වගකීම් දරනු ලබයි. භාරකාර මණ්ඩලය වෙනුවට සහ වෙනුවෙන් අත්සන් තබනු ලැබේ:

අත්සන් කලේ	අත්සන් කලේ	අත්සන් කලේ
අනුර දිසානායක මහතා	එස්.වී.ඩී.කේ.ගුණසේකර මහතා	එම්.පරාක්‍රම බණ්ඩාර මහතා
ලේකම්	පත්කරන ලද භාරකරු	අධ්‍යක්ෂ
උසස් අධ්‍යාපන , තාක්ෂණ හා	මහපොළ උසස් අධ්‍යාපන	මහපොළ උසස් අධ්‍යාපන
නවෝත්පාදන අමාත්‍යාංශය	ශිෂ්‍යත්ව භාර අරමුදල	ශිෂ්‍යත්ව භාර අරමුදල
නිල බලයෙන් මහපොළ භාර		

පිටු අංක 05 සිට 22 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් වේ.

ලලින් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

2019 දෙසැම්බර් මස **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන්	**2019** රු	**2018** රු
ආදායම	7	2,167,588,794	1,854,746,428
සෘජු වියදම්	8	(1,311,706,136)	(1,325,566,790)
		855,882,658	529,179,638
වෙනත් ආදායම්	9	77,727	3,753,459
මුළු ආදායම		**855,960,385**	**532,933,097**
පරිපාලන වියදම්	10	(63,253,113)	.(81,372,485)
පාසල් සංවර්ධන වියදම්	11	(36,734,476)	.-
මුළු වියදම්		**(99,987,589)**	**(81,372,485)**
වියදම් වලට වඩා ශුද්ධ ආදායම		**755,972,796**	**451,560,612**
බදු වලට පෙර අතිරික්තය / (ඌනතාව)		**755,972,796**	**451,560,612**
ආදායම් බදු සඳහා වියදම්		-	-
ශුද්ධ අතිරික්තය / (ඌනතාව)		**755,972,796**	**451,560,612**
වෙනත් විස්තීර්ණ ආදායම්		-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ වියදම්		**755,972,796**	**451,560,612**

පිටු අංක 05 සිට 22 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් වේ.

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
2019 දෙසැම්බර් **31** අවසන් වන වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

	උපචිත අරමුදල	ශුද්ධ අතිරික්තය / ඌනතාව	මුළු මුදල
	රු	රු	රු
2018 ජනවාරි මස **01** වන දිනට ශේෂය	10,147,376,951	1,697,374,151	11,844,751,102
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌනතාව)	-	451,560,612	451,560,612
2018 දෙසැම්බර් මස **31** වන දිනට ශේෂය	**10,147,376,951**	**2,148,934,763**	**12,296,311,714**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌනතාව)	-	755,972,796	755,972,796
පෙර වර්ෂයේ ගැලපීම්	-	42,955,902	42,955,902
2019 දෙසැම්බර් මස **31** වන දිනට ශේෂය	**10,147,376,951**	**2,947,863,461**	**13,095,240,412**

පිටු අංක 05 සිට 22 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් වේ.

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
2019 දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2019 **Rs.**	**2018** **Rs.**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ශුද්ධ අතිරික්තය / (ඌනතාව)	755,972,796	451,560,612
ගැළපීම්:		
ක්ෂයවීම්	29,715,489	56,039,045
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය	-	(3,457,750)
පාරිතෝෂික සඳහා වියදම	662,569	999,218
පෙරවර්ෂයේ ගැලපීම්	42,955,902	
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පූර්ව මෙහෙයුම් අතිරික්තය /	**829,306,757**	**505,141,125**
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්		
ලැබිය යුතු දෑ වැඩිවීම් / අඩුවීම්	(613,545,140)	(97,986,980)
ගෙවිය යුතු දෑ වැඩිවීම් / අඩුවීම්	315,878,208	95,810,832
මෙහෙයුම් වලින් ලද මුදල්	(297,666,932)	(2,176,148)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ අභ්‍යන්තර මුදල් ප්‍රවාහ / බාහිර මුදල් ප්‍රවාහ	**531,639,825**	**502,964,977**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කරගැනීම්	(16,426,582)	(2,002,645)
	(708,209)	-
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද විකුණුම් ආදායම්	-	3,457,750
මූල්‍යමය වත්කම් ආයෝජනය / (ආපසුගැනීම්)	(516,953,338)	(370,961,860)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ අභ්‍යන්තර මුදල් ප්‍රවාහ / බාහිර මුදල් ප්‍රවාහ	**(534,088,129)**	**(369,506,755)**
මූල්‍යයන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		
ගෙවන ලද ලාභාංශ	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද අභ්‍යන්තර මුදල් ප්‍රවාහය / බාහිර මුදල් ප්‍රවාහය	-	-
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ අඩුවීම් / (වැඩිවීම්)	(2,448,303)	133,458,222
2019.01.18 දිනට මුදල් හා මුදල් සමාන දෑ	140,608,323	7,150,101
2019.12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ	**138,160,020**	**140,608,323**

පිටු අංක 05 සිට 22 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසක් වේ.

ආයතනික තොරතුරු

1.1 පොදු

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (භාරකාර අරමුදල) 1981 අංක 66 දරණ පර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කරන ලද භාර අරමුදලක් වන අතර මෙම භාර අරමුදලෙහි කළමනාකරණය සහ පාලනය භාරකාර මණ්ඩලයක් වෙත පැවරී තිබේ. මෙම ආයතනය කොළඹ 07, ධර්මපාල මාවතේ අංක 191 දරණ ස්ථානයේ පිහිටි ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ 4 වන මහලේ පිහිටා තිබේ.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

මෙම අරමුදල වරප්‍රසාද නොලත් තරුණ තරුණියන් වෙත උසස් අධ්‍යාපනය ලබාගැනීම සඳහා මෙන් ම වැඩිදියුණු කළ පහසුකම් ඔස්සේ උසස් අධ්‍යාපනය සඳහා අවස්ථා නිර්මාණය කිරීමට ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි.

1.2.1 මහපොළ භාර අරමුදල

මෙම අරමුදලෙහි ඉලක්ක සහ අරමුණු වන්නේ :

(අ) යෞවනයන් වෙත උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් ලබා දීම;

(ආ) ස්වකීය ද්විතියික අධ්‍යාපනය සතුටුදායක අන්දමෙන් සම්පූර්ණ කරන ලද උසස් අධ්‍යාපනය ලැබීමට යෝග්‍ය තරුණ තරුණියන්ට අවස්ථානුකූලව තම අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය විශ්වවිද්‍යාලයක, හෝ තාක්ෂණ ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ලැබීම සඳහා සහයෝගය ලබාදීම;

(ඇ) යෞවනයන්ට ස්වකීය වෘත්තීය නිපුණතා සහ ප්‍රවීණතාව වැඩිදියුණු කර ගැනීමට හැකියාව සලසමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම සහ කළමනාකරණයට සහයෝගය ලබා දීම;

(ඈ) පාසැල්, අධ්‍යාපන ආයතන, පදනම් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි උන්නතිය උදෙසා කටයුතු කරන එවැනි ආයතනය ස්ථාපනය කිරීම සහ එම ආයතන කළමනාකරණය සහ පවත්වාගෙනයාම සඳහා සහයෝගය ලබා දීම;

(ඉ) කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ අධ්‍යාපනයෙහි ඉදිරි ගමන උදෙසා කටයුතු කරන එබඳු පුද්ගලයන්ගේ නිපුණතා සහ ප්‍රවීණතාව ඉහළ නංවා ගැනීම සහ වැඩිදියුණු කිරීම.

1.3 නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය

2020/03/02 දින පැවති 77 වන භාරකාර මණ්ඩලයේ යෝජනා සම්මත කිරීම ප්‍රකාරව ලලිත් ඇතුලත්මුදලි මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි 2019 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා මූලික පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

2019 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ඇතුළත්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) වලින් (මෙහි මින්මතු SLFRS වශයෙන් දැක්වේ) සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර දක්වා තිබේ.

2.2 මිනුම්කරණ පදනම

වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්තේ නම් මිස, උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.
ආයතනයේ ව්‍යවහාරික සහ ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබේ.

2.3 ප්‍රමාණාත්මකතාවය සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 (LKAS 01) අනුව සමාන අයිතම වල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇත.

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතින්නේ නම් පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරනු ලබන අතර එසේ සිදු කරනු ලබන්නේ ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කිරීමට සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණි. මූල්‍ය ප්‍රතිපත්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ඕනෑම ගිණුම්කරණ ප්‍රමිතියක් අර්ථ දැක්වීමක් මඟින් නියම කර තිබේ නම් හෝ අවසර ලබාදී ඇත්නම් මිස ආදායම් ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් හිලව් කරනු නොලැබේ.

2.4 සංසන්දනාත්මක තොරතුරු

නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) උපයෝගී කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් කිරීමට සිදු වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හැර භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රතාශන ඉදිරිපත් කිරීමේ LKAS 01 ප්‍රකාරව පූර්ව වර්ෂයේ දී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වර්ෂයේදී ද ස්ථිර වශයෙන් ම භාවිතා කර තිබේ.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී උපයෝගී කරගන්නා ලද සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් මිස මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා නිත්‍ය වශයෙන්ම උපයෝගී කරගෙන තිබේ.

3.1 දේපළ, පිරියත සහ උපකරණ

3.1.1 හඳුනාගැනීමේ පදනම

සේවා සැපයීමේ සහ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ යන ස්පෘශ්‍ය අයිතම වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීම අපේක්ෂා කෙරේ.

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් දේපළ, පිරියත හා උපකරණ හඳුනාගනු ලබන අතර වත්කම් සඳහා වන පිරිවැය විශ්වාසවන්තභාවයෙන් යුතුව ගණනය කළ හැකිය.

3.1.2 මිනුම්කරණ පදනම

වත්කම් වශයෙන් හඳුනාගැනීමට සුදුසු දේපළ , පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක් මූලිකවම පිරිවැය අනුව මනිනු ලැබේ. අදාළ වත්කම් ලබාගැනීම සඳහා සෘජුවම ආරෝපණය කරනු ලබන වියදම සහ පසුව ඒ සඳහා කොටසක් එක් කිරීමට හෝ පැරණි කොටසක් වෙනුවට නව කොටසක් එක් කිරීම සඳහා වැය වන මුදල පිරිවැය සඳහා අන්තර්ගත වේ. ස්වයං නිර්මිත වත්කම් සඳහා අමුද්‍රව්‍ය වෙනුවෙන් වැයවන පිරිවැය සහ සෘජු ශ්‍රමය, අයිතම ගෙන ඒම, ඒවා තබනු ලබන ස්ථානයේ ස්ථානගත කිරීම සහ ප්‍රාග්ධනිත ණය ගැනීම් පිරිවැය ආදී සෘජුවම ආරෝපණය වන වෙනත් ඕනෑම ආකාරයේ පිරිවැය අන්තර්ගත වේ. මිලදී ගන්නා ලද මෘදුකාංගය අදාළ උපකරණයේ ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යවශ්‍ය වන්නේ නම් එය පරිගණක උපකරණයේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනිත කරනු ලැබේ.

දේපළ , පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක කොටසක් සතුව විවිධ ඵලදායී ජීව කාල පවතින විට ඒවා දේපළ , පිරියත සහ උපකරණ වල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) වශයෙන් හඳුන්වනු ලැබේ.

ආයතනය විසින් දේපළ, පිරියත සහ උපකරණ ආකෘතිකරණය සඳහා වන පිරිවැය සහ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය පිළිබඳ වාර්තා සහ අඩු සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ සඳහා වන ඕනෑම අනුශංගික වියදම් අදාළ කරගනු ලැබේ..

3.1.3 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් හා එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම්, එබඳු කොටසක ප්‍රතිස්ථාපන පිරිවැය එම අයිතමයෙහි ධාරණ අගයට හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණ දෛනිකව සේවාකිරීම සඳහා වැය වන පිරිවැය, එය වැය වන අකාරයට ලාභ හෝ අලාභ වශයෙන් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

3.1.4 අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු

අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඒවා සිදුකරන ලද මූල්‍ය කාලයට අදාළව ලාභ හෝ අලාභ වශයෙන් සඳහන් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රතිසංස්කරණ සඳහා වන පිරිවැය වත්කම්වල ධාරණ අගයට ඇතුළත් කරනු ලබන අතර අතිරේක වශයෙන් ඇති වත්කම් වලින් ආසන්නතම කාලයේ දී හඳුනාගනු ලබන කොටසක් අනාගත ආර්ථික ප්‍රතිලාභ වශයෙන් ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රතිසංස්කරණ කෙරෙහි අදාළ වත්කම්වල ඉතිරි ඵලදායී ජීව කාලයේ දී විරුද්ධතාවයක් දක්වනු ලැබේ.

3.1.5 හඳුනාගැනීම බැහැර කිරීම

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කරන්නේ නම් හෝ අනාගත ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි නම් ඒවා හඳුනාගැනීමෙන් වැළකී සිටිනු ලැබේ. වත්කම් හඳුනාගැනීම බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභ හෝ අලාභ (ශුද්ධ බැහැර කිරීමේ ලාභ සහ වත්කම් වල ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කර) අදාළ වර්ෂයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" වශයෙන් හඳුනාගනු ලැබේ.

3.1.6 ක්ෂය වීම

වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පාරිභෝගික රටාව සමීප වශයෙන් පිළිබිඹු කරන බැවින් දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයන්හි සෑම කොටසකම ඇස්තමේන්තුගත ජීව කාලය අනුව සරළ රේඛීය පදනම අනුව ලාභ හෝ අලාභ වශයෙන් ක්ෂය වීම හඳුනාගනු ලැබේ.

ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පහත පරිදි වේ;

ගොඩනැඟිලි සහ සවිකිරීම්	අවුරුදු 20
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	අවුරුදු 05
කාර්යාල උපකරණ	අවුරුදු 05
පරිගණක සහ උපාංග	අවුරුදු 04
මෝටර් වාහන	අවුරුදු 04

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයන්හි එක් එක් විශේෂ කොටස සඳහා ක්ෂය වීමේ අනුපාතය ඒවා භාවිතය සඳහා පවතින කාලයේ දී තීරණය කරනු ලැබේ. එනම් කළමනාකාරීත්වය විසින් අපේක්ෂා කරනු ලබන ආකාරයේ ක්‍රියාකාරී තත්ත්වයෙන් අදාළ ස්ථානයේ තිබීම. ක්ෂය වීමේ ක්‍රමවේදයන්, ඵලදායී ජීව කාලයන් සහ අවශේෂ අගයන් සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කර යෝග්‍ය පරිදි ගැළපීම් කරනු ලැබේ.

3.1.7 අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වත්කම්වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා යා හැකි අතර වත්කම්වල පිරිවැය නිශ්චිතව මැනිය හැකි නම් එය අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගැනේ. අස්පෘශ්‍ය වත්කමක් මුලින් මනිනු ලබන්නේ පිරිවැයෙනි. ව්‍යාපාර සංයෝජනයකින් අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය අත්පත් කර ගැනීමේ දිනයේ සිට සාධාරණ වටිනාකමින් මනිනු ලැබේ. මුලික හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් කිසිදු සමුච්චිත ක්‍රමක්ෂය හි සමුච්චිත හානිය අඩු කරනු ලැබේ. අභ්‍යන්තරව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කර නොමැති අතර ඒ හා සම්බන්ධ වියදම්, වියදම් දැරූ වර්ෂයේ ලාභය හෝ අලාභය පිළිබිඹු කරයි.

සීමිත ඵලදායී ආයු කාලය සහිත අස්පෘශ්‍ය වත්කම්

සීමිත ඵලදායී ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඵලදායී ආර්ථික වශයෙන් වූ ආයු කාලයට වඩා ක්‍රමක්ෂය කර ඇති අතර අස්පෘශ්‍ය වත්කම් දුර්වල විය හැකි බවට ඇඟවීමක් ඇති සෑම අවස්ථාවකදීම හානිය සඳහා තක්සේරු කරනු ලැබේ. සීමිත ආයු කාලයක් සහිත

අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කිරීමේ කාලය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කෙරේ. වත්කම් තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත ඵලදායි ආයු කාලයේ වෙනස්වීම් හෝ අපේක්ෂිත භාවිත රටාව ගණනය කරනු ලබන්නේ ක්‍රමක්ෂය කිරීමේ කාල සීමාව හෝ ක්‍රමවේදය සුදුසු පරිදි වෙනස් කිරීමෙනි. තවද, ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් ලෙස සලකනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම් එම අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රියාකාරිත්වයට අනුකූල වන වියදම් කාණ්ඩයේ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

අස්පෘශ්‍ය වත්කම් සඳහා ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලයක් පහත පරිදි වේ:

අයිතමය	**ඵලදායි ආයු කාලය**
පරිගණක මෘදුකාංග	අවුරුදු 5 යි
වෙබ් අඩවිය	අවුරුදු 5 යි

හඳුනාගැනීම බැහැර කිරීම

අස්පෘශ්‍ය වත්කමක ධාරණ අගය බැහැර කිරීමේදී හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ එහි භාවිතයෙන් අපේක්ෂා නොකරන විට හඳුනාගැනීමෙන් වැළකී සිටිනු ලැබේ. අස්පෘශ්‍ය හඳුනාගැනීම බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභ හෝ අලාභ ගණනය කරනු ලබන්නේ ශුද්ධ බැහැර කිරීමේ ලාභ සහ වත්කම් වල ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ.

3.2 ආයෝජන දේපළ

3.2.1 හඳුනාගැනීමේ පදනම හා මිනුම්කරණය

කුලී ආදායම ඉපැයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු ද්විත්වය වෙනුවෙන්ම දරා සිටින, එනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ දී විකිණීම සඳහා නොපවතින දේපළ ආයෝජන දේපළ වේ. මෙම දේපළ භාණ්ඩ හා සේවා නිපදවීම හෝ සැපයුම සඳහා හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

ආයෝජන දේපළ මුල් අවස්ථාවේ දී එහි පිරිවැයට මිනුම්කරණය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, ආයෝජන දේපළ එහි පිරිවැය මත සඳහන් කෙරේ.

3.2.2 හඳුනාගැනීම් බැහැර කිරීම

ආයෝජන දේපළ බැහැර කිරීම හෝ ආයෝජන දේපළ ස්ථිරවම භාවිතයෙන් ඉවත් කිරීම සහ එසේ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට ආයෝජන දේපළ හඳුනා ගැනීම් බැහැර කරනු ලැබේ. ආයෝජන දේපළක් විශ්‍රාම ගැන්වීම් හෝ ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන යම් ලාභයක් හෝ පාඩුවක් එකී විශ්‍රාම ගැන්වීම හෝ ආයෝජන දේපළක් ඉවත් කිරීම සිදුකළ වර්ෂයේම ලාභ අලාභ ප්‍රකාශයේ හඳුනාගැනේ.

3.2.3 ආයෝජන දේපළකට/ආයෝජන දේපළකින් පසුකාලීනව සිදුකරන මාරු කිරීම්

හිමිකරුගේ පදිංචිය අවසන් කිරීම, වෙනත් පාර්ශවයක් වෙත ක්‍රියාත්මක බද්දක් ආරම්භ වීම හෝ ඉදිකිරීමක් හෝ සංවර්ධනය කිරීමක් නිම වීම වැනි සාක්ෂි මඟින් භාවිතයෙහි වෙනස් වීමක් සිදුවුවහොත් පමණක් ආයෝජන දේපළකට මාරු කිරීම් සිදුකරනු ලැබේ.

හිමිකරුගේ පදිංචිය ආරම්භ කිරීම හෝ අලෙවි කිරීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කිරීම් ආරම්භ කිරීම වැනි සාක්ෂි මඟින් භාවිතයෙහි වෙනස් වීමක් සිදුවුවහොත් පමණක් ආයෝජන දේපළකින් මාරු කිරීම් සිදුකරනු ලැබේ.

ආයෝජන දේපළකින් හිමිකරු පදිංචිගත දේපළකට හෝ තොගයකට මාරු කිරීමේ දී, පසුකාලීන ගිණුම්කරණ කාර්යයන් සඳහා සැලකිය යුතු එහි දේපළ පිරිවැය වනුයේ භාවිතයෙහි වෙනස් වීමක් සිදු වූ දිනයේ එහි සාධාරණ අගය වේ. හිමිකරු විසින් පදිංචිගත දේපළක් ආකාරයෙන් දේපළ සමාගම විසින් පරිහරණය කරන්නේ නම් එය ආයෝජන දේපළක් වන අතර, එහි භාවිතයේ වෙනසක් සිදුවන දිනය දක්වාම දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව එකී දේපළ සඳහා සමාගම වගකිව යුතු වේ.

තොගයක් ආයෝජන දේපළක් බවට මාරු කිරීමේ දී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී හඳුනාගනු ලැබේ. සමාගම විසින් ඉදි කරන ලද ආයෝජන දේපළක, ඉදි කිරීම හෝ සංවර්ධනය කිරීම සමාගම විසින් නිමකරනු ලබන විට දී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී හඳුනාගනු ලැබේ.

3.2.4 මූල්‍ය නොවන වත්කම්හි හානිකරණය

වත්කමක් හානිකරණය පිළිබඳ හැඟවීමක් ඇති ද යන්න සෑම වාර්තාකරණ දිනයකදී ම මහපොළ භාර අරමුදල විසින් තක්සේරු කරයි. කිසියම් හැඟවීමක් ඇත්නම්, හෝ වත්කමක් වෙනුවෙන් වාර්ෂික හානිකරණ පරීක්ෂාව අවශ්‍ය වන්නේ නම්, අරමුදල විසින් වත්කමෙහි නැවත අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක (CGU) විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ අගය සහ එහි භාවිත අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය වත්කමක නැවත අයකර ගත හැකි වටිනාකම වේ. වත්කමක් විසින් මුදල් ප්‍රවාහ ජනනය නොකරන අවස්ථාවන්හිදී මෙය තනි වත්කමක් සඳහා නිර්ණය කරන අතර අනෙකුත් වත්කම් හෝ වත්කම් කාණ්ඩ වලින් බොහෝ දුරට ස්වාධීන වේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක ධාරණ අගය එහි නැවත අයකර ගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවක, වත්කම් හානිකරණ වූ ලෙස සැලකෙන අතර එකී වත්කම එහි නැවත අයකරගත හැකි අගයට සටහන් කරනු ලැබේ. භාවිත අගය තක්සේරු කිරීමේ දී මුදලේ කාල අගය සහ වත්කමට සුවිශේෂී වූ අවදානම් වල ප්‍රවර්තන වෙළඳ පොළ තක්සේරු පිළිබිඹු කරන බදුවලට පෙර වට්ටම් අනුපාතිකයක් භාවිතා කරමින් ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ අගය නිර්ණය කිරීමේ දී, ආසන්නතම වෙළඳ පොළ ගනුදෙනු තිබේ නම් ඒවා සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනු හඳුනාගැනීමට නොහැකි නම්, යෝග්‍ය ආගණන ආකෘතියක් යොදා ගනු ලැබේ.

3.3 පරිපාලිතයන්හි ආයෝජන හා අනෙකුත් ආයෝජන

පරිපාලිතයන්හි සිදුකරන අයෝජන හා අනෙකුත් ආයෝජන මුල් අවස්ථාවේ දී සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දී පිරිවැයක් ලෙස හඳුනා ගැනේ. පරිපාලිතයන් අත්පත් කරගැනීමට අදාළ යම් ගනුදෙනු පිරිවැයක් එම අවස්ථාවේදීම ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා අතර, පරිපාලිතයන්හි සිදුකරන අයෝජන මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව සමුච්චිත හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු පිරිවැය මත දක්වනු ලැබේ.

3.4 විදේශීය මුදල්

අ) **ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය**

මෙම අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත අයිතමයන් මෙම අස්ථිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකයෙන් (ව්‍යවහාරික මුදල් ඒකකය) මිනුම්ගත කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමාගමේ ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකයයි.

ආ) **ගනුදෙනු හා ශේෂ**

විදේශ මුදල් ඒකක වලින් සිදුවන ගනුදෙනු, අදාළ ගනුදෙනු සිදුවන දිනයන්හි දී බල පැවැත්වෙන විනිමය අනුපාතිකයන් භාවිතයෙන් ව්‍යවහාරික මුදල් ඒකකය වෙත පරිවර්තය කරනු ලැබේ. එවැනි ගනුදෙනු පියවීමේ දී සහ විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් සිදුකරන මුදල් වත්කම් හා බැරකම් ගනුදෙනුවල දී ප්‍රතිඵල වන විදේශ විනිමය ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. මුදල් වත්කම් හා බැරකම් ශේෂ වසර අවසාන විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කරනු ලැබේ.

3.5.1 **බදුකරණය**

3.5.1 **ප්‍රවර්තන බදුකරණය**

ප්‍රවර්තන හා පූර්ව කාල පරිච්ඡේද සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනු ලබන්නේ ආදායම් බදු කොමසාරිස්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් ප්‍රමාණය වශයෙනි. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගැනෙනුයේ වාර්තාකරණ දිනයට පෙර සිට බලපැවැත් වූ හෝ එම දිනයට බල පැවැත්වෙන පරිදි පනවා ඇති බදු අනුපාතික හා බදු නීති වේ.

මෙම භාර අරමුදල සඳහා ආදායම් බදු ප්‍රතිපාදන පදනම පහත පරිදි වේ.

අ) **මහපොළ භාර අරමුදල**

1981 අංක 66 දරණ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනත අනුව මහපොළ භාර අරමුදල ආදායම් බදු වලින් නිදහස් කර ඇත.

3.5.2 **විලම්බිත බදු**

වාර්තාකරණ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් හා මූල්‍ය වාර්තාකරණ කාර්යයන් වෙනුවෙන් ඒවායේ ධාරණ අගයන් අතර තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු ප්‍රතිපාදනය කෙරේ.

බදු අයකළ හැකි සියලු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැරකම් හඳුනාගනු ලැබේ.

සියලු අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන අතර, භාවිතා නොකළ බදු ණය හා බදු අලාභ වල අඩු කළ හැකි තාවකාලික වෙනස සහ ඉදිරියට ගෙන යෑම උපයෝජනය කිරීම සඳහා යොදා ගැනීමට බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව පවතින තෙක් දුරට භාවිතා නොකළ බදු ණය හා බදු අලාභ ඉදිරියට ගෙන යෑමේ හැකියාව ඇත.

3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ ලෙස ඇතුළත් වනුයේ අතැති හා බැංකුවේ ඇති මුදල්, අත්පත් කරගන්නා දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කාල සීමාවක් තුළ මුල් කල් පිරීමේ දිනය සහිත ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු අනෙකුත් කෙටි කාලීන ආයෝජන වේ. බැංකු අයිරා පහසුකම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දැක්වේ.

4 මූල්‍ය උපකරණ - මුල් වරට හඳුනා ගැනීම හා පසුව සිදුවන මිනුම්කරණයන්

4.1 මූල්‍ය වත්කම්

4.1.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා මිනුම්කරණය

2018 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, වත්කම් කළමනාකරණය සඳහා වූ ව්‍යාපාරික අකෘතිය මත පදනම්ව මහපොළ භාර අරමුදල විසින් එහි සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය පහත සඳහන් ආකාර වලින් එකකට සිදුකරනු ලැබේ.;

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI)
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL)

මූල්‍ය වත්කම්වල පසුව සිදුවන මිනුම්කරණයන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

4.1.2 ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන්නේ නම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL) මත නම් නොකරන්නේ නම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව එම මූල්‍ය වත්කම ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ:

- මූල්‍ය වත්කම රඳවා ගැනීම මඟින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම දරා සිටින විට; සහ

- හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධනය මත පොළී ගෙවීම ආකාරයේ මුදල් ප්‍රවාහයන් යම් නිශ්චිත දිනයක දී පැන නඟින මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි.

4.1.3 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට (FVOCI) මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම් ලෙස වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද ණය හා ස්කන්ධ උපකරණ ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද ණය උපකරණ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද ස්කන්ධ උපකරණ වලින් මෙය සමන්විත වේ.

4.1.4 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව ණය උපකරණ

ණය උපකරණයක් පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන්නේ නම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL) මත නම් නොකරන්නේ නම්, එම ණය උපකරණය වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව මිනුම්කරණය කෙරේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම හා මූල්‍ය වත්කම් විකිණීම මඟින් සිය අරමුණු ඉටු කර ගනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම දරා සිටින විට; සහ

- හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධනය මත පොළී ගෙවීම ආකාරයේ මුදල් ප්‍රවාහයන් යම් නිශ්චිත දිනයක දී පැන නඟින මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි.

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව පවතින ණය උපකරණ, වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගනු ලබන සාධාරණ අගය වෙනස් වීමෙන් පැන නඟින ලාභ හෝ අලාභ සමඟින් පසුව සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ. පොළී ආදායම සහ අපේක්ෂිත බැරකම් අලාභ සහ ප්‍රතිවර්තනයන් ලාභ අලාභ තුළ හඳුනාගැනේ. පෙර වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලැබූ සමුච්චිත ලාභ හෝ අලාභ හඳුනාගැනීම් බැහැර කිරීමේ දී, වෙනත් විස්තීර්ණ ආදායම් වලින් ලාභ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කෙරේ. මීට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) යටතේ විකිණීම සඳහා පවතින වශයෙන් වර්ගීකරණය කර තිබූ රජයේ සුරැකුම්පත්වලින් මෙම උපකරණ සමන්විත වේ.

4.1.5 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 32 (LKAS 32)හි "මූල්‍ය සාධනපත්‍ර: ඉදිරිපත් කිරීම" යටතේ ස්කන්ධය යන්නෙහි අර්ථ දැක්වීමට අනුකූල වන සහ වෙළඳාම සඳහා රඳවා නොගත් ස්කන්ධ උපකරණවලින් ක්‍රමෝපායික කාර්යය සඳහා රඳවාගත් ස්කන්ධ ආයෝජන වලින් කොටසක් මුල් හඳුනාගැනීමෙන් පසු, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව ණය උපකරණ ලෙස අවලංගු කර ගත නොහැකි පරිදි වර්ගීකරණය කිරීමට සමාගම විසින් ඇතැම්විට තීරණය කරනු ලැබේ. එවැනි වර්ගීකරණයක් උපකරණයෙන් උපකරණයට යන පදනම මත නිගමනය වේ.

.මෙම ස්කන්ධ උපකරණවල ලාභ සහ අලාභ කිසිදුවිටක ලාභ හො අලාභ යටතට ප්‍රතිවක්‍රණය නොවන අතර, ඒ වෙනුවට එකී හඳුනාගැනීම් බැහැර කරන අවස්ථාවේ දී රඳවාගත් ඉපැයුම් වෙත සෘජුවම මාරු කෙරේ. ගෙවීම් වෙත අයිතිය ස්ථාපනය වූ පසු, ලාභාංශ ලාභ හෝ අලාභ ලෙස අනෙකුත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගැනේ. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වන ණය උපකරණ හානිකරණ පරීක්ෂාවට භාජනය නොවේ.
මීට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39)හි "විකිණීම සඳහා පවතින" යටතේ වර්ගීකරණය වූ මිල සඳහන් නොකළ හිමිකම් කොටස් වලින් මෙම උපකරණ සමන්විත වේ.

4.1.6 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වර්ගීකරණය වූ මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. වෙළඳාම සඳහා රඳවා ගත් හෝ කළමනාකරණය කරන හා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා දරා නොසිටින මෙන්ම මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම යන කාර්ය ද්විත්වය වෙනුවෙන්ම දරා නොසිටින බැවින් එහි කාර්යසාධනය සාධාරණ අගය මත පදනම්ව ඇගයීම සිදුවන මූල්‍ය වත්කම් ද සහ මුල් හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් ද ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) අනුව, වෙළඳාම සඳහා රඳවා ගත් මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් ය.

4.2 මූල්‍ය බැරකම්

4.2.1 මූල්‍ය බැරකම් වර්ගීකරණය හා පසුකාලීන මිනුම්කරණය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, මූල්‍ය බැරකම් පහත ආකාරයෙන් වර්ගීකරණය කෙරේ.

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම්, සහ
  - වෙළඳාම සඳහා රඳවා ගත් හෝ
  - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද වශයෙන් මෙම කාණ්ඩය තුළ වර්ගීකරණය වේ.
- ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කළ මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකම්වල පසුකාලීන මිනුම්කරණය ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) මඟින් මූල්‍ය බැරකම් වර්ගීකරණය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) හි පවතින අවශ්‍යතා බොහෝ සෙයින් රඳවා ගෙන ඇත.

4.2.2 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම්

වෙළඳාම සඳහා රඳවා ගත් මූල්‍ය බැරකම් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මුල් හඳුනාගැනීමෙන් අනතුරුව නම් කරන ලද මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම් යටතට ඇතුළත් වේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් නොකෙරන මූල්‍ය බැරකම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කෙරේ.

4.3 මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හඳුනාගැනීම බැහැර කිරීම

4. 3.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමකින් ජනනය වන මුදල් ප්‍රවාහයන් සඳහා ඇති ගිවිසුම්ගත අයිතිය අවසන් වෙන විට හෝ ගනුදෙනුවකින් මුදල් ප්‍රවාහයක් ලැබීමට ඇති අයිතිය පැවරීමේ දී මූල්‍ය වත්කමෙහි අයිතිය හා සම්බන්ධිත සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ සමාගම විසින් පවරා ඇති විට හෝ නැතහොත් මූල්‍ය වත්කමෙහි අයිතිය හා සම්බන්ධිත සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ සමාගම විසින් පැවරීම හෝ රඳවා ගනීම සිදු නොකරන විට සහ සමාගම විසින් මූල්‍ය වත්කමක පාලනය රඳවා ගැනීම සිදුනොකරන විට යන අවස්ථාවල දී සමාගම විසින් එම මූල්‍ය වත්කමෙහි (හෝ අදාළ වන පරිදි එහි කොටසක හෝ) හඳුනාගැනීම බැහැර කරනු ඇත.

වත්කමෙහි ධාරණ අගය (හෝ වත්කමෙහි හඳුනාගැනීම බැහැර කරන කොටසට අදාළ වන ධාරණ අගය) හා ලැබී ඇති ප්‍රතිශ්ඨාවල එකතුව (අලුතින් එක් කරගත් නව වත්කම්වලින් අලුතින් භාර ගන්නා බැරකම් අඩුකර එයද ඇතුළුව) අතර වෙනස සහ වෙනත් විස්තීර්ණ ආදායම්හි දී හඳුනාගන්නා යම් සමුච්චිත ලාභ/අලාභ, මූල්‍ය වත්කමක හඳුනාගැනීම බැහැර කිරීමේ දී ලාභ හෝ අලාභ වල දී හඳුනා ගැනේ.

එසේ වුව ද, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ස්කන්ධ ආයෝජන සුරැකුම් වලට අදාළව වෙනත් විස්තීර්ණ ආදායම්හි දී හඳුනාගන්නා සමුච්චිත ලාභ/අලාභ, එවැනි සුරැකුම්වල හඳුනාගැනීම බැහැර කිරීමේ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) ට අනුකූලව ලාභ හෝ අලාභ වල දී හඳුනා නො ගැනේ.

සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවා ගෙන සිටින, හඳුනාගැනීම බැහැර කිරීම සඳහා සුදුසුකම් ලබන පැවරූ මූල්‍ය වත්කමකට අදාළ කවර හෝ හිමිකමක් ඇතොත් එය වෙනම වත්කමක් හෝ බැරකමක් වශයෙන් හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගනු ලබන වත්කම් මාරු කිරීම සඳහා සමාගම ගනුදෙනු වලට එළඹීම සිදු කරන මුත් මාරු කරනු ලබන වත්කම්හි හෝ එහි කොටසක සියලු හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීම සිදු කරයි. එවැනි අවස්ථාවන්හි දී, මාරු කරනු ලබන වත්කම්වල හඳුනාගැනීම බැහැර කිරීම සිදු කරනු නොලැබේ.

වත්කම් තෙවන පාර්ශවයක් වෙත, මාරු කරනු ලබන වත්කම්හි සමකාලීන මුළු ඉපැයුම් අනුපාතිකය හුවමාරු වන පරිදි විකිණීම සිදු කරන විට දී, එය අලෙවි හා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවක් හා සමානව සුරැකුම් කරන ලද මූල්‍යමය ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කෙරේ. මීට හේතුව සමාගම විසින් එකී වත්කම් වල හිමිකාරිත්වයේ සියලුම හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීමයි.

සමාගම විසින් වත්කමකින් මුදල් ප්‍රවාහයක් ලැබීමට ඇති සිය අයිතිය පැවරූ විට හෝ පැවරීමේ විධිවිධානයකට එළඹී සිටීම සහ වත්කමක සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ පැවරීමක් හෝ රඳවා ගැනීමක් හෝ සිදුකර නොමැති හෝ වත්කම පාලනය කිරීම පවරා නොමැති විටක, වත්කම සම්බන්ධයෙන් සමාගමේ අඛණ්ඩ සම්බන්ධතාවය පවතින සීමාව දක්වා එම වත්කම හඳුනාගැනීම සිදු කෙරේ. එම අවස්ථාවේ දී සමාගම විසින් ආශ්‍රිත බැරකම් හඳුනාගනු ලැබේ. සමාගම විසින් රඳවාගනු ලබන අයිතීන් හා බැඳීම් පිළිබිඹු වීමේ පදනම මත පැවරූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මිනුම්කරණය කෙරේ.

4.3.2 මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකමක ගිවිසුම්ගත බැඳීම් ඉටු කළ විට හෝ අවලංගු වූ විට අදාළ කාලය අවසන් වූ විට, සමාගම විසින් මූල්‍ය බැරකම හඳුනාගැනීම බැහැර කරනු ලැබේ.

4.3.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව්කර එකී ශුද්ධ වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරන්නේ හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම ප්‍රවර්තන ලෙස බල ගැන්විය හැකි නීතිමය අයිතියක් ඇත්තේ නම් පමණක්ම වන අතර, ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කර ගැනීමට හා සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණකි.

ආදායම් සහ වියදම් ශුද්ධ පදනම මත ඉදිරිපත් කරනුයේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මඟින් අවසර ලැබෙන අවස්ථාවන්හි දී පමණක්, හෝ සමාගමේ වෙළඳ කටයුතු වැනි සමාන ආකාරයේ ගනුදෙනු සමූහයකින් ප්‍රතිඵල වන ලාභ හා අලාභ සඳහා පමණි.

5. බැරකම් හා ප්‍රතිපාදන

5.1 බැරකම්

5.1.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

5.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සියලුම සේවකයන් සඳහා පළමු වසරේ සිටම ක්‍රියාත්මක වන විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ. එසේ වුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ, සේවකයකු සඳහා වගකීමක් ඇති වනුයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් අනතුරුව වේ. මෙම වගකීම ගණනය කරනුයේ සෑම වර්ෂයක් සඳහා ම මාසයක වැටුපෙන් අර්ධයක අනුපාතිකය මත වේ. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ බැරකම් යටතේ දැක්වේ.

මෙම පාරිතෝෂිත බැරකම් වෙනුවෙන් බාහිර ලෙස මුදල් යෙදවීමක් සිදු නොවේ.

5.1.3 නිශ්චිත දායකත්ව සැලසුම්- සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

මහපොළ භාර අරමුදල විසින් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත දරණ දායකත්වයන් අදාළ නීතිරීති වලට අනුකූලව අදාළ දායකත්ව ප්‍රතිපාදන මඟින් ආවරණය වේ. සේවකයන් ආවරණය කරමින් දායකත්ව සැලසුම් වෙත දායක මුදල් ගෙවීමට ඇති බැඳීම් ආදායම් ප්‍රකාශනයේ වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල

භාරකාර අරමුදල හා සේවකයා විසින් පිළිවෙලින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් 15%ක් හා 10%ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයනු ලැබේ.

සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදලට සේවකයාගේ මාසික දළ වැටුපෙන් 3%ක දායකත්වයක් මහපොළ භාරකාර අරමුදල විසින් දරණු ලැබේ.

5.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විට, එම බැඳීම් බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ් වූ සම්පත් බැහැරට ගලා යෑමේ ඉඩකඩ පවතින විට, හා බැඳීම් ප්‍රමාණය පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් කළ හැකිවිට ප්‍රතිපාදන හඳුනාගැනේ. සමාගම විසින් ඇතැම් හෝ සියලු ප්‍රතිපාදන ප්‍රතිපූරණය කිරීමක් අපේක්ෂා කරන අවස්ථාවක දී, නිදසුනක් වශයෙන් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් යටතේ නම්, ප්‍රතිපූරණය වෙනම වත්කමක් යටතේ හඳුනාගන්නා අතර නමුත් එසේ කරනුයේ ප්‍රතිපූරණය සත්‍ය වශයෙන්ම ස්ථීර නම් පමණකි. කවර ආකාරයක හෝ ප්‍රතිපාදනයක් හා සබැඳි වියදම්, යම් ප්‍රතිපූරණයක් තිබේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශය තුළ ඉදිරිපත් කෙරේ.

මුදලේ කාල අගයේ බලපෑම ප්‍රමාණාත්මක නම්, බැරකම් සඳහා නිශ්චිත වන අවදානම් අදාළ පරිදි පෙන්නුම් කෙරෙන ප්‍රවර්තන පෙර-බදු අනුපාතිකය භාවිතයෙන් ප්‍රතිපාදන වටිටම් කරනු ලැබේ. වටිටම් කිරීම යොදා ගනු ලබන විට කාලය ගත වීමට අනුව සිදුවන ප්‍රතිපාන වැඩිවීම මූල්‍ය පිරිවැයක් වශයෙන් හඳුනාගැනේ.

6. ආදායම් හා වියදම්

6.1 ආදායම් හඳුනාගැනීම

2018 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මඟින්, ආදායම සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 (LKAS 18) හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 (LKAS 11) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ විවරණ කමිටුවේ පාරිභෝගික ලැදියාව සම්බන්ධ IFRIC 13 ද ඇතුළුව ආදායම් හඳුනාගැනීම් මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මඟින් ආදායම හඳුනාගනු ලබන්නේ කෙසේ ද හා කොපමණ වශයෙන් කවර දිනකට ද යන්න නිර්ණය කිරීම සඳහා සම්පූර්ණ ආකෘති රාමුවක් සපයනු ලැබේ. ආදායම හඳුනාගනු ලබන්නේ කවර දිනයකට ද හා කවර අගයකින් ද නිර්ණය කිරීම සඳහා අස්තිත්ව විසින් පියවර පහකින් යුතු ආකෘතියක් යොදා ගැනීම අවශ්‍ය වේ. ආදායම හඳුනා ගන්නේ කවර දිනයක ද හෝ අස්තිත්වය සඳහා අපේක්ෂා කරන හිමිකාරිත්වය යටතේ කුමන අගයකින් පාරිභෝගිකයා වෙත භාණ්ඩ හා සේවාවල පාලනය පවරා දීම යන්න සහ භාරකාර අරමුදල වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම අපේක්ෂා කළ හැක්කේ කවර දිනයක දී යන්න හා ගෙවීම් කරන දිනය කුමක් වුවද ආදායම හා දරණ ලද හෝ දැරිය යුතු ආශ්‍රිත වියදම් විශ්වාසනීය ආකාරයකින් මිනුම්කරණය මෙම ආකෘතිය මඟින් නිශ්චය කෙරේ. ගිවිසුම්ගත නිශ්චිත ගෙවීම් කොන්දේසි ද සැලකිල්ලට ගෙන ලැබී ඇති හා ලැබිය යුතු ප්‍රතිශ්ඨාවන්ට අදාළ සාධාරණ අගය මත ආදායම් මිනුම්කරණය වේ.

6.1.1 පොළී ආදායම්

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය අනුව මිනුම්ගත සියලු මූල්‍ය උපකරණ හා විකිණීම සඳහා පවතින යටතේ වර්ගීකරණය කළ පොළී දරන මූල්‍යමය වත්කම් මත පොළී ආදායම හෝ වියදම් වාර්තා කරනුයේ සඵල පොළී අනුපාතිකය (EIR) මත වේ. සඵල පොළී අනුපාතිකය යනු මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ ධාරණ අගයට මූල්‍ය උපකරණවල අපේක්ෂිත ජීව කාලය හෝ කෙටි කාල සීමාවක් ඔස්සේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් අනුව තත්ත්වාකාරයෙන් වටිටම් කරනු ලැබූ අනුපාතිකයයි. ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම් තුළ පොළී ආදායම ඇතුළත් වේ.

6.1.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම යටතේ හඳුනාගැනේ.

6.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමට වැය කෙරෙන සියලු වියදම් වසර සඳහා ලාභය ගණනය කිරීමේ දී ආදායමෙන් අය කරනු ලැබේ. අලුත්වැඩියා කිරීම් හා අලුත් කිරීම් අදාළ වියදම දරනු ලැබූ වර්ෂයට අදාළ ලාභ හා අලාභ වලින් අය කරණු ලැබේ.

7 ආදායම්	2019 රු.	2018 රු.
ශුද්ධ පොළී ආදායම් (NWCL සහ MTF) - සටහන 7.1	1,150,242,194	930,146,041
සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලද ලාභ කොටස	997,346,600	904,600,387
SLIIT වෙතින් ලද බදු කුළිය	20,000,000	20,000,000
	2,167,588,794	**1,854,746,428**

7.1 NWCL මඟින් කළමනාකරණය කරනු ලබන ආයෝජන කළඹ සඳහා ශුද්ධ පොළිය	2019 රු.	2018 රු.
වෙනත් පොළී		
NWCL ආයෝජන කළඹ - ආයොජන ආදායම්	-	758,219,849
MTF - ආයෝජන ආදායම්	1,150,242,194	171,926,192
	1,150,242,194	**930,146,041**

7.2 MTF - ආයෝජන පොළිය	2019 Rs.	2018 Rs.
භාණ්ඩාගාර බැඳුම්කර - සටහන 7.3	621,446,796	109,772,203
භාණ්ඩාගාර බැඳුම්කර - ප්‍රාග්ධන ලාභ	50,165,824	-
භාණ්ඩාගාර බිල්පත් පොළිය	6,270,403	-
වත්කම් ඇප බැඳුම්කර පොළිය	32,401,919	-
ණයකර පොළිය	171,570,098	-
බැංකු ස්ථාවර තැන්පතු පොළිය	253,265,898	52,401,309
කෙටි කාලීන තැන්පතු පොළිය	9,191,949	5,660,517
එක්දින තැන්පතු පොළිය	5,683,277	3,786,337
අනෙකුත් පොළිය	246,030	305,826
	1,150,242,194	**171,926,192**

7.3 භාණ්ඩාගාර බිල්පත් පොළී	2019 Rs.	2018 Rs.
භාණ්ඩාගාර බිල්පත් පොළී	664,811,515	123,619,110
භාණ්ඩාගාර බැඳුම්කර අධිභාර	(43,364,719)	(13,846,907)
	621,446,796	**109,772,203**

සටහන - NWCL විසින් කළමණාකරනය කරන ලද මහපොළ ප්‍රධාන අරමුදල 2019.02.28 දින මහපොළ අරමුදලේ ලංකා බැංකුවේ ඇති ගිණුම වෙත මාරු කරන ලදී.

8 සෘජු වියදම්

ශිෂ්‍යත්ව ප්‍රදාන වියදම්	2019 Rs.	2018 Rs.
ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල (8.1)	1,253,782,384	1,269,525,962
ශිෂ්‍යත්ව ගෙවීම් - තාක්ෂණික විද්‍යාල	50,727,500	47,040,200
ශිෂ්‍යත්ව ගෙවීම්- වෙනත් උසස් අධ්‍යාපන ආයතන	5,524,996	6,693,400
නව ශිෂ්‍යත්ව ප්‍රදාන වියදම්	1,671,256	2,307,228
	1,311,706,136	**1,325,566,790**

8.1 ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල

	2019 රු.	2018 රු.
ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල	2,197,988,134	1,269,525,962
අඩු කලා- භාණ්ඩාගාර දායකත්වය	(944,205,750)	-
	1,253,782,384	**1,269,525,962**

9 වෙනත් ආදායම්

	2019 රු.	2018 රු.
කාර්ය මණ්ඩල ණය පොළී	56,382	45,384
ආධාර	15,000	15,000
අයතරගත් මුදල්	-	229,500
සුළු මුදල්	6,345	5,825
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ආදායම	-	3,457,750
	77,727	**3,753,459**

10 පරිපාලන වියදම්	2019	2018
	රු.	රු.
වැටුප්	11,806,066	9,233,460
පැමිණීමේ දීමනා	1,319,000	457,125
අතිකාල සහ නිවාඩු දින දීමනා ගෙවීම්	685,260	466,319
සේවක අර්ථසාධක අරමුදල	895,192	1,911,540
සේව ක භාරකාර අරමුදල	201,678	393,295
නිවාඩු වෙනුවෙන් ගෙවීම්	272,261	243,771
ක්ෂයවීම්	29,715,489	56,039,045
භායනය කිරීම	166,292	-
තැපැල් ගාස්තු සහ සන්නිවේදන ගාස්තු	94,859	612,556
පාරිතෝෂික වෙන්කිරීම්	662,569	999,218
ශුභසාධන වියදම්	195,806	191,467
දුරකථන ගාස්තු	579,819	41,694
විගණන සහ කළමනාකරණ කමිටු ගාස්තු	287,782	42,000
භාරකාර මණ්ඩල සාමාජික ගාස්තු	325,104	218,741
ඉන්ධන, ගමන් වියදම් සහ යැපීම් දීමනා	513,115	260,073
ජලය	10,956	-
විදුලිය	553,199	518,056
පවිත්‍රතා ගාස්තු	64,600	70,566
ආරක්ෂක ගාස්තු	310,000	269,000
මුද්‍රණ ගාස්තු සහ ලිපි දුව්‍ය	913,215	578,928
නඩත්තු වියදම්	128,459	148,151
ගොඩනැඟිලි කුළී	4,185,850	3,863,862
පද්ධති නඩත්තුව සහ තොරතුරු තාක්ෂණ වියදම්	-	27,566
ආධාර	1,345,218	74,550
රක්ෂණය	262,499	448,072
දැන්වීම් ගාස්තු	-	181,844
දායකත්ව ගාස්තු	291,950	25,750
සුළු වියදම්	137,439	92,519
වෙබ් සයිට් වියදම්	285,500	155,000
වාහන කල් බදු ගාස්තු	1,819,225	1,828,500
වාහන නඩත්තුව	294,472	34,830
වෘත්තීය ගාස්තු	2,971,133	1,909,503
බැංකු ගාස්තු	1,959,106	35,485
	63,253,113	**81,372,485**

11 මූල්‍ය වියදම්	2019	2018
	රු.	රු.
ණය පොළී	36,734,476	-
	36,734,476	

12 දේපළ , පිරියත සහ උපකරණ

12.1 දළ ධාරණ වටිනාකම්	2019.01.01 දිනට ශේෂය	එකතුකිරීම්	බැහැරකිරීම්	2019.12.31 දිනට ශේෂය
	රු.	රු	රු	රු
පිරිවැය				
ගොඩනැඟිලි	1,064,520,695	-	-	1,064,520,695
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	7,935,353		-	7,935,353
කාර්යාල උපකරණ	1,479,585	31,500	-	1,511,085
පරිගණක සහ උපාංග	6,869,830	27,000	-	6,896,830
මෝටර් රථ		16,190,000		16,190,000
ක්ෂය කළ හැකි වත්කම්වල මුළු අගය	**1,080,805,463**	**16,248,500**	**-**	**1,097,053,963**

12.2 ක්ෂය වෙන් කිරීම්	2019.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්	බැහැරකිරීම්	2019.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.
පිරිවැය සහ එකතුකිරීම්				
ගොඩනැඟිලි	159,678,105	24,455,205	-	184,133,310
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	3,089,702	1,432,976	-	4,522,678
කාර්යාල උපකරණ	560,030	280,173	-	840,203
පරිගණක සහ උපාංග	3,410,607	1,178,516	-	4,589,123
මෝටර් රථ		2,368,619		2,368,619
මුළු ක්ෂයවීම	**166,738,444**	**29,715,489**	**-**	**196,453,933**

12.3 ශුද්ධ පොත් අගය	2019	2018
	රු.	රු.
පිරිවැය		
ගොඩනැඟිලි	880,387,385	904,842,590
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	3,412,675	4,845,651
කාර්යාල උපකරණ	670,882	921,976
පරිගණක සහ උපාංග	2,307,707	3,278,721
මෝටර් රථ	13,821,381	-
දේපළ,පිරියත සහ උපකරණ සඳහා මුළු ධාරණ අගය	**900,600,030**	**913,888,938**

13 අස්පෘෂ්‍ය වත්කම්

13.1 දළ අගය	**2019.01.01** දිනට ශේෂය	එකතුකිරීම්	බැහැරකිරීම්	**2019.12.31** දිනට ශේෂය
	රු.	රු	රු	රු
පරිගණක උපාංග		177,000	-	177,000
මහපොළ වෙබ් අඩවිය		697,500	-	697,500
ක්ෂය වූ වත්කම්වල මුළු අගය	-	**874,500**	-	**874,500**

13.2 සමුච්චිත හායනය සහ වැහැරීම්	**2019.01.01** දිනට ශේෂය	වර්ෂය සඳහා වෙන් කිරීම්	බැහැරකිරීම්	**2019.12.31** දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.
පරිගණක උපාංග		34,818	-	34,818
මහපොළ වෙබ් අඩවිය		131,473	-	131,473
ක්ෂය වූ වත්කම්වල මුළු අගය	-	**166,291**	-	**166,291**

13.3 ශුද්ධ පොත් අගය	**2019**	**2018**
	රු.	රු.
පරිගණක උපාංග	142,182	-
මහපොළ වෙබ් අඩවිය	566,027	-
අස්පෘෂ්‍ය වත්කම්හි එකතුකළ අගය	**708,209**	**-**

14 ආයෝජන වත්කම්	2019	2018
	Rs.	Rs.
සින්නක්කර ඉඩම (මාලබේ පිහිටි SLIIT ආයතනය වෙත බදු පදනම් මත ලබා දෙන ලද)	12,460,179	12,460,179
	12,460,179	**12,460,179**

සටහන: මාලබේ පිහිටි මෙම ඉඩම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට(SLIIT) දීර්ඝ කාලීන බදු පදනම් යටතේ ලබාදී ඇත.

15 පාලිත සමාගම්වල ආයෝජනය	2019	2018
	Rs.	Rs.
නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම	985,000,000	985,000,000
	985,000,000	**985,000,000**

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම 100% මහපොළ හිමිකාරීත්වය ඇති සමාගමක්

16 අනෙකුත් ආයෝජන	2019	2018
	Rs.	Rs.
සංවර්ධන ලොතරැයි මණ්ඩලය - ප්‍රාග්ධන ආයෝජන	2,200,000	2,200,000
	2,200,000	**2,200,000**

17 මූල්‍ය වත්කම්	2019	2018
	Rs.	Rs.
භාණ්ඩාගාර බැඳුම්කර	7,143,199,654	7,241,977,335
භාණ්ඩාගාර බිල්පත්	-	198,387,726
ණයකර	1,738,600,000	1,284,047,982
දේපල ඇප තැන්පතු	-	448,227,563
ස්ථාවර තැන්පතු	1,863,000,000	766,490,959
මූල්‍ය වත්කම් -FVPL		
ප්‍රති මිලදී ගැනීම්	-	290,111,232
BOC කළමනාකරණ ගිණුම-4079	2,381,392	984,911
	10,747,181,046	**10,230,227,708**

18 අනෙකුත් වත්කම්	2018	2017
	රු.	රු.
ස්ථාවර තැන්පතු (විශ්‍රාම පාර්තෝෂික ගිණුම)	3,172,760	2,173,542
ලිපිද්‍රව්‍ය	391,597	291,919
බදු කුලී තැන්පතු - ජයවර්ධන කේන්ද්‍රය	1,811,700	1,647,000
ස.තො.ස	348,810	348,810
	5,724,867	**4,461,271**

19 අත්තිකාරම් හා පෙර ගෙවීම්	2019	2018
	රු.	රු.
සේවක ණය හා අත්තිකාරම්	1,259,029	1,180,729
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	399,000	399,000
	1,658,029	**1,579,729**

20 ලැබිය යුතු ගිණුම්	2019	2018
	රු.	රු.
UGC දායකත්වය(භාණ්ඩාගාර දායකත්වය)	214,501,100	-
DLB කොටස් ලාභාංශ	75,000,000	100,700,127
ස්ථාවර තැන්පතු පොළී	185,380,223	10,809,227
භාණ්ඩාගාර බැඳුම්කර	229,230,149	43,827,663
ණයකර පොළී	63,431,406	-
බැංකු කෙටි කාලීන තැන්පතු පොළී	24,105	26,723
	767,566,984	**155,363,740**

21 මුදල් හා මුදල් සමාන වත්කම්	2019	2018
	රු.	රු.
ලංකා බැංකු ආයතන ශාඛාව ගිණුම් අංකය 1791	866,899	992,000
ලංකා බැංකු ආයෝජන බැංකු ශාඛාව ගිණුම් අංකය - 83302834	145,766	2,616,323
ලංකා බැංකු ගිණුම් අංකය - 83867162	47,355	-
කෙටිකාලීන තැන්පතු - ලංකා බැංකුව (Overnight Deposit)	137,100,000	137,000,000
	138,160,020	**140,608,323**

22 විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා බැඳීම	**2019** රු.	**2018** රු.
වර්ෂය ආරම්භයේ දී ශේෂය	3,172,760	2,173,542
වර්ෂය සඳහා ප්‍රතිපාදන	662,569	999,218
	3,835,329	**3,172,760**

23 උපචිත හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	**2019** රු.	**2018** රු.
ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්ව විද්‍යාල	441,644,815	109,966,050
ශිෂ්‍යත්ව ගෙවීම් - කාර්මික විද්‍යාල	15,632,400	27,785,500
ශිෂ්‍යත්ව ගෙවීම් - අනෙකුත් ආයතන	326,600	3,535,940
සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් සමාගම	-	556,200
වර්චුවල් හොස්ටින්	23,328	25,347
දුරකථන බිල්පත්	19,728	20,761
අතිකාල දීමනා	52,617	22,632
පැමිණීමේ දීමනා	98,000	174,125
පාසැල් සංවර්ධනය	1,074,097	1,074,097
වැටුප් හා වේතන	94,000	74,250
රඳවා ගැනීම්	1,547,409	1,547,409
රඳවා ගැනීම් - සාන්ත ආනා විද්‍යාලය	382,417	382,417
රඳවා ගැනීම් - සර් ජෝන් කොතලාවල විද්‍යාලය	243,503	243,503
පිහිනුම් තටාක වියදම් - ඇඹිලිපිටිය	585,449	585,449
ආරක්ෂක ගෙවීම්	48,000	39,132
වාර්ෂික නිවාඩු	272,261	235,307
විදුලි හා ජල බිල්පත්	43,482	37,395
භාෂා පරිවර්තන	40,275	
සේවක වියදම්	55,242	-
	462,183,623	**146,305,414**

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීසීඑම්2/එන්/එම්ටීඑන්/6/19/15

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2020 අගොස්තු 26 දින

HIGHER EDUCATION SCHOLARSHIP FUND
RECEIVED
27 AUG 2020

සභාපති

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

1.2.1 ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 17 හි ක්‍රම ක්ෂය අගයට ගන්නා මූල්‍ය වත්කම් (Financial Assets at Amortized Cost) යටතේ දක්වා ඇති එකතුව රු.3,601,600,000 ක් වූ ණයකර හා ස්ථාවර තැන්පතු ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 (SLFRS 09) ට අනුව ක්‍රම ක්ෂය අගයට (Amortized cost) දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 49 වන ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගැලපුම් සිදුකරන පෙර කාලඡේදවලට අදාළ ගැළපීම් සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළයුතු වුවත්, භාර අරමුදල විසින් ගලපන ලද එකතුව රු.42,955,902 ක්වූ පෙර කාලඡේදවලට අදාළ ගැළපීම් සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුව සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකරන ලද ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් භාර අරමුදල විසින් සම්බන්ධිත පාර්ශවයන් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම, නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම, නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමඟ සිදුකර තිබූ ගණුදෙනු හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු වුවත් එසේ පිලියෙළ කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේදී රු.12,460,179 ක් ලෙස ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලඹේ පිහිටි අක්කර 25 ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් වර්තමාන අගයට තක්සේරු කර පොත්වලට ගෙන නොතිබුණි.

(ඇ) මහපොළ භාර අරමුදල විසින් මාලඹේ පිහිටි SLIIT ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීමට හා අනෙකුත් වියදම් වෙනුවෙන් රු.408,500,000 ක් වැයකර තිබුණි. SLIIT ආයතනය විසින් එම මුදල නැවත මහපොළ භාර අරමුදල වෙත 2015 වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි. එසේ වුවද

ගොඩනැගිලිවල අයිතිය තහවුරුකර කර ගැනීමකින් හා වර්තමාන අගය පිළිබඳ නිවැරදි තක්සේරුවකින් තොරව භාර අරමුදල විසින් ගොඩනැගිලි වටිනාකම රු.1,064,520,695 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.2,381,392 ක් වුවද එදිනට බැංකු ශේෂ සනාථකිරීම් අනුව රු.2,407,963 ක් විය.

(ඉ) 2020 ජුනි මස 01 දිනැති ජනාධිපති අරමුදලේ PS/PF/5/36/Vol-ix/2020 ලිපිය පරිදි 2019 වර්ෂය සඳහා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් භාර අරමුදලට අදාළ ලාභ කොටස රු. 1,160,977,603 ක් වුවද භාර අරමුදල විසින් අදායම් ප්‍රකාශයේ වර්ෂයට අදාළ ආදායම රු.997,346,600 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයට අදාළ ආදායම ආදායම් ප්‍රකාශයේ රු.163,631,003 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) 2019 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු ලාභ කොටස ජනාධිපති අරමුදලින් දන්වා තිබූ පරිදි රු.185,289,003 ක් වුවද මූල්‍ය තත්ත්ව විස්තරයේ එය රු.75,000,000 ලෙස දැක්වීමෙන් ලැබිය යුතු ලාභය රු.110,289,003 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති වර්ෂය තුළ දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් වටිනාකම රු.16,426,582 ක් වුවද එහි සත්‍ය වටිනාකම රු.16,248,500 ක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ

බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින්

ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2.2 (අ),(ආ), (ඇ) යටතේ දක්වා ඇති නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
I. මුදල් රෙගුලාසි 103(1)(අ) හා 104 (3), (4)	අරමුදලට අයත් මෝටර් රථයක් 2019.05.20 දින හදිසි අනතුරකට ලක්වුවත් ඒ සම්බන්ධයෙන් මෙම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) කළමනාකරණ විගණන චක්‍රලේඛ	

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009/(1) දරන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අරමුදලේ ගනුදෙනු හා ක්‍රියාකාරීත්වය පිළිබඳ රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ද විගණනයක් සිදු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) සමුපකාර හා තොග වෙළඳ සංස්ථා ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගැනීම සඳහා තැබූ රු. 348,810ක කුළී තැන්පතු මුදල එම ගොඩනැගිල්ලෙන් ඉවත් වී දැනට වර්ෂ 3ක් ගතවුවද ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඉල්ලීම් කිරීමක් නොමැති බැවින් භාණ්ඩාගාර අනුමැතිය යටතේ ගිණුම්වලින් කපා හැරීමට කටයුතුකර නොතිබුණි.

4. ක්‍රියාකාරිත්වය සමාලෝචනය

(අ) අධ්‍යාපනය සැලසීම නිරත වන පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම, වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස, ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහයවීම, අධ්‍යාපනය සැලසීමේ නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලැසීම යන භාර අරමුදල් පනතේ 6.1 වගන්තියේ සඳහන් අනෙකුත්

අරමුණු ඉටුකිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අවධානය යොමුකර නොතිබුණි.

(ආ) භාර අරමුදල් පනතේ 6.2 (අ),(ඇ),(ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන ,තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීමට හා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීමට බලය භාර අරමුදලට ලැබී තිබූ නමුත් එවැනි මූලාශ්‍ර මඟින් අරමුදල් සපයා ගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි ශිෂ්‍යයන්ට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන දොරටු විවර කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ ආයතනයක් භාර අරමුදලේ දායකත්වයෙන් පිහිටුවීමට 1998 ජූලි 08 දිනැති අංක 98/995/11/052 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය දී තිබුණි. ඒ අනුව අන්තර්කාලීන කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමක් පිහිටුවීමටත් අන්තර් කාලය අවසානයේ මොරටුව විශ්ව විද්‍යාල යටතට ගැනීමටත් අභ්‍යන්තර හා අන්තර් ජාතික වාණිජ කටයුතු අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ "ශ්‍රී ලංකා" යන නාමය ද ඇතුළත් කරමින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම පිහිටුවා ඒ සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කරමින් සම්පත් දායකත්වය සැපයීමේ වගකීම මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) 2003 මාර්තු 19 වන දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම සමඟ එළඹී ගිවිසුම අනුව භාර අරමුදලට අයත් මාළඹේ ප්‍රදේශයේ පිහිටි අක්කර 25 ක භූමිය තුළ පිහිටවූ විශ්වවිද්‍යාලය අවුරුදු 8 ක කාලසීමාවකට කළමනාකරණය කිරීම සඳහා එම සමාගමට දී තිබුණි. එම ගිවිසුම් කාල සීමාව ඉක්මවීමට පෙර එනම් 2005 නොවැම්බර් 14 දින නැවත භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම අතර ගිවිසුමකට එළඹ ඇති අතර එහි දී මුල් ගිවිසුමෙන් භාර අරමුදල සමඟ එකඟ වී තිබූ අරමුදලට වාසි සහගත වූ පහත සඳහන් කොන්දේසි ඉවත් කිරීම හා සංශෝධනය සිදුකර තිබුණි.

ඉවත් කළ කොන්දේසි

- 4 (ඉ) වගන්තිය - SLIIT ආයතනයේ වෙනත් ශාඛාවන් හෝ භාර අරමුදලෙහි අරමුණුවලට අනුකූල නොවන වෙනත් කිසිදු වාණිජ අරමුණක් වෙනුවෙන්

මහපොළ විශ්ව විද්‍යාලයේ සියලුම වත්කම් හා ආදායම් සෘජුව හෝ වක්‍රව යොදා නොගත යුතු බව

- 4(ඌ) වගන්තිය - විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන සියලු කටයුතු භාර අරමුදලේ එකඟතාවය මත සිදුකළ යුතු බව
- 4(එ) වගන්තිය - අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමෙන් ලබන ආදායම් එකතුකිරීම හා විශ්ව විද්‍යාලයේ ශුභ සිද්ධිය උදෙසා අවශ්‍ය වියදම් දැරීම SLIIT ආයතනයේ වගකීමක් බව
- 4(ක) වගන්තිය - විශ්ව විද්‍යාලය පිහිටුවීමේ අරමුණ සඳහා භාර අරමුදල විසින් ජාතික සංවර්ධන බැංකුවෙන් (NDB) සැලකිය යුතු ණය මුදලක් ලබාගෙන ඇති බවට SLIIT ආයතනය අවබෝධ කරගත යුතු බවත් ආයතනය මූල්‍ය ශක්‍යතාවයෙන් හෙබි විට වාරික ගෙවීම සඳහා වූ සෑම ප්‍රයත්නයකටම SLIIT ආයතනය සහතික වන බව
- 4(ව) වගන්තිය- විශ්ව විද්‍යාලයේ කළමනාකරණය හා ගිණුම් පරීක්ෂාව හා අගය කිරීම සඳහා දක්ෂ කළමනාකරුවන් හා විගණකයන්ගෙන් සමන්විත ස්වාධීන පුද්ගල කණ්ඩායමක් පත්කිරීමේ අයිතිය හා අලුතෙන් හඳුන්වාදිය හැකි නව පාඨමාලා පිළිබඳ ඇගයීම සඳහා සුදුසුකම් ලත් උගතුන් හා දක්ෂ පුද්ගලයන්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීමේ අයිතිය භාර මණ්ඩලය සතු වන බව
- 4(ඩ) වගන්තිය - භාර මණ්ඩල තීරණයට අනුව මාලඹේ විශ්ව විද්‍යාලය මහපොළ කැම්පස් ලෙස නම් කිරීම, නව ශ්‍රවණාගාරය ලලිත් ඇතුලත් මුදලි ශ්‍රවණාගාරය ලෙස නම් කිරීම හා මෙම නාම පුවරු පැහැදිලිව පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කිරීම කළ යුතු බව
- 4(ප) වගන්තිය - කාලය ඉකුත්වීම හේතුවෙන් හෝ වෙනත් ආකාරයකින් මෙම ගිවිසුම අවසන් වන අවස්ථාවේදී, භාර අරමුදල විසින් මූල්‍යයනය කරන ලද වත්කම් භාර අරමුදලෙහි දේපල ලෙස පැවතිය යුතු බව

සංශෝධනය කළ කොන්දේසි

- 2003 මාර්තු 19 වන දිනැති නෛතික ගිවිසුමේ 4(ඔෘ) වගන්තිය අනුව පැවති, එකඟ වූ කළමනාකරණ ගාස්තුව අඩු කිරීමෙන් පසු විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරකම් තුළින් ජනිත වන ආදායමහි අතිරික්තය ඊළඟ වර්ෂයේ ජූනි 30

දිනට පෙර භාර අරමුදලට බැර කළ යුතු බව හා භාර අරමුදලෙහි භාරකාර මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව අනිකුත් ආයෝජනයන් නොකළ යුතු බව. එසේ වුවද විශ්ව විද්‍යාලයේ අනාගත සංවර්ධනය සඳහා සංචිත ගිණුමක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාර අරමුදලෙහි භාරකාර මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටිය හැකි අතර එවැනි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මුදල භාර අරමුදල විසින් මෙම සංචිත ගිණුමෙන් ලබාදිය හැකි බව වෙනුවට නව ගිවිසුම මඟින් භාර අරමුදලට අයත් භූමිය බදුකුලී පදනම මත ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට බද්දට දීමට තීරණය කර තිබූ අතර ගිවිසුමේ 5(අ)(i) වගන්තිය අනුව වාර්ෂික බදු කුලිය ලෙස රු.මිලියන 8 ක් හෝ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 20 යන අගයන් දෙකෙන් වැඩි අගය ගෙවිය යුතු බවට එකඟතාවයට පත්ව තිබුණි.

- භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අතර 2003 මාර්තු 19 වන දින ඇති වූ ගිවිසුමේ 4(ඕ) වගන්තිය අනුව විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් වූ සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ කිරීමේ අයිතිය භාර මණ්ඩලයට නියම වූ අතර විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන සියලු කටයුතු භාර අරමුදලේ එකඟතාවය මත සිදුකළ යුතු විය.එසේ වුවද භාර අරමුදල හා SLIIT ආයතනය අතර 2005 නොවැම්බර් 14 වන දින ඇතිවූ දෙවන ගිවිසුමේ 4(ඉ) සහ 4(ඊ) වගන්තිවලට අනුව SLIIT ආයතනයෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව තීරණය කරනු ලබන ආකාරයට මෙම විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමටද, ඒ අනුව වක්‍රලේඛ පිළියෙල කිරීම, විභාග පැවැත්වීම සඳහා සූදානම් කිරීම, සිසුන් බඳවා ගැනීම, අධ්‍යයන කාර්යය මණ්ඩලය සේවයේ යෙදවීම, කළමනාකරණය හා යටිතල පහසුකම් නඩත්තුව SLIIT ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි සිදුකිරීමට ද ප්‍රධාන ඉදිකිරීම්වලදී පමණක් භාර අරමුදලෙහි අනුමැතියට යටත්ව කටයුතු කළ යුතු බවට එකඟත්වයට පත්ව තිබුණි.

(ii) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදල විසින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගමට සිදුකරන ලද වියදම් ලෙස රු.373,579,392 ක ආයෝජන වටිනාකමට සරිලන මුදලක් නැවත අරමුදල වෙත ලබාදීම හා එමගින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම, හාර අරමුදලින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම අතර SLIIT ආයතනය ඉදිකර ඇති ඉඩම වෙනුවෙන් ඇති කරගත් කල්බදු ගිවිසුම ලෙස ගිවිසුම් දෙකකට 2015 මැයි 12 දින එළඹ තිබුණි.

උක්ත ගිවිසුම් දෙක මගින් 2003 මාර්තු 19 වන දින ඇති කර ගත් මුල් ගිවිසුම හා 2005 නොවැම්බර් 14 දින ඇති කර ගත් ගිවිසුමෙන් හාර අරමුදලට වාසිසහගත වූ කොන්දේසි තවදුරටත් ඉවත් කර පහත සඳහන් නව කොන්දේසි එක් කර තිබුණි.

- හාර අරමුදල විසින් සිදුකළ ආයෝජන වටිනාකම ලෙස රු.373,579,392 ක් හා මහපොළ නමින් ලබාදුන් ශිෂ්‍යත්ව වටිනාකම සහ අනෙකුත් අනුෂාංගික වියදම් ආවරණය කිරීම සඳහා හාර අරමුදලට රු.408,500,000 ක මුදලක් ලබා දෙන බවත් ඉන් පසු මහපොළ අරමුදල හා SLIIT ආයතනය අතර කිසිදු මූල්‍යමය බැඳියාවක් නොමැති බව හා SLIIT ආයතනය මහපොළ අරමුදලින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාකරන බව
- SLIIT ආයතනය කිසිදු ගිණුම්කරණ ප්‍රමිතියකට, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියකට හෝ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතියකට යටත් නොවන අතර මහපොළ අරමුදල වෙත ගිණුම් වාර්තා ලබා දීමට හෝ 2015/2016 වර්ෂයේ සිට ගිණුම් ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවලින් නිදහස් කර ඇති බව
- 2015 මැයි 15 සිට 2075 මැයි 14 වන තෙක් අවුරුදු 60 ක් SLIIT ආයතනය පිහිටා ඇති මාළඹේ ඉඩම අවුරුදු 5කට වරක් වාර්ෂික බදු කුලිය වැඩිවන පදනමින් බදු දීම හා ඒ අනුව 2020 මැයි 14 න් අවසන් වන අවුරුදු 5 සඳහා වාර්ෂිකව රු. මිලියන 20 බැගින් ද වන පරිදි 2070 මාර්තු 15 සිට 2075 මාර්තු 14 න් අවසන් වර්ෂ 5 සඳහා වාර්ෂිකව රු. මිලියන 40 බැගින් වන පරිදි බදු කුලී ගෙවීමට බැඳී ඇති බව
- මහපොළ අරමුදලේ භිමිකාරිත්වය සතු SLIIT ආයතනය වෙත බදු දී ඇති මාළඹේ පිහිටා ඇති ඉඩම හෝ එහි කොටසක් උප බදු දීම, උකසට තැබීම සඳහා මහපොළ අරමුදලේ කිසිදු ලිඛිත අවසරයක් අවශ්‍ය නොවන බව

- SLIIT ආයතනයට ඔවුන්ගේ වියදමින් අදාළ භූමි පරිශ්‍රය තුළ ගොඩනැගිලි ඉදිකිරීම, යන්ත්‍රෝපකරණ සවිකිරීම හෝ අදාළ භූමිය ප්‍රතිසංස්කරණ, වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කිරීමට අවසර ලබා දී ඇති බව

(iii) 2005 නොවැම්බර් 14 දින ඇතිකර ගිවිසුම අනුව 2015 මැයි 12 වන විට හිඟ හිටි බදු කුළිය රු.98,642,356 ක් ව තිබියදී 2015 මැයි 12 දින සමාගම සමඟ නව කල්බදු ගිවිසුමකට එළඹ තිබූ අතර, මුල් ගිවිසුමට අනුව 2015 වර්ෂයේ දී භාර අරමුදලට ලබාගත හැකිව තිබූ රු. 45,358,379 ක බදු කුලිය රු. 20,000,000 දක්වා අඩු වී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයකින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් භාර අරමුදලට අවාසි සහගත වූ මෙවැනි ගිවිසුම්වලට එළඹීම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් සිදු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(iv) තවද 2017 මැයි 04 දිනැති අංක අමප/17/0956/701/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය රජයට අයත් නොවන, ස්වාධීන තීරණ ගැනීමේ හැකියාව ඇති ආයතනයක් ලෙස පිළිගැනීමට සහ එම ආයතනය කිසිදු අමාත්‍යාංශයක විෂය පථය යටතට නොගැනෙන පරිදි අමාත්‍යවරුන්ගේ විෂයන් හා කාර්යයන් පැවරීමට අදාළ ගැසට් නිවේදනයෙන් මෙම ආයතනයේ නාමය ඉවත් කිරීමටත් අනුමැතිය ලබාදී තිබුණි.

(v) තව ද 2015 එළඹී ගිවිසුම නීතියානුකූල නොවන බවට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිසම යටතේ විමර්ශන 2 ක් විභාග වෙමින් පැවැති අතර 2019 ජූලි 12 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම්කාරක සභා රැස්වීමේ දී SLIIT ආයතනය සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ භාර අරමුදලේ සභාපති වෙත දන්වා තිබූ අතර 2019 අගොස්තු 02 දින එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ නමුත් එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2018 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/18/1873/824/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව භාර අරමුදල නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ එළඹී ආයෝජන කළමනාකරණ ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව 2019 පෙබරවාරි 28 දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් විසින් කළමනාකරණය කරන ලද ආයෝජන කළඹ ලංකා බැංකු ආයතනික ශාඛාවේ මහපොළ භාර අරමුදල සතු ප්‍රධාන ගිණුම වෙත මාරු කර තිබුණි. තවද එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඇවර කිරීම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම විකිණීම සිදුකල යුතු වුවත් එම කටයුතු මේ දක්වා සිදුකර නොතිබුණි.

ඩබ්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති

විගණන පිළිතුරු

1.4.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 17 හි ක්‍රම ක්ෂය අගයට ගන්නා මූල්‍ය වත්කම් (Financial Assets at Amortized Cost) යටතේ දක්වා ඇති එකතුව රු.3,601,600,000 ක් වූ ණයකර හා ස්ථාවර තැන්පතු ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 (SLFRS 09) ට අනුව ක්‍රම ක්ෂය අගයට (Amortized cost) දක්වා නොතිබුණි.	නව	පද්ධතිය හඳුන්වා දිය යුතුය	රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ක්‍රම ක්ෂය ක්‍රමයට පෙන්වීම අනිවාර්ය නොවේ.	භාර අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සඳහන් පරිදි අරමුදලේ ගිණුම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව පිළියෙල කළ යුතුය.	රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (Public Sector Accounting stranded – 10 අනුව එලෙස ක්‍රම ක්ෂය ක්‍රමයට පෙන්වීම අනිවාර්යනොවන බව දක්වා ඇති හෙයින් එසේ ණය හා ස්ථාවර තැන්පත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 අනුව ගිණුම්වල දක්වා නැත. ඉදිරියේදි ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති අනුව අදාල ගැලපුම් සිදුකරනු ලැබේ.
(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි පරිච්ඡේද 49 අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගැලපුම් සිදුකරන පෙර කාලඡේදවලට අදාළ ගැළපීම් සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළයුතු වුවත්, භාර අරමුදල විසින් ගලපන ලද එකතුව	නව	පද්ධතිය හඳුන්වා දිය යුතුය	ඉදිරියේදී පෙර වර්ෂයේ කරන ලද වැරදි සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව පෙර කාලඡේදවලට අදාළ ගැළපීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල	භාර අරමුදල ගිණුම්වල ගලපන ලද රු.42,955,902/- පෙර වර්ෂ ගැලපීම ඇතුලත NWCL මඟින් ලද ආයෝජන පැවරීමේදී මහපොළ අරමුදල ගිණුම්ගත කල ආයෝජන වටිනාකම හා සත්‍ය වශයෙන් NWCL

රු.42,955,902 ක්වූ පෙර කාලඡේදවලට අදාළ ගැළපීම් සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.				හෙළිදරව් කළ යුතුය.	මඟින් මහපොළ අරමුදල වෙත ආපසු භාර දුන් ආයෝජන වටිනාකම අතර වෙනස වන රු.41,410,638/02 ඇතුලත් වන අතර මෙයට ප්‍රධාන හේතුව වශයෙන් පසුගිය වර්ෂවල ශේෂ තහවුරුව කිරීමේදී NWCL විසින් ආයෝජන වලට ලද පොළී ආදායම සැලකිල්ලට නොගෙන ශේෂ තහවුරු කිරීමයි. මෙය පෙර වර්ෂවල මහපොළ අරමුදල විසින් කල වරදක් ලෙස දැක්වීමට එකඟ නොවන අතර ඉදිරියේදී පෙර වර්ෂයේ කරන ලද වැරදි සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුව සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකරන ලද ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් භාර අරමුදල විසින් සම්බන්ධිත පාර්ශවයන් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම, නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම, නැට්වෙල්ත් සිකියුරිටීස්	නව	පද්ධතිය හඳුන්වා දිය යුතුය	භාර අරමුදලට සම්බන්ධිත පාර්ශව වශයෙන් හඳුනාගෙන ඇති සියලු ආයතන මහපොළ භාර අරමුදලේ උප සමාගම් හා පාලිත සමාගම් වේ. එබැවින් එම ගණුදෙනු සම්බන්ධිත පාර්ශව	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.	භාර අරමුදලට සම්බන්ධිත පාර්ශව වශයෙන් හඳුනාගෙන ඇති සියලු ආයතන මහපොළ භාර අරමුදලේ උප සමාගම හා පාලිත සමාගම් වේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ

සමාගම හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමඟ සිදුකර තිබූ ගනුදෙනු හෙළිදරව් කර නොතිබුණි.			අතර ගණුදෙනුවක් වශයෙන් වර්ගීකරණය කළ නොහැක.		ආයතනය සමඟ මහපොළ අරමුදල ගනුදෙනු සිදු නොකරන අතර එම ආයතනවල ලාභාංශ පමණක් මහපොළ අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබේ. මෙම ලැබීම් ගිණුම් ප්‍රකාශවල පැහැදිලිව සඳහන් කොට ඇත. 2019 වර්ෂයේ NWCL හා NWSL සමඟ සෘජු ගනුදෙනු සිදුකොට නැත. මහපොළ අරමුදල විසින් භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගෙන ඇති අතර එසේ අනෙකුත් ප්‍රාථමික ගනුදෙනුකරුවන් මඟින් ද මිල ගණන් කැඳවා ප්‍රශස්ථ මිල ඉදිරිපත් කරන ප්‍රාථමික ගැනුම්කරුවන්ගෙන් මිලදී ගැනීම් සිදුකරනු ලැබේ. ඒ අනුව එම ගනුදෙනු මහබැංකුවේ ගිණුම හරහා සෘජුවම ලංකා බැංකුවේ මහපොල ගිණුම වෙත සිදුකරන බැවින් එය සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනුවක් වශයෙන් වර්ගීකරණය කල නොහැක.

1.4.3 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
(අ) 2005 වර්ෂයේදී රු.12,460,179 ක් ලෙස ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලඹේ පිහිටි අක්කර 25 ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් වර්තමාන අගයට තක්සේරු කර පොත්වලට ගෙන නොතිබුණු අතර ඉඩම හා එහි ඇති සියලුම ගොඩනැගිලි උපකරණවලට අදාළව තක්සේරු වාර්තාවක් ලබාදෙන ලෙස 2020 මැයි 24 දින රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ඉල්ලීමක් කර තිබුණි. මෙහිදී ගොඩනැගිලිවල අයිතිය නිරවුල් කර ගැනීමකින් සහ වර්තමාන අගය පිළිබඳ නිවැරදි තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව භාර අරමුදල විසින් ගොඩනැගිලි වටිනාකම රු.1,064,520,695 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩි දියුණු කල යුතුය	රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ලැබුණු පසු ගොඩනැගිලිවල වර්තමාන වටිනාකම ගිණුම්වලට ගනු ලැබේ.	ගොඩනැගිලිවල අයිතිය නිරවුල් කරගෙන සහ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් පසු නිවැරදි අගයන් පොත්වලට ගත යුතු වේ.	මහපොළ භාර අරමුදල සතු මාලඹේ පිහිටි අක්කර 25 ක ඉඩම හා ගොඩනැගිල්ලේසමාලෝචිත වර්ෂය වන විට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයයේ පාලක මණ්ඩලය සමඟ බදු ගිවිසුම හා කළමනාකරණ ගිවිසුමක් යටතේ (වර්ෂ 60 ක් සඳහා) ලබාදී තිබුණි. මහපොළ භාර අරමුදලේ භාරකාර මණ්ඩල නිසි අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ ඉහත සඳහන් වත්කම් පැවරීමේ ගිවිසුමක් හා දීර්ඝ කාලීන බදු ගිවිසුමක් අත්සන් කොට තිබූ අතර ඉඩම සඳහා තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබූ බැවින් පොදු ව්‍යාපාර ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා කල පරිදි මෙම ඉඩම හා ගොඩනැඟිලි සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට තීරණය වූ අතර එය

					ගිණුම්කරණ අඩුපාඩුවක් ලෙස සැලකීම නිවැරදි නොවේ. 2019.10.11 – මේ වනවිට උසස් අධ්‍යාපන, තාක්ෂණ නවොත්පාදන අමාත්‍යාංශය විසින් උක්ත මහපොළ වත්කම් සම්බන්ධව තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇත
(ආ) 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.2,381,392 ක් වුවද එදිනට බැංකු ශේෂ සනාථකිරීම් අනුව රු.2,407,963 ක් විය.	නව	පවත්නා පද්ධතිය වැඩි දියුණු කල යුතුය	බැංකුව 2019 දෙසැම්බර් 28 දිනට ශේෂය දක්වා ඇත.	වෙනසට හේතු සොයා අවශ්‍ය ගැලපීම් කළ යුතුය.	අංක 4079 - ලංකා බැංකු ගිණුමේ 2019.12. 28 සිට 2019. 12.31 දක්වා සිදුකරන ලද ගනුදෙනු බැංකුව විසින් නොසලකා 2019.12.28 දිනට ශේෂය 2019.12.31 දින ශේෂය වනසේ බැංකු ශේෂ තහවුරු කිරීම සිදුකර ඇත. මෙය බැංකුව විසින් කරන ලද වරදක් බවත් එය පසුව නිවැරදි කර ඇත.

(ඇ) 2020 ජුනි මස 01 දිනැති ජනාධිපති අරමුදලේ PS/PF/5/36/Vol-ix/2020 ලිපිය පරිදි 2019 වර්ෂය සඳහා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් භාර අරමුදලට අදාළ ලාභ කොටස රු. 1,160,977,603 ක් වුවද භාර අරමුදල විසින් අදායම් ප්‍රකාශයේ වර්ෂයට අදාළ ආදායම රු.997,346,600 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයට අදාළ ආදායම රු.163,631,003 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් භාර අරමුදලට අදාළ ලාභ කොටස ජනාධිපති අරමුදල විසින් 2020.02.28 දින වන විටත් තහවුරු කර නොමැති බැවින් අදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට නොහැකි විය.	මහපොළ භාර අරමුදලට හිමි ලාභ කොටස මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර තහවුරු කර ගැනීමට සහ ගණනය කර ගැනීමට කටයුතු කළ යුතුය.	ජනාධිපති අරමුදල විසින් 2019.12.31 දිනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාර්ථ භාර අරමුදලට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල කොතෙක්දැයි ශේෂ තහවුරු කිරීමේ ලිපියක් 2020.01.07 දින යැවූ අතර 2020.02.28 දින වන විටත් එම ශේෂ තහවුරුව කර නොතිබුණි. ඒ අනුව මහපොළ ශිෂ්‍යාර්ථ භාර අරමුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභාංශ ලෙස ගිණුම්වල ගිණුම්ගත කොට ඇත්තේ 2019.12.31 දින වන විට අදාල වනසේ ලැබූ මුදල රු. 997,346,600/- ක් පමණක් වන අතර 2020 ජුනි 01 දින ජනාධිපති අරමුදල විසින් එවන ලද වාර්තාවේ සඳහන් පරිදි තවදුරටත් 2019 වර්ෂය සඳහා මහපොළ අරමුදලට ලැබිය යුතු ආදායම ලෙස රු.185,289,003/50 සටහන්ව ඇත. ඒ අනුව මෙම ශේෂ තහවුරු කිරීම 2019 අවසන් ගිණුම් සකස් කොට අවසන් වූ පසු ලැබුණු බැවින් රු.110,289,003/- ක ආදායම ගිණුම්ගත කල නොහැකි විය. මෙය ඉදිරියේදී ගිණුම් වල ගැලපීම සිදුකරනු ලැබේ.	

(ඈ)	2019 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු ලාභ කොටස ජනාධිපති අරමුදලින් දන්වා තිබූ පරිදි රු.185,289,003 ක් වුවද මූල්‍ය තත්ත්ව විස්තරයේ එය රු.75,000,000 ලෙස දැක්වීමෙන් ලැබිය යුතු ලාභය රු.110,289,003 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් 2019.12.31 දිනට භාර අරමුදලට ලැබිය යුතු ලාභ කොටස ජනාධිපති අරමුදල විසින් 2020.02.28 දින වන විටත් තහවුරු කර නොමැති බැවින් ලැබිය යුතු ශේෂය නිවැරැදිව ගිණුම්ගත කිරීමට නොහැකි විය.	මහපොළ භාර අරමුදලට ජනාධිපති අරමුදලින් එවා නොමැති ලාභ කොටස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර ගණනය කර ගැනීමට කටයුතු කළ යුතුය.	2019.12.31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු ලාභාංශ මුදල තහවුරු කරන මෙන් ඉල්ලීම් කර තිබුණත් ජනාධිපති අරමුදල මඟින් එය තහවුරු කිරීමට 2020.02.28 දින දක්වාත් අපොහොසත් විය. එබැවින් මෙය නිවැරදිව ගිණුම්ගත කිරීමට නොහැකිවිය. එනම් 2020.02.28 දිනට පෙර රු.75,000,000 විගණකාධිපති අරමුදල විසින් මහපොළ ගිණුමට බැර කල අතර එය 2019 වර්ෂයට අදාල බව ජනාධිපති අරමුදල මගින් ද, දැනුම් දුන් බැවින් එම ප්‍රමාණය 2019.12.31 දිනට ලැබිය යුතු වශයෙන් ගිණුම් ගතකොට ඇත.
(ඉ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති වර්ෂය තුළ දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් වටිනාකම රු.16,426,582 ක් වුවද එහි සත්‍ය වටිනාකම රු.16,248,500 ක් විය.	නව	පද්ධතිය හඳුන්වා දිය යුතුය.	එකඟ වේ. මෙය පෙර වර්ෂ ගැළපීම්වලදී සිදුවූ ගිණුම්කරණ දෝෂයක් බවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශ තුළ ගැළපීම්වලින් ඉවත් වේ. ඉදිරියේදී මෙවැනි ගිණුම්කරණ දෝෂ හැකිතාක් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි අගයන් ඊට ඇතුළත් කළ යුතුය.	එකඟ වේ. මෙය පෙර වර්ෂ ගැලපීම් වලදී සිදුවූ ගිණුම්කරණ දෝෂයක් බවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශ තුල ගැලපීම් වලින් ඉවත් වේ. ඉදිරියේදී මෙවැනි ගිණුම්කරණ දෝෂ හැකිතාක් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

1.4.4 ඒකාබද්ධ කිරීම

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩි දියුණු කල යුතුය	2019 ජූලි 12 දින පැවති COPE කමිටුවේදී 2019 වර්ෂයේ සිට ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට ලද අනුමැතිය අනුව ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය යටතේ විගණන සමාගමක් වෙත භාර දී ඇත.	2013 වර්ෂයේ සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට කඩිනමින් ඉදිරිපත් කල යුතුය.	භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කොට ඇති අතර මහපොල භාර අරමුදලේ ගිණුම් සමඟ ඒකාබද්ධ කොට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 2012 වර්ෂය දක්වා ඉදිරිපත් කොට තිබුණි. 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට ප්‍රමාද වීමට ප්‍රධාන හේතු වශයෙන් මහපොළ අරමුදලේ පූර්ණ හිමිකාරීත්වය ඇති සමාගමක් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ඇපයෙන් සීමිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන මහපොළ භාර අරමුදලට ලබා නොදීම විය. මෙය පිළිබඳව විගණකාධිපතිවරයා දැනුවත් කොට තිබුණි. මේ සම්බන්ධව 2019.07.12 දින පැවති 2018 වර්ෂය සඳහා වූ පොදු ව්‍යාපාර

					ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා කල අතර 2019 වර්ෂයේ සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට තීරණය කරන ලදී.කෙසේ වෙතත් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ ඒකාබද්ධ ගිණුම් පිළියෙළ කිරීම අතහැර ඉහත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම සමඟ පමණක් ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම සඳහා වන අනුමැතිය 2019 වර්ෂයේදී ලැබුණි. ඒ අනුව දැනට ඒකාබද්ධ ගිණුම් පිළියෙළ කිරීම සඳහා භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ විගණන සමාගමක් වෙත භාරදී ඇත. එය හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරඇත.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
සමූපකාර හා තොග වෙළඳ සංස්ථා ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගැනීම සඳහා තැබූ රු. 348,810 ක කුළි තැන්පතු මුදල එම ගොඩනැගිල්ලෙන් ඉවත් වී දැනට වර්ෂ 3ක් ගතවුවද තැන්පතු මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩි දියුණු කල යුතුය.	2017.11.29 දින හා 2018.04.04 දින ස.තොස ආයතනය වෙත ලිඛිත ඉල්ලීම් කර ඇතත් එම ආයතනය විසින් කුළි තැන්පතුව ආපසු ගෙවා නොමැත.	තැන්පතු මුදල කඩිනමින් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ස.තොස .ගොඩනැගිල්ල සඳහා ව.අ 1661 .රු 70. බැගින් වාර්ෂික බදු කුලිය යටතේ මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් 2011වර්ෂයේදී ලබාගෙන තිබූ අතර මේ සඳහා මාස 3ක බදු කුලී අත්තිකාරම් වශයෙන් විගණන විමසුමේ සඳහන් රු.ල -/348,810.ක මුදල ලංකා බැංකු චෙක්පතක් මගින් 2011.06.26දින ස.තොස.ආයතනය ගෙවා ඇත 2017 .වර්ෂයේ මහපොළ කාර්යාලය ස.තොස .ගොඩනැගිල්ලේ සිට කොළඹ 07 ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයට ගෙන යන ලද අතර ඉහත ගෙවන ලද අත්තිකාරම ආපසු ගෙවන ලෙස 2017.11.29දින හා 2018.04.04වන දින ලිඛිත ඉල්ලීම් 2ක් ස.තොස .ආයතනය වෙත ඉදිරිපත් කල අතර මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් පියවීම ස.තොස .ආයතනය විසින් සිදු කොට නොමැත . කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු තෙරතුරු ස.තොස .ආයතනයට බාරදී ඇති අතර මෙම අත්තිකාරම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

1.5.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් සමාලෝචිත වර්ෂයේදීද ගෙන නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	ස.තො.ස ආයතනය යටතේ පිහිටුවා තිබූ සී.ඩබ්.ඊ.කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරිං (පුද්ගලික) සමාගම වසා දමා ඇති බැවින් හා භාර අරමුදල හා මෙම සමාගම අතර ක්‍රොන්ත්‍රාත් ගිවිසුමක් නොමැති බැවින් එම ආයතනය සඳහා ගෙවීම් භාර අරමුදල මඟින් සිදුකළ නොහැක. ඒ අනුව භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ මෙම ගෙවිය යුතු ශේෂය ඉදිරියේදී ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරනු ඇත.	භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ කඩිනමින් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	මහපොළ අරමුදල යටතේ වූ පාසල් සංවර්ධන අරමුදල මගින් පාසල් සංවර්ධන කටයුතු සිදු කල අතර ඒ සම්බන්ධව සියලුම කොන්ත්‍රාත් ස.තො.ස .ආයතනය යටතේ පිහිටුවා තිබූ සී.ඩබ්.ඊ.කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරිං (පුද්) සමාගම හරහා සිදු කරන ලදී .මේ සම්බන්ධයෙන් අදාල කොන්ත්‍රාත් කරුවන් විසින් අවශ්‍ය බිල්පත් ඉදිරිපත් කර තිබූ නමුත් ඒවා අසම්පූර්ණ බිල්පත් විය .ඊට අමතරව මෙම ගෙවීම් සම්බන්ධයෙන් අවසන් කල වැඩ පිළිබඳ වාර්තාවක් හා ඉංජිනේරු නිර්දේශයන් හා ප්‍රමාණ සම්බන්ධයෙන් වාර්තා ලබාගත යුතුව ඇත .දැනට ස.තො.ස .ආයතනය යටතේ පිහිටුවා තිබූ ඉහත කොන්ත්‍රාත් සම්බන්ධීකරණය කල සමාගම වසා දමා ඇති බැවින් මෙම ගෙවීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකල නොහැකි තත්වයකට පත්ව ඇත .අදාල පාර්ශවයන් විසින් ද සමාලෝචිත වර්ෂයේදී මෙම බිල්පත් ගෙවීමට අදාල ලිඛිත ඉල්ලීම් මහපොළ අරමුදල වෙත ඉදිරිපත් කොට නැත .කෙසේ වෙතත් මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව ගිවිසුම්

					මහපොළ අරමුදල සමඟ අදාල කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුමකට ඒළඹී නැති අතර ඒම ආයතන වලට සම්බන්ධ ගෙවීම් මහපොළ අරමුදල මගින් සිදු කිරීමට හැකියාවක් නොමැත. ඒ අනුව ඉදිරියේදී මහපොළ භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ඉහත ගෙවිය යුතු ශේෂය වශයෙන් දක්වා ඇති රු -/3.832.875.මුදල ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරනු ඇත .

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.755,972,796 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.451,560,612 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.304,412,184 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අයෝජන ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.978,316,002 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
(අ) අධ්‍යාපනය සැලසීම නිරත වන පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම, වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස, ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහයවීම, අධ්‍යාපනය සැලසීමේ නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය.	ඉදිරියේ දී අරමුදලේ මූල්‍ය තත්වය ස්ථාවර වූ විට මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරනු ඇත.	පනතේ සඳහන් මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය.	මහපොළ හාර පනතේ 06(i) වගන්තියේ සඳහන් අරමුණු යටතේ විගණන විමසුමේ සඳහන් කරුණු නිවැරදි වන අතර එම අරමුණු ඉටු කර ගැනීමට අදාල ක්‍රියා මාර්ග නිතරම මහපොළ අරමුදල විසින් ගනු ලැබේ. ඒ අනුව මෙය අරමුදලේ අකාර්යක්ෂමතාවය වශයෙන් දැක්වීම නිවැරදි නොවේ. 1999 දි ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය ආරම්භ කල අතර අද එය ඉතා සාර්ථකව තොරතුරු තාක්ෂණ අංශයෙන් උපාධි ලබා දෙන ආයතනයක් බවට පත් වී ඇත. වර්තමානයේ විශ්ව විද්‍යාල වලට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව ඉහළ නැංවීමට අනුව ලබා දෙන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව වාර්ෂිකව වැඩි කිරීමට සිදු වී ඇත. එසේම කාර්මික විද්‍යාල හා අනිකුත් උසස් අධ්‍යාපන ආයතන ලබා දෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා ශිෂ්‍යත්වයේ වටිනාකම වැඩි කිරීම සඳහා විශාල ඉල්ලිම් ප්‍රමාණයක් ලැබී ඇත. අරමුදලේ වර්තමාන ශේෂය හා සියලුම ආයෝජන රජයේ භාණ්ඩාගාර බිල්පත් බැදුම්කර වල හා ස්ථාවර තැන්පත් වලින් පමණක් ආයෝජනය කිරීම තුළින් යම් යම් සීමාවන් ආයෝජනය කෙරෙහි බලපා ඇත.

නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලැසීම යන භාර අරමුදල් පනතේ 6.1 වගන්තියේ සඳහන් අරමුණු ඉටුකිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අවධානය යොමුකර නොතිබුණි.					2019 වර්ශයේදි අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය හා ආදායම 16%න් පමණ ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත් දැනට අරමුදලේ මූල්‍ය තත්වය අනුව නව වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටු වීම හෝ පවත්වාගෙන යාම මහපොළ අරමුදලේ අතිරේක ප්‍රාග්ධනය ඒ සඳහා යෙදවීම අපහසු වී ඇත. ඉදිරියේදි අරමුදලේ මූල්‍ය තත්වය ස්ථාවර වූ විට අරමුදලේ ස්ථාපිත අරමුණු 6(i) යටතේ සාක්ෂාත් කර ගැනිමට කටයුතු කරනු ඇත.

(ආ) භාර අරමුදල් පනතේ 6.2 (අ),(ඇ),(ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන , තෑගී හෝ පරිත්‍යාග භාර ගැනීමට හා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීමට බලය භාර අරමුදලට ලැබී තිබූ නමුත් එවැනි මූලාශ්‍ර මඟින් අරමුදල් සපයා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය.	කටයුතු කරමින් පවතී.	අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	භාර අරමුදල් පනතේ 6.2 (අ),(ඇ),(ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් හා ද්‍රව්‍ය වලින් ප්‍රධාන තෑගි පරිත්‍යාග ලබා ගැනීමට භාර අරමුදල නිතරම කටයුතු කරන අතර පහත සඳහන් ක්‍රියා මාර්ග සමාලෝචිත වර්ෂයේදී භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ගන්නා ලදි. (i). මහපොළ අරමුදල සඳහා ප්‍රධාන කාර්යාලය පිහිටුවීමට ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් දානපතියෙකුගේ පරිත්‍යාගයක් වශයෙන් ලබා ගැනීමට අවශ්‍ය භාරකාර මණ්ඩල අනුමැතිය ලැබුණු අතර අදාල පුවත් පත් දැන්වීම් පළ කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කර ඇත. ඉතා ඉක්මනින් අදාල දැන්වීම පළ කොට එය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. මේ තුළින් දැනට වාර්ෂිකව ගෙවනු ලබන බදුකුළි රු.මි.5ක් පමන අරමුදලට ඉතිරිකර ගැනීමට හැකිවනු ඇත. (ii). 1982 සිට මේ දක්වා ශිෂ්‍යත්වලාභීන් තුන් ලක්ෂයක් (300,000.00) පමන සිටින අතර ඔවුන් විවිධ වෘත්තිය වල යෙදෙන අතර බොහෝ දෙනෙක් විදේශගත රැකියා වල නිරත වී සිටි. සමාලෝචිත වර්ෂයේදී භාරාකාර මණ්ඩල තිරණයක් අනුව ඔවුන් සියලු දෙනා ගෙන්ම යම් පරිත්‍යාග මුදලක් මහපොළ අරමුදල ශක්තිමත් කිරීම සඳහා ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සංවිධානය කල අතර ඔවුන්ගේ සියලුම තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කොට යාවත්කාලින කිරීම ආරම්භ කර ඇත. ඉතා කෙටි කාලයක් තුල මේ සම්බන්ධයෙන් පුවත් පත් දැන්වීම් මගින්, ජනමාධ්‍ය මගින් හා ලිපි මගින් ඔවුන් දැනුවත් කොට පරිත්‍යාග මුදල් ලබා ගැනීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. මේ සම්බන්ධව සෘජු බැංකු ගෙවීම් ක්‍රමය යටතේ (Online payment) පහසුකම් ලබා ගැනීමට ලංකා හා මහජන බැංකුව සමග සාකච්ඡා කොට අවශ්‍ය කටයුතු සකසමින් පවති.

					(iii). මහපොළ භාරකාර අරමුදල අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ලොතරැයි පැවැත්වීමට හැකියාව ඇති අතර 2013 වර්ශයෙදි ආරම්භ කල ම‍ං ගත ලොතරැයිය (Online Lottery) ආරම්භ කොට කෙටි කාලයක් පවත්වාගෙන ගිය අතර එම ලොතරැයිකරුගේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් හා එකග වූ ගිවිසුම අනුව ක්‍රියා නොකිරීම හේතුවෙන් එම ගිවිසුම අවලංගු කල අතර එම ලොතරැයිකරු විසින් ඒ සම්බන්ධයෙන් නිතිම ය ක්‍රියාමාර්ගයක් ගෙන ඇත. දැනට එය අධිකරණයේ විභාගග වන බැවින් මහපොළ අරමුදල යටතේ ලොතරැයියක් අරම්භ කිරිමට එම නඩු කටයුතු අවසන් වන තෙක් අත්හිටුවා ඇත. කෙසේ වෙතත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය යටතේ මහපොළ නමින් ඉලෙක්ට්‍රොනික ලොතරැයියක් ආරම්භ කිරිමටත් එහි ආදායම සෘජුවම මහපොළ අරමුදලට ලබා ගැනිමට හැකි වන පරිදි අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදි.
(ඇ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම (SLIIT) සමඟ 2005 නොවැම්බර් 14 සහ 2015 මැයි 12 දින එළඹී ගිවිසුම් සහ 2017 අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කල අමාත්‍ය	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය.	SLIIT ආයතනය සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ගවලට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කොට ඇත.	අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	විගණන විමසුමේ කරුණු සමග එකග වන අතර මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග වලට අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කොට ඇති අතර 2015 SLIIT ආයතනය සමග එළඹී ගිවිසුම නිත්‍යානුකූල තත්වය සම්බන්ධයෙන් සිදු කල ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වර්තාව අමාත්‍ය මණ්ඩලයට හෝ මහපොළ අරමුදලට ලබා දි නොමැත.

මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය අනුව භාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය අහිමි කර තිබුණි. තව ද 2015 එළඹී ගිවිසුම නීතියානුකූල නොවන බවට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිසම යටතේ විමර්ශන 2 ක් විභාග වෙමින් පැවැති අතර 2019 ජූලී 12 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම්කාරක සභා රැස්වීමේ දී SLIIT ආයතනය සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ භාර අරමුදලේ සභාපති වෙත දන්වා තිබූ අතර 2019 අගොස්තු 02 දින එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ					SLIIT ආයතනය විසින් මහපොළ අරමුදලට අයත් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් රු. මිලියන 20ක් වාර්ෂිකව බදු කුළියක් මහපොළ අරමුදල වෙත ලබා දෙන අතර එයට සම්බන්ධිත වත්කමක් මහපොළ අරමුදලේ ගිණුම් වල ගිණුම් ගත කල යුතුව තිබූ බැවින් හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ සියලුම වත්කම් මහපොළ අරමුදලට අයිති බැවින් 2015 වර්ශයේ SLIIT ආයතනයේ විගණනය කරන ලද ගිණුම් වලට අනුව වත්කම් වල ශේෂය මහපොළ අරමුදලේ ගිණුම් වලට ගෙන ඇත. කෙසේ වෙතත් රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වර්තාව ලැබුණු පසු ගොඩනැගිලි වටිනාකම වර්තමාන ගිණුම් වලට ගැලයීම සිදුකරනු ලැබේ.

නමුත් එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.					
(ඇ) 2018 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/18/1873/824/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව භාර අරමුදල නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ එළඹී ආයෝජන කළමනාකරණ ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව 2019 පෙබරවාරි 28 දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් විසින් කළමනාකරණය කරන ලද ආයෝජන කළඹ ලංකා බැංකු ආයතනික ශාඛාවේ මහපොළ භාර අරමුදල සතු ප්‍රධාන ගිණුම වෙත මාරු කර තිබුණි. තවද එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඇවර කිරීම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම විකිණීම සිදුකල යුතු වුවත්	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කල යුතුය.	මේ සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් 2019.12.31 වන දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ලැබෙන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ගරු නිතිපතිතුමාගෙන් NWSL ආයතනයේ පැවති නඩු සම්බන්ධයෙන් මතයක් ලබා ගත යුතුව තිබු බැවින් හා සමාගම් 02 වත්කම් වල ශුද්ධ වටිනාකම සම්බන්ධයෙන් විගණන වාර්තාවක් ලබා ගත යුතුව තිබුණි. එම සියලු කටයුතු ආරම්භ කොට තිබු අතර මහ බැංකුව විසින් පනවන ලද යම් යම් රෙගුලාසි වලට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් NWSL සාමාගමේ වෙළඳ බලපත්‍රය මහා බැංකුව විසින් තාවකාලිකව අත්හිටුවන ලදි. එසේම NWSL අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් වීම මත සමාගම ඇවර කිරීමේ අවසන් තීරණය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත් මහපොළ අරමුදල විසින් මෙම සමාගම් වල කොටස් විකිණීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කොට තිබු අතර එම කටයුතු ද ඉහත කරුණු මත දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නොහැකි විය. තවද 2019 පත් වූ නව රජයේ ප්‍රතිපත්ති අනුව රජයේ හෝ රජයට සම්බන්ධ ව්‍යාපාර විකිණීම හෝ ඇවර කිරීම සිදු නොකිරීම යන ප්‍රතිපත්ති මත උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් භාරකාර මණ්ඩලයට ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුව මෙම ව්‍යාපාර 02 මහපොළ අරමුදල යටතේ තවදුරටත් පවත්වාගෙන යැමට තීරණය කරන

මෙතෙක් එය සිදුකර නොතිබුණි.					ලදි. ඒ අනුව විෂය භාර අමාත්‍යවරයා විසින් 2019.12.31 වන දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර එය සඳහා ලැබෙන අමාත්‍ය මණ්ඩල තිරණය අනුව ඉදිරි කටයුතු තිරණය කරනු ලැබේ.

3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින්ම ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කළ යුතු අතර එහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් භාර අරමුදල විසින් ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	2020 සිට ඉදිරි වර්ෂ 3 ක් සඳහා මහපොළ අරමුදලේ ප්‍රසම්පාදන කටයුතුවලට අදාලව සැලැස්මක් සකස් කරමින් ඉදිරිපත් කර ඇත.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මහපොල ශිෂ්‍යත්ව භාර අරමුදලේ ප්‍රසම්පාදන කටයුතු සලකා බැලීමේදී එදිනෙදා කටයුතු සඳහා අවශය ලිපි දුවය හා අනෙකුත් මිලදි ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු හැරෙන්නට ඉතා විශාල ප්‍රසම්පාදන කටයුතු සිදු නොවන අතර. මෙහෙයුම් කටයුතු වලට අදාල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් සැලැස්මක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය අනුම සිදු කිරීමට කටයුතු යොදා ඇත.

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත ර්යමණ්ඩලය 31 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 13 ක් වූයෙන් තනතුරු 18 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක්ද ද්විතීය මට්ටමේ තනතුරු 06 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක්ද පුරප්පාඩුව පැවතිණි. එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාකර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	ඉදිරියේදී නව බඳවා ගැනීම් සඳහා කටයුතු කරනු ලැබේ.	ආයතනයේ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.	මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සේවකයින් බඳවාගැනීම භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ සිදුකල අතර, 6/2016 වක්‍ර ලේඛය අනුව නියමිත බඳවාගැනීම් පටිපාටියන් අනුමතකොට අවශය තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කොට ගෙන අදාල බඳවා ගැනීම් සිදු කල යුතු බැවින් එම තනතුරු අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. එම අනුමැතිය ලද වහාම අවශ්‍ය බඳවාගැනීම් සිදුකරනු ලැබේ.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
2014 - 2017 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් ඉන් පසු කාල පරිච්ඡේද සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ඉදිරියේදී ඒ පිළිබඳ කටයුතු කිරීමට අදහස් කෙරේ.	ඉලක්ක ප්‍රමාණාත්මකව හා මූල්‍යමය වශයෙන් දක්වා සැලසුම් පිළියෙළ කළ යුතුය.	2020/25 සංයුක්ත සැලැස්ම සකස් කර ඇත.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
2003 ජුනි 02 දිනැති පී‍ඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 අනුව සංයුක්ත සැලැස්ම පදනම් කර ගත් ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ඉදිරි වර්ෂ සඳහා සකස් කරනු ලැබේ.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුයි.	2020 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට ක්‍රියාත්මක කොට ඇත.

4.3 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අරමුදලේ ගනුදෙනු හා ක්‍රියාකාරීත්වය පිළිබඳ රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ද විගණනයක් සිදු කර නොතිබුණි.	පවත්නා	පද්ධතිය හඳුන්වා දිය යුතුය	ඉදිරියේදී අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකයෙන් විගණනය කළ යුතුය.	මහපොළ අරමුදලේ අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර විගණකවරයෙකු හා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට මහපොළ අරමුදලේ අනුමැතිය ලැබී ඇති අතර එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමරතිය සඳහා ඉදිරිපත් කොට ඇත. එය ලැබුණු වහාම අදාල බඳවා ගැනීම් සිදු කරනු ඇත. 2020 අවසන් වන විට එම බඳවාගැනීම අවසන් කොට අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීමට හැකිවනු ඇත.

4.4 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් සඳහා රජයේ විගණක කැඳවා නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	ඉදිරි රැස්වීම්වල දී ඒ සම්බන්ධව කටයුතු කරනු ලැබේ.	විගණන හා කළමනාකාර කමිටු රැස්වීම්වල නිරීක්ෂකයෙකු ලෙස රජයේ විගණක කැඳවිය යුතුය.	මහපොළ අරමුදලේ විගණන හා කළමනාකරණ කමිටුව රැස්වීම සඳහා ඉදිරියේ දී නිරීක්ෂකයෙකු ලෙස රජයේ විගණකවරයා කැඳවීමට නියමිතය.

4.5 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය
2003 ජුනි 02 දිනැති පී්ඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 අනුව වාර්ෂික අයවැය පිළියෙල කල වුවත්	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	ඉදිරි වර්ෂය සඳහා පිළියෙල කර ඇත.	සෑම වර්ෂයන් සඳහා වාර්ෂික අයවැය පිළියෙල කළ යුතුය.	මහපොළ අරමුදල සඳහා 2018, 2019 වර්ෂවලට අදාලව අයවැය පිළියෙළ කොට මහපොළ භාරකාර මණ්ඩලය විසින් ඒවා සම්මත කොට ඇත. එම සම්මත කරන ලද අයවැය අනුව ඉදිරි වර්ෂයේ වියදම් සිදුකොට ඇති අතර,මෙම සියලුම අනුමත අයවැය විගණනය සඳහා ඉදිරිපත් කොට ඇත.

කේ.කේ.වී ධර්මසිරි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට